වාර්ෂික වාර්තාව
ஆண்ட றிக்கை
ANNUAL REPORT 2022



පොල්, කිතුල් හා තල් වගා ප්‍රවර්ධනය හා ආශ්‍රිත කාර්මික කර්මාන්ත නිෂ්පාදන හා අපනයන විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍යාංශය

தென்னை, கித்துல் மற்றும் பனைச் செய்கை மேம்பாடு மற்றும் அவை சார்ந்த பண்டங்கள் உற்பத்தி மற்றும் ஏற்றுமதி பல்வகைப்படுத்தல் அமைச்சு

STATE MINISTRY OF COCONUT, KITHUL AND PALMYRAH CULTIVATION AND RELATED INDUSTRIAL PRODUCT MANUFACTURING & EXPORT DIVERSIFICATION

පොල් පර්යේෂණ ආයතනය
தென்னை ஆராய்ச்சி நிறுவகம்
Coconut Research Institute

වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
பெருந்தோட்டக் கைத்தொழில் அமைச்சு
Ministry of Plantation Industries


COCONUT RESEARCH INSTITUTE
FOUNDED 1928

පටුන

- අපගේ දැක්ම, මෙහෙවර, කාර්යභාරය 5
- ආයතනික ව්‍යුහය 6
- පොල් පර්යේෂණ ආයතනය 7
- සභාපතිතුමාගේ පණිවිඩය 9
- අධ්‍යක්ෂකතුමියගේ පණිවිඩය 11
- පර්යේෂණ නිර්දේශ 13
- ප්‍රතිපත්ති යෝජනා 19
- පර්යේෂණ හා සංවර්ධන ජයග්‍රහණ 25
    - පොල් ප්‍රභේද වැඩි දියුණු කිරීම 27
    - පොල් නිෂ්පාදන තාක්ෂණය 34
    - පොල් නිෂ්පාදනය කෙරෙහි දේශගුණික විපර්යාස වල බලපෑම 54
    - වගා සංරක්ෂණය 57
    - පොල් සැකසුම් හා පොල් ආශ්‍රිත නිෂ්පාදන වැඩිදියුණු කිරීම 62
    - සමාජ ආර්ථික පර්යේෂණ 71
- පර්යේෂණ සංවර්ධනයන් 77
- තාක්ෂණ හුවමාරු කටයුතු 87
- පාර්ශවකරුවන්ට ලබාදෙන සේවා තුළින් ජාතික සංවර්ධනයට ලබාදෙන දායකත්වය 97
- ජාතික සහයෝගිතා වැඩසටහන 109
- විතු කළමනාකරණ කටයුතු 113
- කාර්ය මණ්ඩලය 145
    - පොල් පර්යේෂණ ආයතනයේ කාර්යය මණ්ඩලය 147
    - බඳවාගැනීම්, විශ්‍රාම ගැනීම්, ඉල්ලා අස්වීම්, උසස්වීම් සහ ස්ථාන මාරු 167
    - කාර්ය මණ්ඩල ජයග්‍රහණ 178
    - අධ්‍යයන සහ වෘත්තීමය ක්‍රියාකාරකම් 180
    - දේශීය සහ ජාත්‍යන්තර ප්‍රකාශන 196
- විගණන වාර්තාව 202
- ගිණුම් අංශයේ වාර්තාව 214



අපගේ දැක්ම

පොල් සංවර්ධනය සඳහා අවශ්‍ය පර්යේෂණ, තාක්ෂණ ජනනය කිරීම සහ තාක්ෂණ ප්‍රවර්ධනය කිරීමෙහිලා කලාපයේ ප්‍රමුඛයා බවට පත්වීම.

අපගේ මෙහෙවර

පොල් කර්මාන්තයේ තිරසාර දියුණුව සඳහා අවශ්‍ය වන තාක්ෂණ දැනුම පර්යේෂණ කටයුතු මගින් බිහිකිරීම

අපගේ කාර්යභාරය

පොල් ගසේ වැඩීම, පොල් වගාවල අනෙකුත් භෝග වගාවන් සහ සත්ත්ව පාලන කටයුතු, පළිබෝධ සහ රෝග පාලනය කිරීම පිළිබඳ විද්‍යාත්මක පර්යේෂණයන්හි නිරතවීම.


පොල් සැකසීම, පොල් ආශ්‍රිත නිෂ්පාදන සහ අගය එක්කළ පොල් නිෂ්පාදන පිළිබඳව තවදුරටත් විද්‍යාත්මක පර්යේෂණයන්හි නිරතවීම.

ආයතනයේ බීජ පොල් උයන් සහ පර්යේෂණ මධ්‍යස්ථාන අලුතින් ඇති කිරීම සහ පවත්වා ගෙන යාම.

පොල් කර්මාන්තයේ උන්නතිය උදෙසා උපදේශක සහ ව්‍යාප්ති නිලධාරීන් පුහුණු කිරීම.

පොල් කර්මාන්තය තුළ ඇති සියලුම තාක්ෂණ කාර්යාවලීන් සඳහා තාක්ෂණික අංශ වලින් ලබාදිය යුතු මගපෙන්වීම සහ උපදේශකත්වය ලබාදීම.

ආයතනික ව්‍යුහය


සභාපති
පොල් පර්යේෂණ මණ්ඩලය
අධ්‍යක්ෂ
පොල් පර්යේෂණ ආයතනය
අතිරේක අධ්‍යක්ෂ
පොල් පර්යේෂණ ආයතනය
අභ්‍යන්තර විගණක
අභ්‍යන්තර විගණක ඒකකය
ජ්‍යෙෂ්ඨ කළමනාකරු (වැඩ)
වැඩ කළමනාකරණ අංශය
කළමනාකරු (බීජ උයන්)
බීජ උයන් (ජාන සම්පත් මධ්‍යස්ථානය)
කළමනාකරු (වැඩ)
පර්යේෂණ මධ්‍යස්ථාන
ජ්‍යෙෂ්ඨ ශාස්ත්‍රවේදී
ඖෂධ ඒකකය
විශයෝදය අධ්‍යක්ෂ (පාලන)
සංවර්ධන ඒකකය
ඉංජිනේරු ඒකකය
විශයෝදය අධ්‍යක්ෂ (පර්යේෂණ - II)
පොල් සැකසුම් අංශය
කෘෂි ආර්ථික විද්‍යා හා කෘෂි විස්තර කළමනාකරණ අංශය
තාක්ෂණ සුවිචාරී අංශය
යාන්ත්‍රික පර්යේෂණ අංශය
මධ්‍යම විශ්ලේෂණ රසායනාගාරය
පුස්තකාලය
විශයෝදය අධ්‍යක්ෂ (පර්යේෂණ - I)
ප්‍රභේදීකරණ හා ජාන අභිජනන අංශය
ශාක විද්‍යා අංශය
ශාක කායික විද්‍යා අංශය
පාංශු හා ශාක පෝෂණ අංශය
වගා සංරක්ෂණ අංශය
පළිබෝධ අංශය

පොල්, කිතුල් හා තල් වගා ප්‍රවර්ධනය හා ආශ්‍රිත කාර්මික භාණ්ඩ නිෂ්පාදන හා අපනයන විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍යාංශය

1928 අංක 24 දරණ පොල් පර්යේෂණ ව්‍යවස්ථාවට අනුව 1929 දී පොල් පර්යේෂණ ආයතනය ආරම්භ කර ඇත්තේ පොල් පර්යේෂණ යෝජනා ක්‍රමය ලෙසය. මෙම යෝජනා ක්‍රමයේ ප්‍රධාන මධ්‍යස්ථානය ලුණුවිල බණ්ඩිරිප්පුව වත්තේ පිහිටවනු ලැබූ අතර, එය ප්‍රවේණි, රසායන විද්‍යා හා පාංශු රසායන විද්‍යා නම්වූ තාක්ෂණ අංශ තුනකින් සමන්විත විය. 1950 දී නීතිගත කරනු ලැබූ අංක 37 දරණ පොල් පර්යේෂණ පනතින් පසු මෙය ලංකා පොල් පර්යේෂණ ආයතනය ලෙස යලි නම් කරනු ලැබිණි. 1971 අංක 46 දරණ පොල් සංවර්ධන පනත පැනවීමත් සමග 1972 දී පොල් පර්යේෂණ මණ්ඩලය පිහිටවනු ලදී. මෙහි කාර්ය භාරය වනුයේ පොල් පර්යේෂණ ආයතනයේ පාලන මණ්ඩලය ලෙස කටයුතු පවත්වාගෙන යාමයි.

පොල් පර්යේෂණ මණ්ඩලය (පො.ප.ම)

පොල් පර්යේෂණ මණ්ඩලය එහි පාලන මණ්ඩලය වන අතර ආයතනයේ පාලන කටයුතු හා ප්‍රතිපත්තිමය තීරණ ගනු ලබන්නේ එම මණ්ඩලය මගිනි. පොල් සංවර්ධන පනතේ කොන්දේසි වලට අනුකූලව පොල් පර්යේෂණ මණ්ඩලය, අමාත්‍යතුමා විසින් පත් කරනු ලබන සාමාජිකයින් 11 දෙනෙකුගෙන් සමන්විත වේ.මින් එක් සාමාජිකයෙක් ආයතනයේ සභාපති ලෙස පත් කරනු ලැබේ. ආයතනය පාලනය කරනු ලබන්නේ පොල් පර්යේෂණ මණ්ඩලය මගිනි. සාමාජිකයින් වසර 03ක් සඳහා පත් කරනු ලබන අතර, ඔවුහු නැවත වරක් පත්කිරීම සඳහා ද සුදුසුකම් ලබති. පසුගිය වසර සඳහා රැස්වීම් 12 ක් පවත්වන ලදී.

මණ්ඩල සාමාජිකයන්	පැමිණීමේ වාර්තාව
වෛද්‍ය සාරංග අලහප්පෙරුම මහතා, සභාපති, පො/ප/ම	10/10
ටී. එම්. ටී. මල්රාජ් පීරිස් මහතා, සභාපති, පො/ප/ම	02/02
කේ. එම්. බී. ටී කරුණාසේන මිය / අමාත්‍යාංශ නියෝජිතවරිය	07/09
එස්. එන්. අත්තනායක මිය / අමාත්‍යාංශ නියෝජිත	03/03
ආචාර්ය එස්.එච්.එස්.ඒ. ද සිල්වා, අධ්‍යක්ෂ ජනරාල් /කෘ.දෙ	08/09
ආචාර්ය එස්.එෆ්.එන්.සිල්වා, පො.ව.ස	03/03
ලයනල් ෆොන්සේකා මහතා , පො.ව.ස	03/04
ආර්.ඒ.එල්.උදය කුමාර මහතා / භාණ්ඩාගාර නියෝජිත	03/03
පේ. එම්. එස්. එන්. ජයසිංහ මහතා / භාණ්ඩාගාර නියෝජිත	08/09
බන්ධුල එගොඩගේ මහතා	11/12
ආචාර්ය සනාතනී රණසිංහ මිය, අධ්‍යක්ෂ /පො. ප. ආ	07/07
ප්‍රභාත් විමල් කුමාර මහතා / අධ්‍යක්ෂක ලේකම් /කෘ.ප.ප්‍ර.ස	10/12
චිත්‍රාල් ජයවර්ණ මහතා	12/12
ඒ.වී.කේ.එම්. හේරත් මිය, සභාපති/ පො/ව/ම	06/12
කීර්ති ශ්‍රී වීරසිංහ මයා, සභාපති/පො.ස.අ	04/12

ආචාර්ය ලලිත් පෙරේරා (අතිරේක අධ්‍යක්ෂ) 2022 ජුනි - ඔක්තෝබර් කාලය තුළ අධ්‍යක්ෂ (ආවරණ) ලෙස මණ්ඩලයේ සේවය කරන ලදී.

පො.ප.ම	ඃ පොල් පර්යේෂණ මණ්ඩලය
පො.ප.ආ	ඃ පොල් පර්යේෂණ ආයතනය
කෘ.දෙ	ඃ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
පො.ව.ස	ඃ පොල් වගාකරුවන්ගේ සංගමය
කෘ.ප.ප්‍ර.ස	ඃ කෘෂිකර්ම පර්යේෂණ ප්‍රතිපත්ති සභාව
පො.ස.අ	ඃ පොල් සංවර්ධන අධිකාරිය
පො.ව.ම	ඃ පොල් වගාකිරීමේ මණ්ඩලය

විගණන හා කළමනාකරණ කමිටුව

ආයතනයේ විගණන හා කළමනාකරණ කටයුතු පිළිබඳ සාකච්ඡා කර ගැනීම සඳහා වසර තුළ රැස්වීම් වාර 03ක් පවත්වන ලදී.

විගණන කමිටුවේ සාමාජිකයින්

	නම	පැමිණීමේ වාර්තාව
කමිටු සභාපති හා භාණ්ඩාගාර නියෝජිත	ජේ. එම්. එස්. එන්. ජයසිංහ මහතා	3/3
අමාත්‍යාංශ නියෝජිත	සුරේකා එන්. අත්තනායක මිය	1/3
	බුද්ධි ටී. කරුණාසේන මිය	2/3
මණ්ඩල සාමාජික	බන්ධුල එගොඩගේ මහතා	1/3
	ලයනල් ෆොන්සේකා මහතා	1/3
නිරීක්ෂක වි.දෙ	ආර්.එම්.එම්.එස්. පෙරේරා මිය	2/3
	ඒ. පොඩිරාලහාමි මහතා	1/3
	කේ. ඒ. සී. ශාමන්ත	2/3
	වී. ඩී. සීතා මිය	1/3
අධ්‍යක්ෂ/පො.ප.ආ	ආචාර්ය සනාතනී රණසිංහ මිය	2/3
අභ්‍යන්තර විගණක	පී. ඩබ්. ඒ. ප්‍රනාන්දු මහතා	3/3
කැඳවුම්කරු , වි.ක.ක / පො.ප.ආ අතිරේක අධ්‍යක්ෂ / පො.ප.ආ	ආචාර්ය ලලිත් පෙරේරා	3/3

වි.දෙ : විගණකාධිපති දෙපාර්තමේන්තුව



සභාපතිතුමාගේ පණිවිඩය

කර්මාන්තයක් මනාව පවත්වා ගෙන යාමට නම් එම කර්මාන්තයේ ස්ථාවරභාවය හා ඉහළ කාර්ය සාධනයක් පවත්වාගෙන යාම යන කාරණය පිළිබඳව අවධානය යොමු කළ යුතුය. පොල් භෝග යක් ලෙස ජාතික ආර්ථිකයට ඉහළ දායකත්වයක් ලබා දී තිබෙන අතර මෙම භෝගය ආහාරමය සංඝටකයක් ලෙස, ජනතාවට රුකියා අවස්ථාවන් ලබාදෙන මාර්ගයක් ලෙස සහ ආර්ථිකයට විදේශ විනිමය උපයා දීමේ හැකියාවක් පවතින කර්මාන්තයක් බව පෙන්නුම් කර ඇත. රටේ ආර්ථික අවපාතයක් පවතින අවස්ථාවක එමෙන්ම කොරෝනා රෝගී තත්ත්වයක් පවතින විටදී පවා වැවිලි අමාත්‍යාංශය, පොල් පර්යේෂණ ආයතනය, පොල් සංවර්ධන අධිකාරිය හා පොල් වගා කිරීමේ මණ්ඩලය එක්ව සිදු කළ මෙහෙයවීම් නිසා පොල් කර්මාන්තය මනාව ක්‍රියාත්මක විය. මෙම වසරේ, වාර්ෂික ජාතික පොල් නිෂ්පාදනය වාර්තාගත ඉහළම නිෂ්පාදනය වන ගෙඩි මිලියන 3,353 දක්වා ළඟාවූ අතර, අපනයන ආදායම රුපියල් බිලියන 262 (ඩොලර් මිලියන 817) හා දේශීය දළ ජාතික නිෂ්පාදනයට 0.7% ක දායකත්වය ලබාදුනි.

2022 වසරේ තෙල් අර්බුදය නිසා දැඩි අවපාතයකට ලක්ව විදේශ විනිමය හා යෙදවුම්වල හිඟ යක් පැවති කර්මාන්ත වලට ඉතා ඉහළ අපනයන ආදායමක් ලබා ගැනීමට පොල් පර්යේෂණ ආයතනයේ ක්‍රියාකාරකම් මහත් පිටුවහලක් වූ බව මම ඉතා ආඩම්බරයෙන් සඳහන් කරමි.

පොල් පර්යේෂණ ආයතනය පොල් සැකසුම් කර්මාන්තයට තෙල් සංස්ථාව හරහා සෘජුවම ඉන්ධන නිකුත් කිරීමේ යාන්ත්‍රණය සහ මධ්‍යම ගමනාගමන මණ්ඩලය හරහා හා ඩොලර් ගෙවීමෙන් තෙල් ලබා දීමට අවශ්‍ය ක්‍රියාදාමය හඳුන්වාදීමේ පුරෝගාමියා විය. මෙම වැඩ පිළිවෙල ඉතා සාර්ථක වූ අතර අනෙකුත් ආයතනද මෙම ක්‍රියාදාමය ආදර්ශයට ගෙන ක්‍රියා කළේය.

පොල් පර්යේෂණ ආයතනය 2022 වසරේ ඉතා ඉහළ යෙදවුම් හිඟයකට පාත්‍රව තිබියදී පවා එහි පර්යේෂණ වැඩ පිළිවෙල ක්‍රියාත්මක කරන ලදී. මෙම පර්යේෂණ ක්‍රියාදාමයේ අරමුණ වන්නේ පොල් නිෂ්පාදනය වැඩි කිරීම, පොල් ගස්වලට සිදුවන හානි අවම කිරීම, අගය එකතු කළ පොල් නිෂ්පාදන දියුණු කිරීම හා නිසි ප්‍රතිපත්ති යෝජනා ක්‍රියාත්මක කිරීම තුළින් පොල් කර්මාන්තය මනාව පවත්වාගෙන යාම වේ. මෙම වසර තුළදී පොල් පර්යේෂණ ආයතනයේ පර්යේෂණ පදනම් කරගෙන සුදු මැස්සන් පාලනය කිරීම සඳහා කොහොඹ තෙල් සබන් මිශ්‍රණය යොදා ගැනීම, පණුවන් යොදා පිළියෙල කරන කොම්පෝස්ට් සඳහා ගිණිතෘණ යොදා ගැනීම, සත්ත්ව පාලනයේදී ආහාරයක් ලෙස ගවයින් සඳහා පෝෂකයක් ලෙස ගිණි තෘණ ලබා දීම යන නව නිර්දේශ තුනක් ලබාදුනි. මෙයට අමතරව රටේ පැවති ආර්ථික අර්බුදය අවස්ථාවේදී පොල් කර්මාන්තයේ පැවති ගැටළු නිරාකරණය සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති යෝජනා ලබා දීමද සිදු විය. මම ඉතා ආඩම්බරයෙන් සටහන් කළයුතු කාරණයක් වන්නේ, මෙසේ ලබා දුන් ප්‍රතිපත්ති යෝජනා ක්‍රියාත්මක කිරීම තුළින් කර්මාන්තය ස්ථායීව පවත්වාගෙන යාමට රුකුලක් සිදු වූ බවයි.

පොල් පර්යේෂණ ආයතනයේ ජාන සම්පත් මධ්‍යස්ථාන වලට අත් පරාගනය මඟින් දෙමුහුම් බීජ නිෂ්පාදනය සඳහා අමතරව මව් ගස් 6133 ක් එක් කිරීමට හැකි වූ බව මම තවදුරටත් සතුටින් සඳහන් කරමි.

මෙය දෙමුහුම් පොල් නිෂ්පාදන ඉතිහාසයේ ඉතා විශේෂ තත්ත්වයක් බවට සඳහන් කරමි. පොල් පර්යේෂණ ආයතනය විසින් සොයාගත් නව දැනුම් සම්ප්‍රේෂණයද මෙම වසරේ සිදු විය.

මෙයට අමතරව පොල් පර්යේෂණ ආයතනය නව තාක්ෂණය සම්ප්‍රේෂණය සඳහා විවිධ උපක්‍රම යොදාගන්නා ලදී. මෙම අරමුණ ඇතිව පොල් පර්යේෂණ ආයතනයට අදාළ නිල වෙබ් අඩවිය නව විශේෂිත දුරකථන අංකයක් හඳුන්වා දීම, වට්ස් ඇප් අංකයක් හඳුන්වා දීම හා මුහුණු පොතේ හා විද්‍යුත් මාධ්‍ය හඳුන්වා දීම යන කටයුතු සිදු කරන ලදී. මෙම සියලුම කටයුතු වලින් ඉහළ ප්‍රතිඵල අත්වූ අතර බෙස්ට් වෙබ් ලංකා ආයතනය විසින් සංවිධානය කරනු ලැබූ තරඟාවලියේදී පොල් පර්යේෂණ ආයතනයේ වෙබ් අඩවිය සඳහා රාජ්‍ය අංශය සඳහා පිරිනමන රන් සම්මානය , පුරවැසියන් සඳහා සේවාවන් සපයන වෙබ් අඩවිය වෙනුවෙන් පිරිනමන සම්මානයේ රිදී සම්මානය හා සියලුම අංශ සඳහා පිරිනමන තෘතීය සම්මානය ලෝකඩ පදක්කමක් හිමිකර ගැනීමට සමත්වූ බව මම ඉතාම සතුටින් සඳහන් කරමි. මෙයට අමතරව පර්යේෂණ ග්‍රන්ථ සඳහා සම්මාන 11 ක් හා පොල් පර්යේෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව සඳහා රාජ්‍ය මුල්‍ය හා ගිණුම්කරන සංගමය මඟින් පිරිනමන සම්මාන උළෙලේදී හොඳම වාර්ෂික වාර්තාවට හිමි තෘතීය ලබා ගැනීමට සමත් විය.

මෙම වසරේ තවදුරටත් පොල් වගා කිරීමේ මණ්ඩලය වෙත තාක්ෂණය සම්ප්‍රේෂණය සිදු කළ අතර මෙය විශේෂයෙන් පර්යේෂණ ව්‍යාප්ති සංවාදය හරහා සිදුවිය. පොල් පර්යේෂණ ආයතනය තවදුරටත් දේශීය හා විදේශීය ආයතන වන විශ්ව විද්‍යාල, ජාතික ඉංජිනේරු ආයතනය සහ විදේශ ආයතනවල පර්යේෂණ වැඩසටහන් ඵලදායීව සිදු කරගෙන යනු ලබයි. පොල් පර්යේෂණ ආයතනයේ විද්‍යාඥයින් රටේ සම්පත් දායකයින් ලෙස විවිධ වැඩසටහන්, දේශීය හා විදේශීය සම්මන්ත්‍රණ, වැඩමුළු හා ප්‍රතිපත්ති සකස් කිරීමේ ක්‍රියාවලියට දායක වේ. වගාකරුවන්ට සහ පොල් කර්මාන්තයට අවශ්‍ය දැනුම වැඩි දියුණු කිරීම සඳහා පොල් පර්යේෂණ ආයතනය නිවැරදි මාර්ගයේ ක්‍රියාකරමින් සිටින බව මෙහිදී සඳහන් කිරීමට කැමත්තෙමි.

ආයතනයේ අරමුණු සාර්ථකව ඉටු කර ගැනීම සඳහා සියලුම කාර්යය මණ්ඩලය මෙන්ම, වතු කාර්යය මණ්ඩලයෙන් ලබාදුන් සහයෝගය වෙනුවෙන් ඔවුන් සියලුදෙනාටම ස්තුතිය පුද කිරීමට මෙය අවස්ථාවක් කර ගනිමි. එමෙන්ම ගරු ඇමතිවරුන් හා අමාත්‍යාංශයේ සියලු නිලධාරීන් විසින් ලබාදුන් උපකාර, සහයෝගය, මගපෙන්වීම අගය කරමි.

පොල් පර්යේෂණ ආයතනයේ ඉදිරි කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි.

මල්රාජ් පීරිස්

සභාපති

පොල් පර්යේෂණ මණ්ඩලය



අධ්‍යක්ෂකතුමියගේ පණිවිඩය

පර්යේෂණ ඇසුරින් නිර්දේශයන් නිකුත් කිරීම, සංවර්ධන ක්‍රියාකාරකම් සිදු කිරීම හා සේවාවන් සැපයීම තුළින් පොල් පර්යේෂණ ආයතනය, පොල් කර්මාන්තය සඳහා අඛණ්ඩව සිය සේවය ලබාදෙන ලදී. මෙම වසර පොල් ක්ෂේත්‍රයේ සාර්ථක වසරක් වූයේ, ජාතික පොල් නිෂ්පාදනය ගෙඩි මිලියන 3,353 වෙමින්, අඛණ්ඩව දෙවන වරටත් ගෙඩි බිලියන 3.3 කඩඉම ඉක්මවූ වසරක් වීමයි. අගය එක් කළ පොල් නිෂ්පාදන අපනයනය තුළින් විදේශ විනිමය ඇමරිකානු ඩොලර් මිලියන 817 ක් උත්පාදනය කිරීමට පොල් කර්මාන්තය සමත් විය. කෙසේ වුවද, මෙම වසර පොල් ක්ෂේත්‍රයේ ඉතාමත්ම අභියෝගාත්මක වසරක් වූයේ පොල් ත්‍රිකෝණය ඇතුළුව බොහෝ දිස්ත්‍රික්ක වල පොල් වගාවන්හි හා තැඹිලි වගාවන්හි ඉතා තදබල ලෙස සුදු මැසි හානිය වාර්තා වීම නිසාය.

සුදු මැසි හානිය පාලනය සඳහා, කොහොඹ තෙල්, සබන් කුඩු හා ජලය අඩංගු ස්වාභාවික කෘමිනාශකයක් නිර්දේශ කරන ලද අතර, පෙව පළිබෝධ මර්දනකාරකයන්ද හඳුනා ගන්නා ලදී. පොල් බටර්, යොදය ඉවත් කළ කිරි වලින් සාදන ඇතුරුම් කේජු (Spread Cheese) පොල් ප්‍රෝටීන නිස්සාරක මඟින් හා ජීවසෙලියුලෝස් මඟින් පෙව හායන ඇසුරුම් නිපදවීම (Bio degradable packaging) හා පොල් පිටි වලින් ග්ලයිසීමික් අගය අඩු පාන් නිපදවීම සඳහා අවශ්‍ය තාක්ෂණය බිහි කරන ලදී. ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන ආයතනය (NERD), පොල් සංවර්ධන අධිකාරිය (CDA) හා අපනයන සංවර්ධන මණ්ඩලය (EDB) යන ආයතන හා ඒකාබද්ධව මූලික කොහුබත් වියලුම් යන්ත්‍රයක් සැකසීමත්, ශ්‍රී ලංකා බ්‍රිස්ටල් කෙඳි නිස්සාරක යන්ත්‍රය නිපදවීමත් අවසන් කරන ලදී. උපස්තර කර්මාන්තය හා නිෂ්පාදන සඳහා පරීක්ෂා කිරීම් සිදු කොට සහතික ලබා දීම අරඹන ලදී.

පොල් වතු වල ආක්‍රමණශීලී, ගැටළුකාරී වල් පැළෑටියක් වන පැනිකම් මැක්සිමම්, කෝම්පෝස්ට් නිෂ්පාදනයේ හා පණු පොහොර නිෂ්පාදනයේ අමුද්‍රව්‍යයක් ලෙසත්, සත්ත්ව පාලනයේදී "ගෝචර" වර්ගයේ සත්ත්ව ආහාරයක් ලෙසත් නිර්දේශ කරන ලදී. දැඩි උෂ්ණත්වයට හා නියං ආතතියට, වැලිගම පොල් කොළ මැලවීමේ රෝගයට හා ඇසේරියා පොල් මයිටාවාට ඔරොත්තු දෙන පොල් වගා දර්ශ තේරීම හා නිපදවීම සිදු කිරීම, පටක රෝපණ තාක්ෂණය වැඩි දියුණු කිරීම, තැඹිලි ලෙලි වලින් ලබා ගන්නා පෙව අඟුරු පොටෑසියම් මූලාශ්‍රයක් ලෙස හා පාංශු නිවැරදි කාරකයක් ලෙස නිර්දේශ කිරීම, පොටෑසියම් පෝෂකයෙන් පරිපෝෂිත පොහොර කැටයක් නිර්මාණය කිරීම, පොල් වගාවන් සඳහා නාගරික ඝන අපද්‍රව්‍ය භාවිතය, නව වසුන් ද්‍රව්‍ය හඳුනා ගැනීම, අගය එක් කළ පොල් නිෂ්පාදන සඳහා තාක්ෂණය වැඩි දියුණු කිරීම හා ගොඩ නැගීම සිදු කිරීම, පොල් කොහු කර්මාන්තය සඳහා යන්ත්‍ර නිපදවීම හා වැඩි දියුණු කිරීම සාර්ථක ලෙස අඛණ්ඩව සිදු කරන ලදී.

පොල් ආශ්‍රිත නිෂ්පාදන හා ආදේශක ආනයනය කිරීම හා අපනයනය කිරීම ආශ්‍රිත ප්‍රතිපත්ති නිර්දේශ කිරීම, පොල් තෙල් හා පාම් තෙල් වැනි පාරිභෝගික ද්‍රව්‍යයන්හි බදු වල විශේෂ වෙනස්කම් සිදු කිරීම සඳහා ප්‍රතිපත්ති සම්පාදකයන් වෙත යොමු කිරීමද සිදු කරන ලදී.

සංවර්ධන වැඩ සටහන් ලෙස පොල් පර්යේෂණ ආයතනයට අයත් ජාන සම්පත් මධ්‍යස්ථාන 03 ක් හා හලාවත වැවිලි සමාගමට අයත් කිනියම බීජ පොල් උයන සාර්ථකව පවත්වාගෙන යන ලද අතර ප්‍රවේණිකව උසස් බීජ පොල් ගෙඩි මිලියන 1.5 ක් වසර තුළ නිපදවන ලදී. පොල් පර්යේෂණ ආයතනයේ වතු ආශ්‍රිතව සිදු කෙරෙන අත් පරාගන වැඩ සටහනට නව මව් ගස් 6133 ක් මෙම වසර තුළ එකතු කරන ලදී.

දෙමුහුම් බීජ නිෂ්පාදනය වැඩි කිරීම සඳහා කුරුණෑගල වැවිලි සමාගම, ශ්‍රී ලංකා යුධ හමුදාවට අයත් කන්දකාඩු කෘෂිකර්ම ගොවිපොළ හා සී.අයි.සී කෘෂි ව්‍යාපාරය සමඟ ඒකාබද්ධ වී "සහයෝගිතා ව්‍යාපෘති" (Partnership projects) අරඹන ලදී. ශ්‍රී ලංකා දුඹුරු කුන්දිරා, මලයානු රතු කුන්දිරා, බ්‍රසීලියානු කොළ කුන්දිරා යන දුලබ පොල් වගා දර්ශ ඇසුරින් "ක්ෂේත්‍ර පරාග බැංකු" ස්ථාපනය කිරීම, දකුණු පළාතේ පොල් වැලිගම පොල් කොළ මැලවීමේ රෝගය පාලනය කිරීම, විශේෂයෙන්ම මෙම රෝගය වෙනත් ප්‍රදේශ වලට පැතිරීම වැළැක්වීම සඳහා ආරක්ෂිත කලාපය පවත්වාගෙන යාම අඛණ්ඩව සිදු කරන ලදී.

තාක්ෂණ හුවමාරු කටයුතු ලෙස පොල් පර්යේෂණ ආයතනය තුළ පොල් ආශ්‍රිත ගැටළු පිළිබඳ පුද්ගලයන් දැනුවත් කිරීම මූලික කරගත් මාධ්‍යය ඒකකයක් ස්ථාපිත කරන ලදී. සුදු මැසි ආසාදනය පාලනය සඳහා විශේෂ මාධ්‍යය වැඩසටහන් පවත්වන ලදී. නොමිලේ ලබාදෙන ක්ෂණික ඇමතුම් සේවය වන "1928" ත් අපගේ වට්ස්ඇප් අංකය වන 0704001928 හරහා තාක්ෂණ සහයෝගය ලබා දෙන ලදී. ප්‍රශස්ත ව්‍යාපාර පහසුකම ඔස්සේ අගය එක් කළ පොල් නිෂ්පාදන පිළිබඳ පුහුණු කිරීම් සිදු කරන ලදී. පොල් පර්යේෂණ ආයතනය හා පොල් වගා කිරීමේ මණ්ඩලයේ පොල් සංවර්ධන නිලධාරීන්ගේ සහභාගිත්වයෙන් පර්යේෂණ ව්‍යාප්ති සංවාද පවත්වන ලදී. පොල් වගාව හා අගය එකතු කිරීම පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව පවත්වන ලදී. පොල් වගාව පිළිබඳ ප්‍රායෝගික දැනුම බෙදා හැරීම තාක්ෂණ උද්‍යානයේදී සිදු කරන ලදී.

පොල් පර්යේෂණ ආයතනය විසින් බිහි කළ තැඹිලි කල් තබා ගැනීමේ තාක්ෂණය තැඹිලි අපනයනය කරන නව ව්‍යවසායකයින් අතර පතුරුවා හරින ලද අතර, තැඹිලි ගෙඩි මිලියන 10.87 ක් මෙම වසර තුළ මෙම තාක්ෂණය භාවිතා කරමින් අපනයනය කරන ලදී. සේවාවන් ලෙස, පාර්ශ්වකරුවන් වෙත කාර්යක්ෂම සේවාවක් ලබා දීමේ අරමුණින් මධ්‍යම විශ්ලේෂණ රසායනාගාරයක් (CAL) ස්ථාපනය කරන ලදී. පොල් බීජ සහතික කිරීමේ සේවය අබණ්ඩව ඉදිරියට පවත්වාගෙන යන ලදී. ඇසේරියා මයිටාවාගේ විලෝපික මයිටාවන්ද, පොල් දළඹුවාගේ පරපෝෂිතයන්ද, රතු කුරුමිණියාගේ ආකර්ෂක පෙරමෝනද නිෂ්පාදනය කර වගා කරුවන් වෙත සපයන ලදී. ජාතික පොල් නිෂ්පාදනය 2022 වසර සඳහා ගෙඩි මිලියන 3319 ක් ලෙස පුරෝකථනය කරන ලද අතර, සත්‍යය ජාතික පොල් නිෂ්පාදනය (2022 වසර සඳහා) ගෙඩි මිලියන 3353 ක් විය.

ප්‍රධාන ජයග්‍රහණ ලෙස ඉහත සඳහන් කරන ලද නිර්දේශයන් හා තාක්ෂණය බිහිකිරීම් වලට අමතරව, විද්‍යා උපුටා දැක්වීම් දර්ශන සඟරාවන්හි (SCI) පර්යේෂණ පත්‍රිකා 12 ක් ද, ජාත්‍යන්තර සඟරා වල පර්යේෂණ පත්‍රිකා 11 ක්ද, දේශීය තීරක සඟරාවන්හි පර්යේෂණ පත්‍රිකා 2 ක් ද, ජාතික හා ජාත්‍යන්තර සම්මන්ත්‍රණවල පර්යේෂණ පත්‍රිකා 20 ක්ද, ග්‍රන්ථ පරිච්ඡේද 03 ක්ද, ප්‍රතිපත්ති ලේඛන 03 ක්ද, වෙනත් ලිපි 03 ක්ද ප්‍රකාශයට පත් කරන ලදී. පොල් පර්යේෂණ ආයතනයේ වසර 2020 වාර්ෂික වාර්තාව "රාජ්‍ය අංශය - පර්යේෂණ ආයතන" යන කාණ්ඩය යටතේ රන් සම්මානයෙන් පිදුම් ලබන ලදී. මෙය "ශ්‍රී ලංකා රාජ්‍යය මූල්‍යය ගණකාධිකාරිවරුන්ගේ සංගමය" (APFASL) විසින් සංවිධානය කරන ලදී. පොල් පර්යේෂණ ආයතනයේ නිල වෙබ් අඩවිය "LK Domain Registry" මඟින් සංවිධානය කරන ලද සම්මාන ප්‍රධාන උත්සවයේදී "රාජ්‍ය අංශයේ හොඳම වෙබ් අඩවිය" යන කාණ්ඩය යටතේ රන් සම්මානය හිමි කරගන්නා ලදී. "හොඳම පුරවැසි සේවා වෙබ් අඩවිය" යන කාණ්ඩය යටතේ රජත සම්මානයද, "Best Web.lk-2022" "සමස්ත" කාණ්ඩය යටතේ ලෝකඩ සම්මානයෙන්ද පිදුම් ලබන ලදී.

පොල් පර්යේෂණ ආයතනයේ වතු අංශය මෙම වසරේදී සමස්ත පොල් ගෙඩි මිලියන 5.17 ක් නිපදවන ලද අතර, එහි 2021 වසරේ අගය වන්නේ ගෙඩි මිලියන 5.13 කි. මේ වසර තුළ ගෙඩියක සාමාන්‍ය නිෂ්පාදන වියදම (COP) වූයේ රු.33.20 කි. ශුද්ධ සාමාන්‍ය අලෙවි මිල වූයේ (NSA) ගෙඩියකට රුපියල් 56.98 කි.

වසර 2022 දී පොල් පර්යේෂණ ආයතනය ලද ඉහත සියලු ජයග්‍රහණ වලට හේතු වූයේ කාර්ය මණ්ඩලයේ දැඩි කැපවීමත්, එකිනෙකා අතර සහයෝගිතාව හා අපවෙත ලබාදෙන ලද සහය මත බවත් එය අගය කරන්නේ හදපිරි සතුටින් බවත් සඳහන් කරමි.

ගරු අමාත්‍යතුමා, රාජ්‍ය ඇමතිතුමා, වැවිළි අමාත්‍යාංශයේ හා රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම්වරුන් හා නිලධාරිවරුන්ටද, සභාපතිතුමා ඇතුලු අධ්‍යක්ෂ මණ්ඩලයටද අප වෙත ලබාදුන් සහයෝගය වෙනුවෙන් ඉමහත් සේ කෘතඥතාවය පළ කරමි. පොල් පර්යේෂණ ආයතනයේ සියලු කර්තව්‍යයන් සර්වප්‍රකාරයෙන්ම සාර්ථක වේවා යැයි ප්‍රාර්ථනා කරමි.

ආචාර්ය සනාතනි රණසිංහ

අධ්‍යක්ෂ

පොල් පර්යේෂණ ආයතනය

පර්යේෂණ නිර්දේශ

පොල් වගාවේ සුදු මැස්සාගේ හානිය පාලනය කිරීම සඳහා කොහොඹ තෙල් සහ සබන් මිශ්‍රණය

වගා සංරක්ෂණ අංශය

පොල් වගාවේ සුදු මැස්සාගේ හානිය පාලනය කිරීම සඳහා කොහොඹ තෙල්, සබන් කුඩු සහ ජලය අඩංගු ස්වාභාවික කෘමිනාශක මිශ්‍රණයක් නිර්දේශ කරන ලදී. එම ස්වාභාවික කෘමිනාශක මිශ්‍රණයේ සංයුතිය පහත පරිදි වේ.

කොහොඹ තෙල්	- මිලිලීටර් 10
සබන් කුඩු	- ග්‍රෑම් 05
ජලය	- ලීටර් 01

සති දෙකක කාලාන්තර වල දී මාස දෙකක් දක්වා කෘමිනාශක මිශ්‍රණය පොල් කොළවල යටිපස තෙමෙන සේ ඉසීමෙන් පළිබෝධ හානිය සාර්ථකව මර්දනය කර ගත හැක. ගසකට ඉසීම සඳහා මිශ්‍රණයෙන් ලීටර් 05 - 08 අතර ප්‍රමාණයක් අවශ්‍ය වේ.



රූපය 1. සුදු මැස්සා උවදුර පාලනය කිරීම සඳහා කොහොඹ තෙල් සහ සබන් මිශ්‍රණය ඉසීම

කොම්පෝස්ට් සහ පණු පොහොර නිෂ්පාදනය සඳහා අමුද්‍රව්‍යයක් ලෙස ගිණි තෘණ නිර්දේශ කිරීම

ශෂ්‍ය විද්‍යා අංශය

පොල්වතු ඇතුළු බොහෝ කෘෂිකාර්මික පරිසර පද්ධතිවල ආක්‍රමණශීලී සහ ගැටළුකාරී වල්පැළෑටියක් ලෙස සැලකෙන ගිනි තෘණ පත්‍රයන්හි 1.49 - 0.71 % නයිට්‍රජන්, 0.29 - 0.19 % පොස්ෆරස්, 3.16 - 1.90 % පොටෑසියම්, 0.571 - 0.421 % කැල්සියම් සහ 0.451 - 0.322 % මැග්නීසියම් ප්‍රමාණයක් අන්තර්ගත වේ. ස්වාභාවිකව පවතින ගිනි තෘණ ක්ෂේත්‍රයක්, බිම් මට්ටමේ සිට සෙ.මී. 15 ක් ඉහළින් කැපීමෙන් පසු මල් පිපීමට පෙර සති 4 සිට සති 12 වර්ධන අවධීන් තුළදී කොම්පෝස්ට් සහ පණු පොහොර නිෂ්පාදනය සඳහා අමුද්‍රව්‍යයක් ලෙස භාවිතා කිරීමට නිර්දේශ කළ හැක. ගිනි තෘණ භාවිතයෙන් කොම්පෝස්ට් සහ පණු පොහොර නිපදවූ විට ඒවායෙහි නිෂ්පාදන කාර්යක්ෂමතාවයන් පිළිවෙලින් 13 - 20 % සහ 11 - 16 % වේ.

වගුව 01. ගිනි තෘණ භාවිතයෙන් නිෂ්පාදනය කරන ලද කොම්පෝස්ට් සහ පණු පොහොරවල පෝෂකයන්හි සාමාන්‍ය අගයන්

	නයිට්‍රජන් (%)	පොස්ෆරස් (%)	පොටෑසියම් (%)	කාබන් (%)
කොම්පෝස්ට්	2.30 - 1.62	0.80 - 0.42	2.53 - 1.83	23.79 - 20.49
පණු පොහොර	2.20 - 1.63	0.74 - 0.55	3.10 - 2.03	27.82 - 21.78



රූපය 2. *Eisenia fetida;* පණු පොහොර නිෂ්පාදනය සඳහා යොදාගන්නා බිම් පණුවන්

සත්ත්ව ආහාරයක් ලෙස ගිනි තෘණ නිර්දේශ කිරීම

ශෂ්‍ය විද්‍යා අංශය

ස්වාභාවිකව පවතින ගිණි තෘණ ක්ෂේත්‍රයක් බිම් මට්ටමේ සිට සෙ.මී. 15 ක් ඉහළින් කැපීමෙන් පසු සති 8ක වර්ධන අවධියේදී සත්ත්ව ආහාර නිෂ්පාදනය සඳහා නිර්දේශ කල හැක. සති 8 වර්ධන අවධියේ දී ගිනි තෘණවල 9.32 - 4.53% ක දළ ප්‍රෝටීන ප්‍රමාණයක් , 9.49 - 7.32% ක අළු ප්‍රමාණයක් සහ 39.63 - 36.39% ක දළ තන්තු ප්‍රමාණයක් අඩංගු වේ. ගිණි තෘණවල සති 4 සිට 12 දක්වා වර්ධන අවධියේ දී හෙක්ටයාරයකට මෙට්ට්‍රික් ටොන් 0.84 සිට 1.89 දක්වා වියළි ද්‍රව්‍ය අස්වැන්නක් ලබාගත හැක.



රූපය 3. ස්වාභාවිකව වර්ධනය වූ ගිණි තෘණ ක්ෂේත්‍රයකින් ගිනි තෘණ නෙළාගැනීම

ප්‍රතිපත්ති යෝජනා



ප්‍රතිපත්ති යෝජනා 2022

කෘෂි ආර්ථික විද්‍යා හා කෘෂි ව්‍යාපාර කළමනාකරණ අංශය

2022 වසරේ ඇති වූ ආර්ථික අවපාතය හා එහි බලපෑම අවම කිරීම

ශ්‍රී ලංකාවේ ආර්ථික අර්බුදය ඉතා තීරණාත්මක තත්ත්වයක් බවට පත් වූ අතර, එහි බලපෑම සියලුම පුද්ගලයින්, ආර්ථිකයේ ප්‍රධාන අංශ හා අවසානයේ මුළු ආර්ථිකය වෙත සම්ප්‍රේෂණය වීමෙනි. පසුගිය වසර 03 ක කාලය තුළ කොවිඩ් 19 රෝගී උවදුරු තත්ත්වය පැවතුණද පොල් කර්මාන්තය සුවිශේෂී ධනාත්මක වර්ධනයක් පෙන්වමින් ඇමරිකානු ඩොලර් මිලියන 834 ක අපනයන ආදායමක් ඉපයූ අතර, පොල් නිෂ්පාදනය ගෙඩි මිලියන 3,300 ක් දක්වා වර්ධනය වෙමින් දේශීය පරිභෝජනයට අවශ්‍ය ඉල්ලුම සපුරනු ලැබීය. 2022 වසරේද මෙම කර්මාන්ත හොඳින් ක්‍රියාත්මක වූවද පැවති ආර්ථික අවපාතය නිසා මෙම නිෂ්පාදන කර්මාන්ත ක්‍රියාත්මක කිරීමට බාධාවක් ඇති විය. මෙයට අමතරව යෙදවුම් වල හිඟතාවය හා නඩත්තු වියදම් ඉහළ යාම නිසා හා පොල් මිල ඒකාකාරී මිලක පැවතීම නිසා පොල් වගා ක්ෂේත්‍රයද ගැටලු සහගත තත්ත්වයකට පත් විය. රට විදේශ විනිමය ඉපයීමේ දරුණු ගැටළුවකට පත් වී ඇති පසුබිමක රජය විසින් පොල් කර්මාන්තය පවත්වාගෙන යාමට ඇති වී ඇති අවශ්‍යතාවයන් හා ක්‍රියාවලීන් අවශ්‍ය ගැලපීම් සිදු කරන්නේ නම් පොල් කර්මාන්තය සතුව ඉහළ ඩොලර් ප්‍රමාණය ඉපයීමේ විභවයක් පවතී. එමෙන්ම පවතින ප්‍රතිපත්ති නිසා විශාල වශයෙන් පොල් තෙල් ආනයනය නිසා අධික විදේශ විනිමය ප්‍රමාණයක් අපතේ යාමක් සිදු වේ. ඒ අනුව, පහත සඳහන් ගැටළු හා ප්‍රතිපත්ති යෝජනා මෙම ගැටළු විසඳීම සඳහා ඉදිරිපත් කෙරිණි.

ගැටලුව 1 : පොල් වගා ක්ෂේත්‍රය හා පොල් සැකසුම් කර්මාන්තය සඳහා ඉන්ධන හිඟවීම

උපායමාර්ගය : ලංකා ඛනිජ තෙල් සංස්ථාව මඟින් හෝ ඉන්දියන් තෙල් සමාගම විසින් පොල් ආශ්‍රිත නිෂ්පාදකයින් සඳහා ප්‍රමුඛත්වය ලබා දී අවශ්‍ය ඉන්ධන වන ඩීසල් හා දැවිතෙල් ලබා දීමට කටයුතු කළ යුතුය. මෙම තෙල් හිඟය නිසා බොහොමයක් පොල් ආශ්‍රිත සැකසුම් කර්මාන්ත ගැටලුවකට පත් වී ඇත.

නිර්දේශ:

1. පොල් ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්ත සඳහා රුපියල් හෝ ඩොලර් අය කර සෘජුවම තෙල් සැපයීම සිදු කළ යුතු බවට නිර්දේශ කරන ලදී. පොල් පර්යේෂණ ආයතනය ඉදිරිපත් කළ මෙම ප්‍රතිපත්ති යෝජනාව ක්‍රියාත්මක කරන ලදී.

2. ලංකා ගමනාගමන මණ්ඩලයට අයත් තෙල් සැපයුම් ඒකක වලින් පොල් ත්‍රිකෝණයේ නිෂ්පාදන ආයතන වෙත තෙල් නිකුත් කිරීම සඳහා විශේෂිත මධ්‍යස්ථාන ස්ථාපිත කිරීම. මෙම යෝජනාව ක්‍රියාත්මක කරන ලදී.

3. පොල් පර්යේෂණ ආයතනයට අයත් තෙල් සැපයුම් ඒකකය වැඩි දියුණු කර කර්මාන්තයට අවශ්‍ය තෙල් බෙදා හැරීමේ මධ්‍යස්ථානයක් ලෙස ක්‍රියාත්මක වේ. මේ සඳහා වැවිලි අමාත්‍යාංශය, බලශක්ති අමාත්‍යාංශය හා අදාල ආයතන අවශ්‍ය අනුමැතිය ලබා දීම සඳහා ක්‍රියාත්මක විය යුතුය. පොල් සැකසුම් කර්මාන්ත මේ සඳහා ආයෝජනයට අවශ්‍ය මුදල් ලබා දීමට චිකගතාවය පල කරන ලදී. තෙල් ගැටලුව විසදුන නිසා මෙය ක්‍රියාත්මක නොවීය.

ගැටලුව 2 : ඉන්ධන හිඟය නිසා කර්මාන්තශාලා වල හා වතු ආශ්‍රිත කටයුතු සඳහා ශ්‍රමිකයන්ගේ පැමිණීම අවම වීම.

නිර්දේශය :

වක් වක් සේවාවේ ස්වභාවය සළකා සලාක ක්‍රමයට ඉන්ධන ලබා දීමට ක්‍රියාකිරීම හා පොල් කර්මාන්තය අත්‍යවශ්‍ය සේවා ලෙස පනතට ඇතුළත් කිරීම.

ගැටලුව 3 : පොල් සැකසුම් කර්මාන්තය සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය සපයා ගැනීම.

පොල් සැකසුම් කර්මාන්තයට අවශ්‍ය අමුද්‍රව්‍ය ආනයනය කිරීම ගැටලු සහගත තත්ත්වයකට පත් විය. විශේෂයෙන් ඇසුරුම්කරණය සඳහා අවශ්‍ය පොලිතීන්, ඇසුරුම් හා රසායන ද්‍රව්‍ය මේ අතර විය.

නිර්දේශය :

අපනයනකරුවන් විසින් උපයන විදේශ විනිමය යොදාගෙන කර්මාන්තයට අවශ්‍ය අමුද්‍රව්‍ය ආනයනයට අවසර ලබා දෙන ලෙස නිර්දේශ කෙරේ. මෙම නිර්දේශයන්ට අනුව කර්මාන්තයට අවශ්‍ය අමුද්‍රව්‍ය ආනනයට පනවා තිබූ සීමා ලිහිල් කරන ලදී.

ගැටලුව 4 : යන්ත්‍රෝපකරණ හා උපාංග වල මිල ඉතා ඉහළ අගයන්ගෙන් ඉහළ යාම.

අමතර කොටස් හා යන්ත්‍රෝපකරණ වියදම ඉතා විශාල වශයෙන් ඉහළ යාම නිසා කර්මාන්තශාලා වල නඩත්තු වියදම ඉතා ඉහළ අගයක් දක්වා ඉහල යන ලදී. මෙම තත්ත්වය නිෂ්පාදන පිරිවැය ඉහළවීම් යාමට හා දේශීය නිෂ්පාදන අන්තර්ජාතික වෙළඳපොළේ තරඟකාරී නොවන තත්ත්වයට පත් විය හැකි වේ.

නිර්දේශය :

බදු සහන ලබා දෙමින් කර්මාන්ත සඳහා අවශ්‍ය යන්ත්‍රෝපකරණ ආනයනයට ඉඩ දෙන ලෙස නිර්දේශ කෙරේ.

ගැටලුව 5 : අධික විදේශ විනිමයක් වැය කර ආනයනය කරනු ලබන බාද්‍ය තෙල් ආනයනය සීමා කිරීම.

බදු සහන ලබා දෙමින් විශාල ප්‍රමාණයක් විදේශ විනිමය අපතේ යවමින් පොල් තෙල් ආනයනය කිරීම සිදු කෙරේ. මෙහිදී වර්තමානයේ අන්තර්ජාතික වෙළඳපොළේ ඉතා අධික මිලක පවතින පොල්තෙල් දේශීය වෙළඳපොළේ ඇති වන බාද්‍ය තෙල් ඉල්ලීම සැපිරීම සඳහා ආනයනය කිරීම සිදු වේ.

නිර්දේශය :

පොල්තෙල් සඳහා ලබා දී ඇති බදු සහන ඉවත් කර පොල්තෙල් හා අනෙකුත් තෙල් සඳහා වෙළඳපොළේ ඒකාකාරීව තරඟ කිරීමට අවස්ථාව ලබා දීම. එහෙත් දේශීය පොල්තෙල් කර්මාන්තය ආරක්ෂා කිරීම ආනයනය කරනු ලබන තෙල් ප්‍රමාණය සීමා කළ යුතුය.

ගැටලුව 6 : අපනයන මඟින් උපයනු ලබන විදේශ විනිමය රට තුලට නොලැබීම.

අපනයන මඟින් උපයනු ලබන විදේශ විනිමය ආපසු රට තුළට රැගෙන ඒම අත්‍යවශ්‍ය කාරණයක් වේ. රේගු සංඛ්‍යාලේඛන වල අපනයනය මඟින් උපයන ආදායම් ලෙස සටහන් වූවද එම මුදල් නැවත රට තළට ලැබෙනවාද යන්න අධීක්ෂණය කිරීමේ ක්‍රමවේදයක් නොමැත. මෙය අත්‍යවශ්‍ය කාරණයකි. මේ සඳහා ක්‍රියාමාර්ග ගෙන ඇත.

නිර්දේශ:

1. විදේශ විනිමය ඉපයීම නිසි පරිදි සම්ප්‍රේෂණය කරන්නේ ද යන්න අධීක්ෂණය සඳහා ක්‍රමවේදයක් සැකසීමට නිර්දේශ කෙරේ.

2. අපනයන මඟින් උපයන ලද විදේශ විනිමයෙන් 50% ක් ඩොලර් ලෙස පොල් සැකසුම් කර්මාන්ත වෙත සම්ප්‍රේෂණය කිරීමට යාන්ත්‍රණයක් සැකසීම.

3. අපනයන භාණ්ඩ නිෂ්පාදනය කිරීම සඳහා දායක වන පුද්ගලයින් හට ඩොලර් ගිණුම් ආරම්භ කිරීමට අවස්ථාව ලබා දීම හා අපනයනකරුවන් විසින් නිෂ්පාදකයින් වෙත ගෙවිය යුතු මුදලින් 30% ක් වන මුදලක් ගෙවිය යුතු වේ.

4. අපනයන ආදායමෙන් අවම වශයෙන් සියයට 30 ක් හුවමාරු කිරීම සඳහා මහ බැංකුව විසින් නිෂ්කාශනය කළ යුතුය. ඒ වගේම රටේ ගිණුම්වලට ආපසු එවන අපනයන ප්‍රමාණය නිරීක්ෂණය කිරීමට ඒකකයක් ස්ථාපිත කළ යුතුයි.

ගැටලුව 7 : පොල් නිෂ්පාදනය සඳහා චීනය ඉතා හොඳ වෙළඳපොළකි. දැනටමත් චීන රජය සමඟ නිදහස් වෙළඳ ගිවිසුමක් කෙටුම්පත් කර ඇති බවට තොරතුරු ලැබී ඇති අතර, එයට පොල් කිරි පමණක් ඇතුළත් කර ඇති බවට තොරතුරු ලැබී ඇත.

නිර්දේශය :

පොල් නිෂ්පාදන නිදහස් වෙළඳ ගිවිසුම සඳහා ඇතුලත් කිරීම.

ගැටලුව 8 : සම්පත් හා සේවාවන් වෙන් කිරීමේදී පොල් කර්මාන්තය සඳහා ප්‍රමුඛත්වය ලබා දී නොමැත.

නිර්දේශය :

වැවිලි කර්මාන්තයට අදාල කටයුතු අත්‍යවශ්‍ය සේවා යටතට ගැනීම.

ගැටලුව 9 : පොල් වගාවට අවශ්‍ය යෙදවුම් හා විශේෂයෙන් පොහොර මිල ඉහළ යාම වගා කටයුතු සඳහා දැඩි බලපෑමක් ඇති කර ඇත.

පොල් ගසෙන් ඉවත් වන පෝෂක නැවත ලබා දීම අත්‍යවශ්‍ය වන අතර, විශේෂයෙන් පොල් ගෙඩි හා පොල් අතු ලෙස විශාල පෝෂක ප්‍රමාණයක් අහිමි වීම සිදු වේ. වර්තමාන දත්ත වලට අනුව දැනට වසර තුනක පමණ සිට පොහොර යෙදීමක් සිදු වී නොමැති අතර, විශේෂයෙන් මියුරියේට් ඔෆ් පොටෑෂ් ලබා දීම අත්‍යවශ්‍ය කටයුත්තක් බවට පත්ව ඇත.

නිර්දේශය :

පොල් වගාවට අවශ්‍ය පෝෂක ආනයනය සඳහා අවසර දීම හා අනෙකුත් උපාංග බදු සහන යටතේ ආනයනයට අවසර දීම. එමෙන්ම පොල් සඳහා සාධාරණ මිලක් ලබා දීම.

ගැටලුව 10 : සුදු මැස්සාගේ උවදුර පාලනය සඳහා මුදල් වෙන් කිරීම.

නිර්දේශය :

සුදු මැස්සාගේ හානිය කෑගල්ල දිස්ත්‍රික්කයේ බොහොමයක් ප්‍රදේශ වල පැතිරී ඇති අතර, එය බස්නාහිර පළාත තුලටද පැතිරෙමින් පවතී. මෙම තත්ත්වය පාලනය සඳහා ඉක්මනින් පියවර ගත යුතු බවට නිර්දේශ කෙරේ.

ගැටලුව 11 : වෙළඳපොළ භාණ්ඩ

ශ්‍රී ලංකාවේ භාණ්ඩ අපනයනය සඳහා රටවල් කිහිපයක් සීමාවන් පනවා ඇත. වර්තමානයේ පකිස්ථානය කිරි ඉවත් කරන ලද පිටි කළ පොල් අපනයනය සඳහා බාධාවක් පනවා ඇත.

නිර්දේශය :

මෙම තත්ත්වය සමථයකට පත් කර ගැනීම සඳහා රාජ්‍යයන් දෙක අතර සාකච්ඡා කළ යුතු අතර, පොල් සංවර්ධන අධිකාරියේ මැදිහත් වීමද සිදු කළ යුතු බවට නිර්දේශ කෙරේ.

පර්යේෂණ හා සංවර්ධන ජයග්‍රහණ



පොල් ප්‍රභේද වැඩි දියුණු කිරීම

දේශීය හා විදේශීය ජාන ප්ලාස්ම භාවිත කර නව දෙමුහුම් පොල් ප්‍රභේද නිපදවීම

ප්‍රවේණි හා ශාක අභිජනන අංශය

ශාක අභිජනනය මඟින් බෝග වැඩිදියුණු කිරීම අවසන් නොවන ක්‍රියාවලියකි. ශ්‍රී ලංකා පොල් පර්යේෂණ ආයතනය විසින් මේ වනවිට අභිජනන ක්‍රියාවලිය මඟින් වැඩිදියුණු කළ පොල් ප්‍රභේද හතක් නිර්දේශ කර තිබුණත්, තවදුරටත් පොල් අභිජනනය කිරීමේ ක්‍රියාවලිය සිදු කළ යුතු වේ. ඒ අනුව 2022 වර්ෂයේදී පොල් පර්යේෂණ ආයතනය සතුව පවතින දේශීය හා විදේශීය ජාන ප්ලාස්ම භාවිතා කරමින් නව දෙමුහුම් ප්‍රභේද නිපදවීමේ පර්යේෂණයක් ආරම්භ කරන ලදි.

එම වැඩසටහනේදී කා(ර්) කා(ර්) උස (KKT) හා මකම් වැලි උස (MKV) යන විදේශීය පොල් ප්‍රභේද හා ශ්‍රී ලංකා රන් තැඹිලි (RT) යන දේශීය පොල් ප්‍රභේදය පිය ශාකය ලෙසත් ශ්‍රී ලංකා කොළ කුන්දිරා (SLGD) හා ශ්‍රී ලංකා කහ කුන්දිරා (SLYD) යන පොල් ප්‍රභේද මව් ශාකය ලෙසත් තෝරාගෙන අභිජනන ක්‍රියාවලිය සිදු කරයි.

කා(ර්) කා(ර්) උස ප්‍රභේදයේ පොල් වතුරෙහි පවතින ඉහළ ගුණාත්මකභාවය සහ ඉහළ කොප්පරා ප්‍රමාණය යන ලක්ෂණත් මකම් වැලි උස (MKV) ප්‍රභේදයේ හා ශ්‍රී ලංකා රන් තැඹිලිවල පවතින ඉහළ කොප්පරා ඵලදාව හා කොප්පරාවල ගුණාත්මකභාවය යන කරුණුත් සැලකිල්ලට ගෙන මෙම පොල් ප්‍රභේද පිය ශාක ලෙස භාවිත කිරීමට තීරණය කරන ලදී.



රූපය 1. විදේශීය පොල් ප්‍රභේද සමඟ දෙමුහුම් නිෂ්පාදනය සඳහා අත් පරාගනය සිදු කිරීම

අඹකැලේ හුදකලා බීජ පොල් උයනේ ස්ථාපිත ශ්‍රී ලංකා කොළ කුන්දිරා හා ශ්‍රී ලංකා කහ කුන්දිරා භාවිත කර ඉහළ විභවයක් ඇති දෙමුහුම් ප්‍රභේද හයක් මෙම වැඩසටහන යටතේ නිපදවයි. එම දෙමුහුම් ප්‍රභේද හා වැඩිදියුණු කිරීමට අපේක්ෂිත බෝග ගුණාංග වගුව 01 මගින් දක්වා ඇත.

වගුව 01. දෙමුහුම් ප්‍රභේද සහ වැඩිදියුණු කිරීමට අපේක්ෂිත බෝග ගුණාංග

	දෙමුහුම	වැඩි දියුණු කිරීමට අපේක්ෂිත බෝග ගුණාංගය
01	SLGD x RT	වැඩි අස්වැන්න හා ඉහළ කොප්පරා ඵලදාව
02	SLYD x RT	
03	SLGD x KKT	ගුණාත්මයෙන් ඉහළ කොප්පරා හා පොල් වතුර
04	SLYD x KKT	
05	SLGD x MKV	වැඩි අස්වැන්න හා ඉහළ කොප්පරා ඵලදාව
06	SLYD x MKV	

පොල් මයිටා හානියට ඔරොත්තු දෙන පොල් ප්‍රභේදයක් නිපදවීම


ප්‍රවේණි හා ශාක අභිජනන අංශය

ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ පොල් වගාවේ අස්වැන්න විශාල ලෙස අඩු වීමට හේතු වන ප්‍රධාන පළිබෝධකයෙකු ලෙස ඇසරියා මයිටා හානිය හැඳින්විය හැක. මෙම හානියට තිරසාර විසඳුමක් ලෙස ශ්‍රී ලංකා පොල් පර්යේෂණ ආයතනයේ ප්‍රවේණි හා ශාක අභිජනන අංශය මඟින් පොල් මයිටා හානියට ඔරොත්තු දෙන පොල් ප්‍රභේදයක් නිපදවීමේ ශාක අභිජනන වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලදී. එහිදී නව දෙමුහුම් ප්‍රභේද පහක් පර්යේෂණය සඳහා යොදා ගත් අතර, ඒවා නම් ශ්‍රී ලංකා උස x බ්‍රසීලියන් කොළ කුන්දිරා (T x BGD), ගොන් තැඹිලි x බ්‍රසීලියන් කොළ කුන්දිරා (GT x BGD), සැන්රාමන් x බ්‍රසීලියන් කොළ කුන්දිරා (SR x BGD), ශ්‍රී ලංකා කහ කුන්දිරා x ගොන් තැඹිලි (YD x GT) වේ.

වසර 13ක් පුරාවට ගන්නා ලද දත්ත අනුව ශ්‍රී ලංකා උස x බ්‍රසීලියන් කොළ කුන්දිරා (T x BGD) දෙමුහුම, මයිටා හානියට ඉහළ ප්‍රතිරෝධීතාවයක් පෙන්වන ලද අතර එම ප්‍රතිඵල 2022දීත් වාර්තා විය. 2022 වර්ෂයේදී T x BGD දෙමුහුම අනෙකුත් වගා ප්‍රභේදවලට සාපේක්ෂව අඩු මයිටා හානි අවස්ථාවක් පෙන්වන ලද අතර, එය 20% වඩා ඉක්මවා ගියේ මැයි මාසයේදී පමණි. දිගින් දිගටම නිරීක්ෂණය වන T x BGD පවතින මෙම ලක්ෂණය, මයිටා හානියට ප්‍රතිරෝධී පොල් ප්‍රභේදයක් ලෙස එය නිර්දේශ කිරීමේ ඉහළ විභවය පෙන්නුම් කරයි. එමනිසා පිය ශාකය වන බ්‍රසීලියන් කොළ කුන්දිරා ශාකයේ පැළ ප්‍රමාණය වැඩි කිරීම සඳහා ස්වපරාගනයෙන් නිපදවන ලද පැළ 26ක් ක්ෂේත්‍ර ජාන බැංකුවේ සිටුවන ලදී. ස්වපරාගනයෙන් එම පිය ශාක ප්‍රමාණය වැඩිකිරීමේ ක්‍රියාවලිය තවදුරටත් ක්‍රියාත්මක වේ.



රූපය 2. පොල් වල පොල් මයිටා ආසාදනය



රූපය 3. මයිටා හානියට ගොදුරුවීමේ ප්‍රතිශතය

පොල් ජාන ප්ලාස්ම එකතු කිරීම, සංරක්ෂණය හා ශාක අභිජනනයේදී භාවිතා කිරීම

ප්‍රවේණි හා ශාක අභිජනන අංශය

01. F2 පරම්පරාවක රූප විද්‍යාත්මක හා අණුක විද්‍යාත්මක ලක්ෂණ වෙන්වීම අධ්‍යයනය කිරීම හා අණුක සලකුණු - රූපාණු ලක්ෂණ අතර සම්බන්ධතාව ගොඩනැංවීම.

ශ්‍රී ලංකා පොල් පර්යේෂණ ආයතනය සතුව පවතින ක්ෂේත්‍ර ජාන බැංකුවල දේශීය හා විදේශීය පොල් දර්ශ සියයකට අධික සංඛ්‍යාවක් සංරක්ෂණය කර ඇත. මෙම ජාන ප්ලාස්ම වගාවන් විවිධ ප්‍රවේණි විද්‍යාත්මක අධ්‍යයනයන් සඳහාද යොදා ගත හැක. F2 වැනි වෙන්වීම සිදුවන පරම්පරාවන් නිපදවීම අණුක සලකුණු - රූපාණු ලක්ෂණ සම්බන්ධතාවන් ගොඩ නැංවීමටත්, එයින් අණුක සලකුණු යොදා සිදුකරනු ලබන වරණයන් (Marker Assisted Selection) සිදු කිරීමටත් වැදගත් වේ.

මෙම පර්යේෂණයේදී, මිද්දෙණිය පර්යේෂණ මධ්‍යස්ථානයේ පිහිටා ඇති කොළ කුන්දිරා x කහ කුන්දිරා සහ රතු කුන්දිරා x දුඹුරු කුන්දිරා වල F2 පරම්පරා දෙකක් යොදා ගෙන, ප්‍රමාණාත්මක රූපීය ලක්ෂණ 16ක් අධ්‍යයනය කරන ලදී. ඒ සඳහා SSR අණුක සලකුණු 06ක් යොදා ගන්නා ලදී.

පර්යේෂණයේ ප්‍රතිඵලවලට අනුව එම F2 පරම්පරා දෙකෙහිම ලක්ෂණවල ඉහළ වෙන්වීමක් නිරීක්ෂණය කළ අතර එමනිසා එහි අණුක සලකුණු - රූපාණු ලක්ෂණ අතර සම්බන්ධතාවයන් ගොඩනැංවීම සඳහා භාවිත කරන ලදී. මෙහිදී හඳුනාගන්නා ලද අණුක සලකුණු - රූපාණු ලක්ෂණ කිහිපයක්ම සහ සම්බන්ධතා පෙන්වන ලද අතර එම අණුක සලකුණු - රූපාණු ලක්ෂණ අතර සම්බන්ධතාවයන් වගුව 02 තුළ දක්වා ඇත. එම රූප විද්‍යාත්මක ලක්ෂණ බොහොමයක් ප්‍රභාසංස්ලේෂණයටත්, එමගින් ඵලදාවට හා පොල් ගසේ වර්ධනයටත් සම්බන්ධ බව පැහැදිලි විය.

වගුව 02. සැලකිය යුතු අණුක සලකුණු - රූපානු ලක්ෂණ අතර සම්බන්ධතාවයන්

	SSR අණුක සලකුණ	සම්බන්ධ රූපාණු ලක්ෂණය
01	CnCirB12	පොල් වලු සංඛ්‍යාව පත්‍රිකා සංඛ්‍යාව පත්‍රිකා දිග පත්‍ර නටුවේ පළල
02	CnCirC3	පත්‍ර නටුවේ දිග
03	CnCirE10	පත්‍රිකා දිග පත්‍ර නටුවේ පළල පත්‍ර නටුවේ දිග
04	CnCirG11	පරාගන ආකාරය

02. ක්ෂේත්‍ර පරාග බැංකුවක් ස්ථාපනය කිරීම

ශ්‍රී ලංකා දුඹුරු කුන්දිරා සහ මලයානු රතු කුන්දිරා යොදාගෙන නිපදවන ලද දෙමුහුම් පොල් ප්‍රභේද දැනටමත් පොල් වගාකරුවන්ට නිර්දේශ කර ඇත. බ්‍රසීලියන් කොළ කුන්දිරා යොදාගෙන සාදා ගන්නා ලද දෙමුහුම් ප්‍රභේද පර්යේෂණ මට්ටමින් නිරීක්ෂණය කරමින් පවතින අතර, මේ වනවිටත් එහි එක් දෙමුහුම් ප්‍රභේදයක් ඇසරියා මයිටා හානියට සාර්ථකව ඔරොත්තු දෙන බව සොයාගෙන ඇත. මේ නිසා ශ්‍රී ලංකා දුඹුරු කුන්දිරා, මලයානු රතු කුන්දිරා හා බ්‍රසීලියන් කොළ කුන්දිරා යොදාගෙන නිෂ්පාදනය කරන දෙමුහුම් පොල් බීජ නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා පරාග ලබා ගැනීමේ අරමුණින් පොල් පර්යේෂණ ආයතනයේ බණ්ඩිරිප්පුව වත්තේ පරාග බැංකුවක් ස්ථාපනය කරන ලදී. මෙහි පළමු පියවර ලෙස ස්වපරාගනයෙන් නිපදවන ලද මැලේසියානු රතු කුන්දිරා පැළ 14ක්, බ්‍රසීලියන් කොළ කුන්දිරා පැළ 26ක් සහ ශ්‍රී ලංකා දුඹුරු කුන්දිරා පැළ 35 රෝපණය කරන ලදී.

ළපටි පුෂ්ප රෝපිත කිණක පටක තුළින් අලිංගික කළල ජනනය හා පැළ නිපදවීම

පටක රෝපණ අංශය

රෝපණ මාධ්‍යයට ග්ලූටමීන් එකතු කිරීම මඟින් කැලස් ජනනය, කැලස් ගුණනය සහ ක්ලෝන පැළ ජනනය වීමේ ප්‍රවණතාවයට ඇති බලපෑම අධ්‍යයනය කිරීමට පරීක්ෂණ සිදු කරන ලදී. කැලස් ජනනය, කැලස් ගුණනය සහ ක්ලෝන පැළ ජනනය සඳහා භාවිතා කරන රෝපණ මාධ්‍යයන්ට ග්ලූටමීන් සාන්ද්‍රණයන් තුනක් (0.1 g/l, 1 g/l සහ 2.8 g/l)එකතු කරන ලදී. ග්ලූටමීන් 2.8 ටරැක සාන්ද්‍රණය තුළින් වැඩිම පැළ සංඛ්‍යාවක් ජනනය විය. කොවිඩ් 19 සංචාරක සීමා කාලය තුළ පර්යේෂණාගාරය වසා දැමීමෙන්, සැළකිය යුතු පටක සංඛ්‍යාවක් මිය යාම හේතුවෙන් ප්‍රතිඵල සංඛ්‍යානමය විශ්ලේෂණයක් සිදු කිරීමට නොහැකි විය. මෙම කාලය තුළ ක්ලෝන පැළ 500ක් පමණ ජනනය කරන ලදී. මෙම වසර තුළදී ළපටි පුෂ්ප රෝපණය මඟින් නිපදවූ ක්ලෝන පැළ 60ක් දැඩි කිරීමට හැකි වූ අතර, පෙර දැඩි කරන ලද ක්ලෝන පැළ 40ක් ක්ෂේත්‍රයේ සිටුවන ලදී. බණ්ඩිරිප්පුව වත්තෙහි ආරම්භ කරන ලද ක්ෂේත්‍රය තුළ ක්ලෝන පැළ සිටුවීම සම්පූර්ණ කරන ලද අතර, ඇල්පිටිය වතුයායේ නව ක්ෂේත්‍ර පරීක්ෂණයක් ආරම්භ කරන ලදී.

පොල් පටක රෝපණය සඳහා නව පූර්වක පටක හඳුනා ගැනීම

පටක රෝපණ අංශය

පටක රෝපණය සඳහා නව පූර්වක පටකයක් ලෙස නොමේරූ පත්‍ර යොදා ගැනීමේ විභවය අධ්‍යයනය කිරීම සඳහා නොමේරූ පත්‍ර කොටස් සංයුතිය වෙනස් රෝපණ මාධ්‍ය තුළ රෝපණය කර පරීක්ෂණ පවත්වන ලදී. නලස්ථ ක්ලෝන පැළ නැවත ගුණනය කිරීම සඳහා යොදා ගත හැකි ක්‍රමවේදයක් ලෙස භාවිතා කිරීමේ අරමුණ ඇතිව මෙම පරීක්ෂණ සඳහා නලස්ථ කළල රෝපිත පැළවල ළපටි පත්‍ර යොදා ගන්නා ලදී. රෝපිත කිහිපයක් 400 µM, 2,4-D අඩංගු රෝපණ මාධ්‍ය තුළදී කැලස් ජනනය කරන ලද අතර, කැලස් පටක කිහිපයකින් ක්ලෝන පැළ ජනනය කර ගත හැකි විය. 400 µM, 2,4-D

අඩංගු රෝපණ මාධ්‍ය තුළදී ගෝලාකාර එම්බ්‍රොයිඩ් ජනනය වී එම එම්බ්‍රොයිඩ් කිහිපයක් ප්‍රරෝහණයෙන් පැළ ජනනය කර ගත හැකි විය. මෙම පැළ මුල් ගැන්වීම සඳහා රෝපණ මාධ්‍ය රෝපණය කරන ලදී.



රූපය 4. මුල් ගන්වන මාධ්‍යයේ ඇති නොමේරූ පත්‍ර රෝපණය මගින් ලබා ගත් නළස්ථ පැළ

නළස්ථ හා ජෛව රසායන ප්‍රවේශ මඟින් අලිංගික කළල ජනනය හා පටක රෝපණ විභවය අධ්‍යයනය කිරීම

පටක රෝපණ අංශය

අලිංගික කළල ජනනයේදී දැකිය හැකි ජෛව රසායන හා ව්‍යුහ විද්‍යාත්මක විෂමබව හා රෝපණ තත්ත්වයන්ට ප්‍රතිචාර දැක්වීමේ විෂම බව අධ්‍යයනය කිරීමට පරීක්ෂණ ආරම්භ කරන ලදී. පොල් පටක රෝපණයේ මුහුණ දෙන ප්‍රධාන බාධකවලින් එකක් වන්නේ පූර්වක පටක දුඹුරු පැහැ වීමයි. පටක රෝපණය සඳහා විච්ඡේදනය කිරීමේදී සෛල තුළ ඇති පොලිෆීනෝල් ඔක්සිකරණය වීම මෙම දුඹුරු පැහැ වීමට හේතු වෙයි. එබැවින් ළපටි පුෂ්ප පටක තුළ පොලිෆීනෝල් අන්තර්ගතය අධ්‍යයනය කිරීම සඳහා පරීක්ෂණ ආරම්භ කරන ලදී.

පටක දුඹුරු පැහැ වීම අවම කිරීම මඟින් පටක රෝපණ සාර්ථකත්වය වැඩි කිරීමට ප්‍රතිඔක්සිකාරක (PVP" පොලිවීමයිඩ්) සාන්ද්‍රණයන් කිහිපයක් රෝපණ මාධ්‍යයට එකතු කිරීම සිදු කරන ලදී. සක්‍රීය අඟුරු (0.1%) PVP (0.1%), පොලිවීමයිඩ් (0.05%) හා ඡඪඡ (0.1%), පොලිවීමයිඩ් (0.05%) මාධ්‍යයට එකතු කර පරීක්ෂා කරන ලදී. සක්‍රීය අඟුරු (0.1%) අඩංගු රෝපණ මාධ්‍ය තුළ පටක දුඹුරු පැහැ වීමට සංසන්දනාත්මකව PVP (0.1%), පොලිවීමයිඩ් (0.05%) හා PVP (0.1%), පොලිවීමයිඩ් (0.05%) මාධ්‍ය තුළ පිළිවෙලින් පටක

දුඹුරු පැහැ වීම අඩු විය. එසේ වුවද කැලස් ජනනය සඳහා සුදුසු ප්‍රතිඔක්සිකාරකය සක්‍රීය අඟුරු (0.1%) විය. පටක දුඹුරු පැහැවීම අඩුකර කැලස් ජනනය වැඩිදියුණු කිරීමට ප්‍රතිඔක්සිකාරක යොදා ගැනීම සඳහා වැඩිදුර පරීක්ෂණ සිදුකිරීම අවශ්‍ය වේ.

අග්‍රස්ථ අංකුර රෝපණය මත රූපානුදර්ශ විශේෂත්වය අධ්‍යයනය කිරීම

පටක රෝපණ අංශය

අග්‍රස්ථ අංකුර ගුණනය මගින් පොල් සඳහා ක්ෂුද්‍ර ප්‍රචාරණ ක්‍රමවේදයක් හඳුනා ගැනීමට නළස්ථ කළල රෝපිත පැළවල අග්‍රස්ථ අංකුර 1 µM, TDZ අඩංගු Y3 අඩංගු රෝපණ මාධ්‍ය තුළ රෝපණය කර 270C උෂ්ණත්වයකදී පැය 16 ආලෝකය (පැය 8 අඳුර) ලබා දී අධ්‍යයනය කරන ලදී. ගුණනය වන අංකුර පොකුරු කිහිපයක් ලබා ගත හැකි වූ අතර, ඒවායින් පැළ කිහිපයක් ද ලබා ගත හැකි විය.



රූපය 5. අග්‍රස්ථ අංකුර ගුණනය මගින් පැළ ලබා ගැනීම



පොල් නිෂ්පාදන තාක්ෂණය

පරිණත පොල් වගාව සඳහා ජීව අඟුරු භාවිතයෙන් තිරසාර තෙතමන සංරක්ෂණ ක්‍රමයක් සැලසුම් කිරීම

ශෂ්‍ය විද්‍යා අංශය

වසර පුරා තෙතමනය අඛණ්ඩව සැපයීම පොල්වල වර්ධනයට සහ අස්වැන්න සඳහා ඉතා වැදගත් වේ. මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වනුයේ ශ්‍රී ලංකාවේ වියළි සහ අතරමැදි කලාපවල පොල් වගාවන් සඳහා ජීව අඟුරු යොදා ගනිමින් තිරසාර පාංශු තෙතමන සංරක්ෂණ ක්‍රමයක් සැලසුම් කිරීමයි. මෙහි දී, ග්ලිරිසීඩියා දඬු කැබලි අවම ඔක්සිජන් සැපයුමක් යටතේ නවීකරණය කරන ලද පෝරණුවක් තුළ දහනය කිරීමෙන් ජීව අඟුරු සාදාගන්නා ලදී.



රූපය 1. රස්නායකපුර නාගන්සෝල වතුයායේ ස්ථාපනය කරන ලද පර්යේෂණ ක්ෂේත්‍රය

මෙම අධ්‍යයනයේ ප්‍රතිඵල ලෙස හෙළි වූයේ, ප්‍රතිකාර යෙදීමෙන් පසු වසර 6 - 7කට පසුව පවා අස්වැන්න ($P < 0.05$) සැලකිය යුතු ප්‍රමාණයකින් වැඩිවී නොමැති බවයි. එබැවින් අස්වැන්න ඉහළ නැංවීම සඳහා ජීව අඟුරු කිලෝග්‍රෑම් 10 සිට 15 දක්වා යෙදීම ප්‍රමාණවත් නොවන බවට නිගමනය කරන ලදී.


මේ අනුව පාංශු තෙතමනය රඳවා තබාගැනීම සඳහා ජීව අඟුරු කිලෝග්‍රෑම් 15කට වඩා වැඩි ප්‍රමාණයක් යොදා එහි බලපෑම අධ්‍යයනය කිරීමට අවශ්‍ය වේ.

මෙම අධ්‍යයනයේ වැදගත්කම ලෙස නිරීක්ෂණය වූයේ, පාලක සහ පොල්ලෙලි යෙදූ ප්‍රතිකාරකවලට සාපේක්ෂව ජීව අඟුරු කිලෝග්‍රෑම් 15 සහ 10 යොදන ලද ප්‍රතිකාරකවල වසර 7කට පසු පාංශු කැටිති සෑදීම ($P < 0.05$) සැලකිය යුතු ලෙස වැඩිදියුණු වී ඇති බවයි. කාබනික ද්‍රව්‍ය සහ ඛණිජ අංශු එකිනෙක හා බැඳීම මඟින් වැලි සහිත පසෙහි පාංශු කැටිති සෑදීම වර්ධනය කරන බව මෙයින් නිගමනය වේ. මේ මඟින් පොල් ගස් සඳහා හිතකර පරිසරයක් නිර්මාණය වනු ඇත.

වගුව 1. 2016 සිට 2022 දක්වා ප්‍රතිකාරක යෙදීමෙන් පසු පොල් ගස්වල අස්වැන්න (N=15).

ප්‍රතිකාරකය	පොල් ගෙඩි / ගසකට / අවුරුද්දකට						
	2016	2017	2018	2019	2020	2021	2022
කිලෝ ග්‍රෑම් 15 ක් ජීව අඟුරු වලදැමීම	64	41[a]	41	83[a]	69[a]	88	40
කිලෝ ග්‍රෑම් 10 ක් ජීව අඟුරු වලදැමීම	57	45[a]	38	71[b]	59[ab]	86	36
කිලෝ ග්‍රෑම් 5 ක් ජීව අඟුරු වලදැමීම	65	36[ab]	33	69[b]	55[b]	82	37
පොල් ලෙලි 200-250 ක් වලදැමීම	64	37[a]	35	62[b]	51[b]	74	36
පොහොර කවය වටා පොල් අතු වසුන් යෙදීම (පාලක ප්‍රතිකාරකය)	57	26[b]	32	62[b]	46[b]	71	27
P අගය	**0.48**	**0.09**	**0.58**	**0.04**	**0.07**	**0.21**	**0.42**
CV	**30**	**42**	**47**	**16**	**19**	**33**	**44**

එකම ඉංග්‍රීසි අක්ෂරය සඳහන් නොවන අගයන්ගේ මධ්‍යනය $P<0.05$ ට අඩු අගයකදී සැලකිය යුතු ලෙස වෙනසක් පෙන්වයි.




රූපය 2. ප්‍රතිකාරක යෙදීමෙන් වසර 7 කට පසු පාංශු කැටිතිවල මධ්‍යනය විෂ්කම්භය

පැළ පොල් වගාව සඳහා ජීව අඟුරු යොදා ගනිමින් තිරසාර තෙතමන සංරක්ෂණ ක්‍රමයක් සැලසුම් කිරීම

ශෂ්‍ය විද්‍යා අංශය

තෙතමන සංරක්ෂණ ක්‍රමයක් හදුන්වා දීම සහ පොල් පැළ සිටුවීමේදී පොල් පැළ සඳහා ජීව අඟුරු යෙදීමේ සුදුසුම ක්‍රමය අධ්‍යයනය කිරීම සඳහා මෙම පර්යේෂණය සිදු කරන ලදී. තෙතමනය හා පෝෂ්‍ය පදාර්ථ රඳවා ගැනීම සඳහා පොල්ලෙලි වෙනුවට ආදේශකයක් ලෙස පොල් පැළ සිටුවීමේදී ජීව අඟුරු කිලෝග්‍රෑම් 24ක ප්‍රමාණයක් (2% බර/බර) මේ සඳහා යොදා ගන්නා ලදී. මේ සඳහා අවශ්‍ය ජීව අඟුරු, ග්ලිරිසීඩියා දඬු කැබලි අවම ඔක්සිජන් සැපයුමක් යටතේ රත්මලාගාර පර්යේෂණ මධ්‍යස්ථානයේ නවීකරණය කරන ලද ද්විත්ව කුටීර පෝරණුවක් තුළ දහනය කිරීමෙන් සදාගන්නා ලදී. අත්හදා බලන ලද ප්‍රතිකාරක සැලැස්ම පහත දක්වා ඇත.

ජීව අඟුරු යෙදීමෙන් වසරකට පසු (2021) පොල් ලෙලි යොදන සහ ජීව අඟුරු යෙදූ වලවල් අතර සෙ.මී. 0 - 30 දක්වා පසෙහි, පාංශු තෙතමනයෙහි සැලකිය යුතු වෙනසක් දක්නට නොලැබිණි. කෙසේ නමුත් ප්‍රතිකාරක යෙදීමෙන් වසර දෙකකට පසු, පාංශු තෙතමන සංරක්ෂණය සඳහා කිසිවක් නොයෙදූ පාලක පර්යේෂණයට සාපේක්ෂව සම්පූර්ණ පාංශු පරිමාව සමඟ ජීව අඟුරු මිශ්‍ර කරන ලද ප්‍රතිකාරකවල පාංශු තෙතමන අන්තර්ගතයෙහි සැලකිය යුතු වැඩි වීමක් ($P < 0.1$) නිරීක්ෂණය විය. පොල් පැළ සිටුවන වළෙහි පතුලට කිලෝ ග්‍රෑම් 24 ක ජීව අඟුරු ස්ථරයක් යොදන ලද ප්‍රතිකාරකයෙහි සහ එම ජීව අඟුරු ප්‍රමාණයම සම්පූර්ණ පොල් වළෙහි පාංශු පරිමාව සමඟ මිශ්‍ර කරන ලද ප්‍රතිකාරකයෙහි පාංශු තෙතමන අන්තර්ගතය, අනෙක් ප්‍රතිකාරකවලට සාපේක්ෂව සංඛ්‍යාත්මකව වැඩි විය.



රූපය 3. විවිධ යෙදුම් සඳහා ප්‍රතිකාරක සැලැස්ම

වගුව 2. ප්‍රතිකාරක අතර සෙන්ටිමීටර් 0 - 30ත් අතර ගැඹුරක පාංශු තෙතමනය (N=15)

ප්‍රතිකාරක	සෙන්ටිමීටර් 0 - 30ත් අතර ගැඹුරක පාංශු තෙතමනය	
	2021	2022
පාලක ප්‍රතිකාරකය	5.03	2.61[b]
පොල් ලෙලි ස්ථරය	4.67	2.87[ab]
ජීව අඟුරු ස්ථරය	5.69	3.59[a]
ජීව අඟුරු ස්ථරය + පස් සමඟ ජීව අඟුරු	5.40	2.72[ab]
පස් සමඟ ජීව අඟුරු	5.86	3.65[a]
P අගය	**0.14**	**0.09**
CV	0.31	0.46

එකම ඉංග්‍රීසි අක්ෂරය සඳහන් නොවන අගයන්ගේ මධ්‍යයන්‍ය P<0.05 ට අඩු අගයකදී සැලකිය යුතු ලෙස වෙනසක් පෙන්වයි.

පැළ සිටුවීමෙන් වසරකට හා වසර දෙකකට පසුවද, මනින ලද වර්ධන පරාමිතීන් කෙරෙහි යොදන ලද ප්‍රතිකාරක වල සැලකිය යුතු බලපෑමක් දක්නට නොලැබිණි.

වගුව 3. ප්‍රතිකාරක අතර විවිධ වර්ධක පරාමිතීන්ගේ මධ්‍යයනය අගය (N=15)

ප්‍රතිකාරක	උස (සෙ.මී.)		කඳෙහි පරිධිය (සෙ.මී.)		හටගත් පත්‍ර සංඛ්‍යාව	
	2020	2021	2021	2022	2021	2022
පාලක ප්‍රතිකාරකය	167	237	24	50	1.7	4.7
පොල් ලෙලි ස්ථරය	150	209	20	39	1.9	4.6
ජීව අඟුරු ස්ථරය	157	195	20	47	1.8	4.5
ජීව අඟුරු ස්ථරය + පස් සමඟ ජීව අඟුරු	158	244	21	55	1.8	5.1
පස් සමඟ ජීව අඟුරු	169	214	22	36	2.1	5.2
P Value	**0.106**	**0.364**	**0.361**	**0.741**	**0.420**	**0.290**
CV	12	12	0.17	24	27	17

පැළ පොල් වගාවේ වර්ධනය සහ පාංශු තෙතමනය සංරක්ෂණය සඳහා නව වසුන් ද්‍රව්‍ය හඳුනා ගැනීම සහ ඇගයීම

ශෂ්‍ය විද්‍යා අංශය

සාමාන්‍යයෙන් පොල් වගා කරනු ලබන්නේ වැසි ජලය මත පදනම්ව ය. පොල් ගසෙහි වර්ධනය සහ අස්වැන්න හොඳින් පවත්වාගෙන යෑම සඳහා සඳහා අඛණ්ඩ ජල සැපයුමක් අවශ්‍ය වන බැවින් වියළි කාලවලදී පාංශු ජල සැපයුම දුර්වල වීම පොල් ගසේ පැවත්මට සහ ගෙඩි නිෂ්පාදනයට බලපාන තීරණාත්මක සාධකයකි. විවිධ ශාක ද්‍රව්‍ය යොදා ගනිමින් පොහොර කවය වසුන් කිරීම සහ පොල් ලෙලි වැළලීම පොල් ඉඩම්වල බහුලව භාවිතා වන පාංශු තෙතමන සංරක්ෂණ ක්‍රම වේ. වසුන් සඳහා යොදාගනු ලබන ද්‍රව්‍ය බොහොමයක් කෘෂිකාර්මික හා කාර්මික නිෂ්පාදනවල අමුද්‍රව්‍ය ලෙස

යොදා ගන්නා බැවින්, වසුන් යෙදීම සඳහා අවශ්‍ය වන ද්‍රව්‍ය හිඟ වෙමින් පවතී. එබැවින්, පාංශු තෙතමන සංරක්ෂණයට සහ පොල් පැළ වල වර්ධනය සඳහා වෙළඳපොළෙහි පවතින නවීකරණය කරන ලද පොලිතීන් වසුන් (Mulching film, Mulching mat) වල බලපෑම, සාම්ප්‍රදායික වසුන්වල බලපෑමට සාපේක්ෂව පරීක්ෂා කිරීම මෙම අධ්‍යයනය තුළින් සැලසුම් කරන ලදී.

මෙම අධ්‍යයනයේ දී විවිධ වසුන් ද්‍රව්‍ය යෙදීමෙන් වසරකට හා වසර දෙකකට පසුව (2021 හා 2022), වසුන් යොදන ලද පොහොර කවයන්හි පාංශු තෙතමනය මනින ලදී. පළමු වසරෙහි දී මතුපිට පස (සෙන්ටිමීටර 0-15) සහ . ගැඹුරු පසෙහි (සෙන්ටිමීටර 15-30) , විවිධ වසුන් යොදන ලද පොහොර කවයන්හි පාංශු තෙතමනයෙහි සැලකිය යුතු වෙනසක් දක්නට ලැබුණු නමුදු සෙන්ටිමීටර 30-45 ගැඹුරු පසෙහි පාංශු තෙතමනයේ එවැනි වෙනසක් දක්නට නොලැබිණි. ප්‍රතිකාර යෙදීමෙන් වසර දෙකකට පසුව, විවිධ වසුන් යොදන ලද පොහොර කවයන්හි සෙන්ටිමීටර 0-15, 15-30 සහ 30-45 යන ගැඹුරු පසෙහි පාංශු තෙතමනයෙහි වෙනසක් දක්නට නොලැබිණි.

වගුව 4. පොහොර කවයේ විවිධ පාංශු මට්ටම්වල තෙතමන අන්තර්ගතය මත විවිධ වසුන් ද්‍රව්‍ය වල බලපෑම

ප්‍රතිකාරක	තෙතමන ප්‍රතිශතය (වියළි බර මත පදනම්ව)					
	සෙන්ටිමීටර් 0 -15		සෙන්ටිමීටර් 15-30		සෙන්ටිමීටර් 30 -45	
	2021	2022	2021	2022	2021	2022
වසුන් නොයෙදූ	6.31^{ab}	2.74	6.85^{b}	2.83	5.89	2.71
පොල් අතු වසුන	7.22^{a}	2.7	8.07^{a}	3.49	7.55	3.24
පොල් ලෙලි වසුන	5.96^{ab}	2.94	7.32^{ab}	2.8	7.85	3.21
පොලිතින් පැදුර	6.35^{ab}	2.74	7.38^{ab}	3.31	8.35	3.61
පොලිතින් පටලය	5.57^{b}	3.19	7.25^{ab}	3.44	7.82	3.75
P අගය	**0.016**	**0.671**	**0.013**	**0.223**	**0.099**	**0.147**
CV	**23.76**	**27.17**	**14.55**	**26.37**	**27.29**	**28.54**

එකම ඉංග්‍රීසි අක්ෂරය සඳහන් නොවන අගයන්ගේ මධ්‍යයන්‍ය $P<0.05$ ට අඩු අගයකදී සැලකිය යුතු ලෙස වෙනසක් පෙන්වයි.

විවිධ වසුන් ද්‍රව්‍ය යොදන ලද පොහොර කවයන්හි පසෙහි කාබන් අන්තර්ගතය සැලකූ විට, ඒවායෙහි සැලකිය යුතු වෙනසක් දක්නට ලැබුනේ සෙන්ටිමීටර 0-15 ගැඹුරු පසෙහි පමණි. විවිධ වසුන් ද්‍රව්‍ය යොදන ලද ප්‍රතිකාරකවල මතුපිට පස්වල ක්ෂුද්‍රජීවී ක්‍රියාකාරීත්වයෙහි සැලකිය යුතු වෙනසක් නොපෙන්වූ අතර විකල්ප වසුන් ද්‍රව්‍ය භාවිතා කිරීමේ හැකියාව එමඟින් පෙන්නුම් කරයි.

වගුව 5. පොහොර කවයේ විවිධ පාංශු මට්ටම්වල කාබන් අන්තර්ගතය සහ මතුපිට පසෙහි ක්ෂුද්‍රජීවී ක්‍රියාකාරිත්වය මත විවිධ වසුන් ද්‍රව්‍යවල බලපෑම

ප්‍රතිකාරක	කාබන් ප්‍රතිශතය			ක්ෂුද්‍රජීවී ක්‍රියාකාරිත්වය ($\mu g\ CO_2\ g^{-1}day^{-1}$)
	සෙන්ටිමීටර් 0 -15	සෙන්ටිමීටර් 15-30	සෙන්ටිමීටර් 30 -45	
වසුන් නොයෙදූ	0.47^{ab}	0.38	0.39	43.02
පොල් අතු වසුන	0.50^{ab}	0.36	0.43	49.63
පොල් ලෙලි වසුන	0.44^{b}	0.36	0.32	47.6
පොලිතීන් පැදුර	0.62^{a}	0.39	0.54	47.44
පොලිතීන් පටලය	0.50^{ab}	0.44	0.41	46.6
P අගය	**0.045**	**0.552**	**0.519**	**0.94**
CV	**32.42**	**35.68**	**41.73**	**37.91**

එකම ඉංග්‍රීසි අක්ෂරය සඳහන් නොවන අගයන්ගේ මධ්‍යයන්‍ය $P<0.05$ ට අඩු අගයකදී සැලකිය යුතු ලෙස වෙනසක් පෙන්වයි.

ප්‍රතිකාරක යෙදීමෙන් වසරකට පසුව, විවිධ වසුන් ද්‍රව්‍ය යොදන ලද පොල් පැළ වල උසෙහි, කඳෙහි විට ප්‍රමාණයෙහි සහ අලුතෙන් හට ගන්නා කොළ සංඛ්‍යාවෙහි සැලකිය යුතු වෙනසක් දක්නට ලැබුණි. වසර දෙකකට පසු සැලකිය යුතු වෙනසක් දක්නට ලැබුණේ පොල් පැළවල උසෙහි සහ කඳෙහි විට ප්‍රමාණයන්හි මධ්‍යයනය අගයන් වල පමණි. වසර දෙකක් අවසානයේ පොල් පැළවල උස අනුපිළිවෙළින් පොලිතීන් පටලය > පොලිතීන් පැදුර > පොල් ලෙලි වසුන > පොල් අතු වසුන > වසුන් නොයෙදූ යන ආකාරයට අඩු වූ අතර, කඳෙහි පරිධිය අඩු වූයේ පොලිතීන් පටලය > පොලිතීන් පැදුර > පොල් ලෙලි වසුන > වසුන් නොයෙදූ > පොල් අතු වසුන යන ආකාරයටය.. ප්‍රතිකාරක යෙදීමෙන් වසර දෙකකට පසුව අලුතෙන් හටගන්නා ලද පත්‍ර සංඛ්‍යාව කෙරෙහි යොදන ලද වසුන්වල සැලකිය යුතු බලපෑමක් දක්නට නොලැබිණි.

වගුව 6. විවිධ ප්‍රතිකාරක යොදන ලද පැළයන්හි උස, කඳෙහි පරිධිය සහ අලුතෙන් ඇතිවූ පත්‍ර ගණන

ප්‍රතිකාරක	උස (සෙ.මී.)		කඳෙහි පරිධිය (සෙ.මී.)		හටගත් පත්‍ර සංඛ්‍යාව	
	2021	2022	2021	2022	2021	2022
වසුන් නොයෙදූ	167.05^{b}	332.74^{b}	42.60^{ab}	73.82^{b}	6.10^{ab}	5.98
පොල් අතු වසුන	175.21^{ab}	333.35^{b}	37.65^{b}	70.93^{b}	5.95^{ab}	5.80
පොල් ලෙලි වසුන	193.81^{ab}	361.88^{ab}	52.27^{a}	79.93^{ab}	5.57^{b}	5.64
පොලිතීන් පැදුර	203.52^{a}	366.97^{ab}	48.23^{a}	79.95^{ab}	6.63^{ab}	5.17
පොලිතීන් පටලය	201.16^{a}	401.44^{a}	52.00^{a}	87.24^{a}	7.12^{a}	4.99
P අගය	**0.001**	**0.016**	**0.001**	**0.008**	**0.022**	**0.075**
CV	**15.52**	**17.22**	**21.93**	**16.49**	**20.52**	**20.41**

එකම ඉංග්‍රීසි අක්ෂරය සඳහන් නොවන අගයන්ගේ මධ්‍යයන්‍ය $P<0.05$ ට අඩු අගයකදී සැලකිය යුතු ලෙස වෙනසක් පෙන්වයි.


පොටෑසියම් පොහොර ප්‍රභවයක් සහ පාංශු සත්කාරකයක් ලෙස තැඹිලි කෝම්බ භාවිතා කිරීම


ශෂ්‍ය විද්‍යා අංශය

නිසි කළමනාකාරිත්වයකින් තොරව තැඹිලි කෝම්බ ඉවත දැමීම පාරිසරික මෙන්ම සෞඛ්‍ය ගැටළු රාශියකට ද හේතුවී ඇත. තැඹිලි වතුර අපනයනය කිරීම සිදු කරන කර්මාන්තශාලා මඟින් සැලකිය යුතු ප්‍රමාණයක තැඹිලි කෝම්බ ප්‍රමාණයක් ඉවත් කරනු ලබන අතර, මේවාට වාණිජමය වශයෙන් ඇති වටිනාකම ඉතාමත් අඩු බැවින්, දැනට සිදු කෙරෙනුයේ මේවා පොල් ඉඩම්වල වල දැමීමයි. පහසුවෙන් ලබාගත හැකි මෙම ඝන අපද්‍රව්‍ය තිරසාර පාංශු සත්කාරයක් සහ පොහොරක් බවට පරිවර්තනය කළ හැකි නම් එය ඵලදායී සහ පරිසර හිතකාමී අපද්‍රව්‍ය කළමනාකරණයක් වනු ඇත.

කාබනික අපද්‍රව්‍ය නිසි ලෙස කළමනාකරණය කිරීමට හැකි කාර්යක්ෂම ක්‍රමයක් වනුයේ වම අපද්‍රව්‍ය භාවිතයෙන් ජීව අඟුරු නිපදවීමයි. මෙම පර්යේෂණය මඟින් අපේක්ෂා කරනුයේ නවීකරණය කරන ලද මධ්‍යම ප්‍රමාණයේ ස්වයංක්‍රීය ද්විත්ව කුටීර පෝරණුවක් මඟින්, අවම බාහිර යෙදුම් ප්‍රමාණයක් භාවිතයෙන් ජීව අඟුරු නිපදවීමයි. මෙම පර්යේෂණය දියත් කරනු ලබන්නේ ශ්‍රී ලංකා පොල් පර්යේෂණ ආයතනය සහ සිල්වර්මිල් සමාගම් සමූහය එක්වයි. මෙහි අභිප්‍රාය වනුයේ ඉවත දමන තැඹිලි කෝම්බ සාර්ථක ලෙස භාවිතා කිරීම මඟින් තිරසාර පාංශු සත්කාරකයන් නිපදවීමයි.

මෙහිදී, මූලිකවම ඉවත දමන ලද තැඹිලි කෝම්බවල තෙතමනය ඉවත්වී වියළී යෑමේ රටාව අධ්‍යයනය කරන ලදී. තැඹිලි කෝම්බ විවිධ ප්‍රමාණයන්ට කපා, ඒවා අව්වේ වේළන ලදී. මීට අමතරව අවම කම්කරු ශ්‍රමයකින් යුතුව ජීව අඟුරු නිපදවීමට වඩාත්ම සුදුසු කුමන ප්‍රමාණයේ තැඹිලි කෝම්බ කැබලිදැයි යන්න සොයා බලන ලදී. තැඹිලි කෝම්බයෙන් 1/8 ප්‍රමාණයක කැබලි සහ කුඩා තැඹිලි කෝම්බ කැබලි ඉක්මනින්ම වියළුණු අතර ඉන්පසු වියළුණු අනුපිළිවෙළ වූයේ 1/4 කැබලි, 1/2 කැබලි සහ මුළු කෝම්බය යන ආකාරයටයි. මෙම විවිධ ප්‍රමාණයේ කැබලි යාන්ත්‍රික විජලන යන්ත්‍රයක් තුළ 60 °C ක උෂ්ණත්වයේ පැය 24ක් තැබූ විට අපේක්ෂිත වියළි බව කරා ළඟා වන බව සොයාගන්නා ලදී.





රූපය 4. විවිධ ප්‍රමාණයන්ගේ තැඹිලි කෝම්බ කැබලිවල තෙතමනය ඉවත්වී යාමේ සීඝ්‍රතාව (a) අව්වේ වියැළීම සහ (b) විදුලි පෝරණුවක වියැළීම

තැඹිලි කෝම්බ අමුද්‍රව්‍යයක් ලෙස මෙන්ම ඉන්ධනයක් ලෙසද භාවිතා කරමින් ජීව අඟුරු සහ අළු නිපදවීමට කුඩා ද්විත්ව කුටීර පෝරණුවක් නිපදවන ලදී. මෙම පෝරණුවේ ක්‍රියාකාරිත්වය ඇගයීම සඳහා, තැඹිලි කෝම්බ 1/4 ක කැබලි අමුද්‍රව්‍ය ලෙසද, තැඹිලි කෝම්බ 1/2 කැබලි ඉන්ධන ලෙසද භාවිතා කරන ලදී. මෙහිදී බර අනුව අමුද්‍රව්‍ය ඉන්ධන අතර අනුපාතය 1:2 වන බව සොයාගන්නා ලදී.



රූපය 5. රත්මලාගාර පර්යේෂණ මධ්‍යස්ථානයේ ජීව අඟුරු නිෂ්පාදනය 5(a) කුඩා ද්විත්ව කුටීර පෝරණුව 5(b) අමුද්‍රව්‍ය ලෙස යොදා ගන්නා 1/4 තැඹිලි කෝම්බ කැබලි 5(c) නිපදවන ලද ජීව අඟුරු

තෙතමනය සහිත තැඹිලි කෝම්බවල බරට සාපේක්ෂව ජීව අඟුරු නිෂ්පාදනය 14 % ක් වූ අතර, අමුද්‍රව්‍ය ලෙස යොදා ගත් වියළන ලද තැඹිලි කෝම්බවල බරට සාපේක්ෂව ජීව අඟුරු නිෂ්පාදනය 40.2 % ක් විය. මීට අමතරව තෙතමනය සහිත තැඹිලි කෝම්බවල බරට හා වියළන ලද තැඹිලි කෝම්බවල බරට සාපේක්ෂව අළු නිෂ්පාදනයේ අනුපාත පිළිවෙළින් 7.1% ක් සහ 10.8 % ක් විය.

විවිධ වයස් කාණ්ඩවල සහ ප්‍රධාන ඉඩම් යෝග්‍යතා පන්තිවල පවතින පොල් ගස්වල භූගත කොටස්වල ඇති කාබන් ප්‍රමාණය ඇස්තමේන්තු කිරීම

ශෂ්‍ය විද්‍යා අංශය

දේශගුණික විපර්යාස යනු කෘෂිකර්මාන්තයේ ඵලදායීතාව කෙරෙහි සෘජුවම බලපාන එක් ප්‍රධාන සාධකයකි. එසේ වුවද කාලගුණික විපර්යාසයන්හි බලපෑම අවම කරගැනීමේ සැලකිය යුතු විභවයක් වැවිලි කර්මාන්තයට ඇත. බහුවාර්ෂික වැවිලි භෝග යක් වීම මඟින්, පොල් ගසට සාපේක්ෂව වැඩි වායුගෝලීය කාබන් ප්‍රමාණයක් රදවාගත හැකි අතර දශක 5කට 6කට ආසන්න කාලයක් වීම කාබන් ගසෙහි ගබඩාකර තබා ගත හැකිවේ. එබැවින් පොල් ගසට කාබන් රඳවා තබා ගැනීමට ඇති හැකියාව ගණනය කිරීමට අවශ්‍ය ආකෘතියක් නිර්මාණය කිරීම කාලෝචිත ක්‍රියාවක් ලෙස හදුන්වා දිය හැක. පොල් ගස කැපීමෙන් පසු ලබා ගන්නා සාම්පල ආශ්‍රයෙන් පොල් ගසෙහි ගබඩා කර ඇති කාබන් ප්‍රමාණය ගණනය කිරීම, මිල අධික මෙන්ම ප්‍රායෝගිකව අපහසු කාර්යයක් වේ.මෙම නිසා ගසෙහි උස සහ විෂ්කම්භය වැනි පහසුවෙන් මැනිය හැකි පරාමිතීන් ආශ්‍රයෙන් ශාකවල පෙව ස්කන්ධය පුරෝකථනය කිරීම සදහා විකල්ප ආකෘතීන් භාවිතා කෙරෙමින් පවතී.

මෙම පර්යේෂණයේ මූලික අරමුණ වනුයේ විවිධ වයස් කාණ්ඩවල සහ විවිධ ඉඩම් යෝග්‍යතා පන්තිවලට අදාළ පොල් ගස්වල මූල පද්ධතියෙහි ස්කන්ධය සහ එහි ගබඩා වී ඇති කාබන් ප්‍රමාණය නිර්ණය කිරීම මඟින්, පොල් ගස් වල භූගත කොටස් වල ඇති කාබන් ප්‍රමාණය ඇස්තමේන්තු කිරීමට සමීකරණයක් ගොඩ නැගීමයි. මෙහිදී, S1, S2, S4 සහ S5 යන පන්තිවලට අයත් අඹකැලේ බීජ උයනේ ඇති අවුරුදු 10, 20, 30, 40 සහ 50 යන වයස් කාණ්ඩවලට අයත් පොල් ගස් තෝරාගන්නා ලදී. සෑම පාංශු යෝග්‍යතා පන්තියක්ම සහ සෑම වයස් කාණ්ඩයක්ම නියෝජනය වන පරිදි ගස් 9 බැගින් තෝරාගෙන එක් එක් පොල් ගසෙහි මූල කලාපයෙන් 1/8ක ප්‍රමාණයක් කැණීම් කර එහි අඩංගු සියළුම මූල පද්ධතීන් නියැදි ලෙස ලබාගන්නා ලදී.



රූපය 6. අඹකැලේ බීජ උයනේ පොල් මුල් නියැදි ලබා ගැනීම සඳහා කැණීම් කිරීම




රූපය 7. පොල් ගසේ කඳෙහි පරිධිය මැනීම

තෝරාගන්නා ලද පොල් ගස්වල කඳේ විෂ්කම්භය, ගසේ උස, මුල්වල තෙත බර, මුල්වල වියළි බර, මුල්වල අන්තර්ගත කාබන් ප්‍රමාණයල පසෙහි භෞතික, රසායනික සහ ජෛව විද්‍යාත්මක පරාමිතීන් සහ අස්වැන්න වාර්තා කරන ලදී. අවුරුදු 10 සිට 50 දක්වා පොල් ගසෙහි පරිණතභාවය වැඩිවීමත් සමග මුල්වල අන්තර්ගතවී ඇති කාබන් ප්‍රමාණයද වැඩි වන බව නිරීක්ෂණය කරන ලදී. මේ අනුව පොල් ගස්වල උස, විෂ්කම්භය සහ වයස පදනම් කරගෙන ඒවායෙහි මුල්වල අන්තර්ගත (භූගත කොටසේ) කාබන් ප්‍රමාණය නිර්ණය කිරීමට පහත සමීකරණ ගොඩනගන ලදී.


$$\text{කාබන් අන්තර්ගතය} = 0.0067 \times \text{ගසේ උස} - 0.4837 \quad (R^2 = 0.8369)$$

$$\text{කාබන් අන්තර්ගතය} = 0.0074 \times \text{ගසේ උස} + 0.0035 \quad (R^2 = 0.9246)$$


මෙම සම්බන්ධතා දෙක සලකා බලමින් ඉහළ R^2 අගයකින් යුත් කාබන් අන්තර්ගතය සහ කඳෙහි විෂ්කම්භය අතර සම්බන්ධතාවය පදනම් කර ගනිමින් කාබන් අන්තර්ගතය නිර්ණය කිරීමට වඩාත්ම සුදුසු පරාමිතිය කඳෙහි විෂ්කම්භය බවට නිගමනය කරන ලදී.



රූපය 8. පොල් ගසෙහි වයස සමඟ භූගත කොටසේ කාබන් ප්‍රමාණයේ වෙනස්වීම



රූපය 9. කඳෙහි විෂ්කම්භය සමඟ භූගත කොටසේ කාබන් ප්‍රමාණයේ වෙනස්වීම



රූපය 10. ගසෙහි උස සමඟ භූගත කොටසේ කාබන් ප්‍රමාණයේ වෙනස්වීම

පරිණත පොල් ගස්වල ක්‍රියාකාරීත්වය කෙරෙහි ක්ෂුද්‍ර පෝෂක අඩංගු පොහොර මිශ්‍රණයක බලපෑම අධ්‍යයනය කිරීම

ශෂ්‍ය විද්‍යා අංශය

කාබනික සහ අකාබනික පොහොර ප්‍රභවයන් සැළකූ විට, පොල් ගස්වලට අත්‍යාවශ්‍ය මූලද්‍රව්‍ය ලබා දීම සඳහා පොල් ගස් සඳහා පොහොර යෙදීමේ දී බහුලව ම භාවිතා කරනු ලබන පොහොර ප්‍රභවය වන්නේ අකාබනික පොහොරයි. එසේ වුවද, වර්තමානයේ පොල් ඉඩම් සඳහා ක්ෂුද්‍ර පෝෂක යෙදීම පොල් වගාකරුවන් අතර ප්‍රචලිත වෙමින් පවතින අතර මේවා යෙදීම මඟින් තිරසාර සහ ස්ථාවර අස්වැන්නක් වගාකරුවන්ට හිමිවනු ඇත. ශාක වර්ධනයට සහ ශාකවල රෝග කෙරෙහි ඇති ප්‍රතිරෝධය වර්ධනය කිරීම සඳහා ක්ෂුද්‍ර පෝෂක අත්‍යවශ්‍ය බව සොයා ගෙන ඇති නමුත්, දැනට ශ්‍රී ලංකාව තුළ පොල් ගස් සඳහා ක්ෂුද්‍ර පෝෂක යෙදීම සඳහා නිර්දේශයක් තවම ලබා දී නැත.

ඉහත අධ්‍යයනයෙන් බලාපොරොත්තු වූයේ පරිණත පොල් ගස්වල අස්වැන්න කෙරෙහි වෙළඳපොළෙහි පවතින ක්ෂුද්‍ර පෝෂක අඩංගු පොහොර මිශ්‍රණයක බලපෑම සොයා බැලීමයි. මෙම පර්යේෂණය අඔකැලේ හුදකලා බීජ උද්‍යානයේ ස්ථාපනය කරනු ලැබූ අතර ක්ෂුද්‍ර පෝෂක අඩංගු පොහොර මිශ්‍රණයේ එකිනෙකට වෙනස් ප්‍රමාණයන් 4 ක්, පාලිත ප්‍රතිකාරකය සමඟ ඇගයීමට ලක් කරන ලදී. ප්‍රතිකාරක යෙදීමෙන් වසර දෙකකට පසුව වුවද, පොල් අස්වැන්න කෙරෙහි ඇගයීමට ලක් කරන ලද ප්‍රතිකාරකවල සැළකිය යුතු වෙනසක් ($P > 0.05$) දක්නට නොලැබිණි.

වගුව 7. ප්‍රතිකාරක යෙදීමෙන් වසරකට සහ දෙකකට පසුව අස්වැන්න (2021 සහ 2022)

ප්‍රතිකාරක	ඒ.පී.එම්	ඩොලමයිට්	ක්ෂුද්‍රපෝෂක අඩංගු පොහොර මිශ්‍රණය (ග්‍රෑම්/ගසකට)	2021 වාර්ෂික පොල් අස්වැන්න	2022 වාර්ෂික පොල් අස්වැන්න
1	පොල් පර්යේෂණ ආයතනයේ නිර්දේශයට අනුව යොදන ලදී		0	62.35	63.55
2			100	76.96	63.14
3			140	73.86	61.78
4			180	66.30	56.17
5			220	79.23	67.20
CV				**49.14**	**43.73**
SD				**35.23**	**27.22**
Sig				**0.442**	**0.764**

CV=Coefficient of variance, SD=Standard Deviation, Sig.=Significance

මීට අමතරව විවිධ ප්‍රතිකාරක යොදන ලද පොල් ගස්වල පොහොර කවයෙන් ලබාගන්නා ලද පස් සාම්පලවල යකඩ මූලද්‍රව්‍ය හැර අනෙකුත් ප්‍රධාන ශාක පෝෂක හෝ ක්ෂුද්‍ර පෝෂකවල සැලකිය යුතු වෙනසක් නොවීය. මීට අමතරව අස්වැන්න කෙරෙහි ක්ෂුද්‍ර පෝෂක අඩංගු පොහොර මිශ්‍රණයේ විවිධ ප්‍රමාණයන්ගේ බලපෑමක් ද නොමැති බව නිරීක්ෂණය විය. මෙම ක්ෂේත්‍රය දැනටමත් ආවරණ භෝගයන්ගෙන් සමන්විත බැවින්, පොල් ගස්වලට අවශ්‍ය ක්ෂුද්‍ර පෝෂක ප්‍රමාණයන් දැනටමත් සපුරා ඇති බව නිගමනය විය.

වගුව 8. ප්‍රතිකාරක යොදා වසර දෙකකට පසු මතුපිට පස්වල(0-15 cm) අත්‍යාවශ්‍ය සහ ක්ෂුද්‍ර පාංශු පෝෂක අන්තර්ගතය (2021 සහ 2022)

ප්‍රතිකාරක	P [%]	S [ppm]	Zn [ppm]	Cu [%]	B [ppm]	Mn [ppm]	Fe [%]	Mg [%]	Ca [%]	Na [%]	K [ppm]
T1	0.224	148	17	5.3	4.8	90	0.300	0.249	0.599	48.9	197
T2	0.243	145	20	5.3	3.4	79	0.232	0.325	0.768	41.6	145
T3	0.262	178	26	7.3	4.9	99	0.271	0.260	0.628	49.2	224
T4	0.199	138	29	8.1	2.4	75	0.196	0.183	0.475	40.8	135
T5	0.202	142	30	7.2	2.0	67	0.168	0.256	0.565	35.7	137
CV	0.30	0.30	0.70	0.71	0.58	0.34	0.32	0.47	0.45	0.31	0.40
Sig	0.68	0.61	0.76	0.92	0.08	0.64	0.03	0.68	0.72	0.54	0.18

P=පොස්පරස්, **S**=සල්ෆර්, **Zn**=සින්ක්, **Cu**=තඹ, **B**=බෝරෝන්, **Mn**=මැංගනීස්, **Fe**=යකඩ, **Mg** මැග්නීසියම්, **Ca**= කැල්සියම්, **Na**= සෝඩියම්, **K**= පොටෑසියම්, මිලියනයකට කොටස්

CV=Coefficient of variance, SD=Standard Deviation, Sig.=Significance

මෙම අධ්‍යයනය සිදු කරන ලද්දේ ඉහළ කාබනික ද්‍රව්‍ය ප්‍රමාණයක් අඩංගු වන S_1 ශ්‍රේණියේ ක්ෂේත්‍රයක වන බැවින්, ඉහළ කාබනික ද්‍රව්‍ය ප්‍රමාණයක් අඩංගු වන ක්ෂේත්‍රයන් සඳහා ක්ෂුද්‍ර පෝෂක යෙදීම අත්‍යවශ්‍ය නොවන බව අවසාන නිගමනය විය.


පරිණත පොල් ගස් සඳහා ජීව අඟුරුවලින් සමන්විත පොහොර ගඩොලක් නිර්මාණය කිරීම

ශෂ්‍ය විද්‍යා අංශය

ජීව අඟුරු යනු පසෙහි සාරවත් බව වැඩි කිරීමට සහ පාංශු පෝෂක සහ පාංශු තෙතමනය රඳවාගැනීමට කෘෂිකර්මාන්තයේ දී යොදනු ලබන පාංශු සත්කාරකයකි. මෙය ඔක්සිජන් අවම හෝ නොමැති තත්ත්ව යටතේ ඉහළ උෂ්ණත්වයකදී භාවිතයෙන් නිෂ්පාදනය කරනු ලබන කාබනික ද්‍රව්‍යයකි.

පරිණත පොල් ගසක වර්ධනය සහ ඵලදායිතාවය ඉහළ නැංවීම සඳහා අවම වශයෙන් ජීව අඟුරු කිලෝග්‍රෑම් 30 ක ප්‍රමාණයක් අවශ්‍ය වේ. මෙම කිලෝග්‍රෑම් 30 ක ජීව අඟුරු ප්‍රමාණය පරිමාවෙන් ඉතා විශාල වන අතර, එම ප්‍රමාණය පොහොර කවයේ ඇති මතුපිට පස් සමග මිශ්‍ර කිරීම ප්‍රායෝගිකව අපහසු කාර්යයක් වන අතර මේවා ප්‍රමාණයෙන් කුඩා වන බැවින් ජලය සමඟ සෝදාගෙන යාමේ හැකියාවක් ඇත.

එමෙන්ම එම ජීව අඟුරුවල පරිමාව අඩු කිරීම සඳහා කුඩා අංශු වලට පරිවර්තනය කළ විට එමඟින් සෞඛ්‍ය ගැටළු ඇතිවීමට හැකියාව ඇති අතර පහසුවෙන් සුළඟ මඟින් හානියට ලක් වේ. මෙම ජීව අඟුරු ප්‍රමාණය වසරකට නිර්දේශිත පොහොර ප්‍රමාණය සමඟ එක්කර ගඩොලක් නිර්මාණය කර පොල් ගසට යෙදීම මඟින් පොහොර යෙදීම සඳහා අවශ්‍ය වන කම්කරු ශ්‍රමය අවම කර ගත හැකි අතර, පොල් ගසට සහ පරිසරයටද ප්‍රතිලාභ රැසක් හිමි වේ. එබැවින් මෙම පර්යේෂණය ආරම්භ කිරීමේ අරමුණ වනුයේ ජීව අඟුරුවලින් සමන්විත පොහොර ගඩොලක් නිර්මාණය කිරීමයි.



රූපය 11. ජීව අඟුරු වලින් සමන්විත පොහොර ගඩොල

මේ සඳහා නිපදවන ලද ජීව අඟුරුවල අඩංගු නයිට්‍රජන්, පොස්ෆරස් සහ පොටෑසියම් ප්‍රමාණයන් මූලිකව නිර්ණය කරන ලදී. අනතුරුව තෝරාගන්නා ලද වෙනස් බැදුම්කාරකයන් 4ක් භාවිතා කර ඝන සෙන්ටිමීටර 17×17×6 පරිමාවෙන් යුත් ගඩොලක් නිර්මාණය කරන ලදී. මෙසේ නිර්මාණය කරන ලද ගඩොලෙහි ඝනත්වය ඝන සෙන්ටිමීටරයට ග්‍රෑම් 0.300-0.350 ත් අතර විය. සාදන ලද ගඩොලෙහි ශක්තිය මත පදනම්ව බැඳුම්කාරක 4න් 2ක් තෝරාගත් අතර, පර්යේෂණයේ ඉදිරි කටයුතු තෝරාගත් බැඳුම්කාරක සහ ජීව අඟුරු භාවිතයෙන් සිදුකිරීමට නියමිතය.

වගුව 9. පොහොර ගඩොල් මිශ්‍රණයේ අඩංගු නයිට්‍රජන්, පොස්ෆරස් සහ පොටෑසියම් ප්‍රමාණයන්

	නයිට්‍රජන් %	පොස්ෆරස් %	පොටෑසියම්%
ජීව අඟුරු	1.05	0.03	1.51
ගඩොල් මිශ්‍රණය	1.33	0.03	0.75

පොල් යටතේ ඉහළ වටිනාකමක් ඇති දුම්මල භෝග/රෙසින භෝග වල වර්ධනය ඇගයීම

ශෂ්‍ය විද්‍යා අංශය

පොල් ආශ්‍රිත කෘෂි වන වගා මඟින් සම්පත් භාවිතය සහ ඉඩමේ ඵලදායිතාවය වැඩි දියුණු කරන අතර, ඒකක භූමි ප්‍රමාණයකට ලැබෙන්නා වූ ආදායමද ඉහළ නංවයි. පොල් ඉඩම්වල අතුරු භෝග වගා කිරීමේදී වැඩිපුරම අවධානය යොමු කළ යුත්තේ එහි ඵලදායිතාවය ඉහළ නංවා ගැනීම මෙන්ම අතුරු භෝග වගාව මඟින් පොල් වගාවට සිදුවිය හැකි අහිතකර බලපෑම් අවම කර ගැනීමයි. අවුරුදු 25ට වැඩි පොල් වගාවන් යටතේ හෝ පරිණත පොල් ඉඩම්වල ඇති පුරප්පාඩු සහිත ඉඩෙහි අඩු ඝනත්වයකින් යුක්තව ඉහළ වටිනාකමකින් යුත් දුම්මල බෝග වගා කල හැක. ස්වාභාවික දුම්මල ශාක සඳහා ජාත්‍යන්තර ඉල්ලුම වැඩි වෙමින් පවතින අතර, එහි ප්‍රතිඵලයක් ලෙස පසුගිය දශකය තුළ මේවායෙහි නිෂ්පාදනයන් සඳහා නීති විරෝධී වෙළඳාම් කටයුතුද සිදු විය. මෙම ශාකය ඉහළ මිළකින් යුක්ත වන අතර සුවඳ විළවුන්, සුවඳ දුම් සහ ඖෂධ වැනි දෑ නිෂ්පාදනය සඳහා යොදාගනු ලබයි.


තෝරාගන්නා ලද දුම්මල භෝග තුනක්: සුදු සඳුන්, වල්ලපට්ට සහ රත් සඳුන් පොල්

යටතේ වගා කළ විට ඒවාගේ වර්ධනය ඇගයීම සඳහා පර්යේෂණයක් මාකඳුර පර්යේෂණ මධ්‍යස්ථානයේ ස්ථාපනය කරන ලදී. එම ශාක පොල් යටතේ මීටර් 4 x 4 පරතරයක් සහිතව සිටුවා ඇත.




රූපය 12. දුම්මල හෝග වල වර්ධන පරාමිතීන් මැනීම

ශාකයේ උස සහ බිම් මට්ටමේදී කඳෙහි විෂ්කම්භය යන වර්ධන පරාමිතීන් පදනම් කර ගනිමින් පොල් යටතේ වගා කළ විට මෙම භෝගයන්හි ආර්ථික වටිනාකම සහ ආයු කාලය පුරෝකථනය කළ හැක. 2018 වර්ෂයේ සිට 2021 දක්වා ලබාගෙන ඇති වර්ධන පරාමිතීන් පදනම් කරගෙන,ආර්ථික වටිනාකමක් ලබා ගැනීමට සුදු හඳුන්, වල්ල පට්ට සහ රත් සඳුන් වලට පිළිවෙළින් අවුරුදු 16ක් 12ක් සහ 7ක් ගත වන බව නිර්ණය කරන ලදී. තවද බිම් මට්ටමේදී කදෙහි විෂ්කම්භය සලකා බැලීමේදී සුදු සඳුන් වසර 14කින් ද, වල්ලපට්ට සහ රත් සඳුන් වසර 8 කින්ද, ආර්ථික වටිනාකමක් දෙන බව ගණනය කරන ලදී.



රූපය 13. 2018 සිට 2021 දක්වා ගස්වල උසෙහි වැඩි වීම



රූපය 14. 2018 සිට 2021 දක්වා කළෙහි විෂ්කම්භයේ වැඩි වීම

ගිනි තෘණ (*Panicum maximum*) හි විකල්ප භාවිතයන් අධ්‍යයනය කිරීම

ශෂ්‍ය විද්‍යා අංශය

ගිනි තෘණ 1820 දශකයේදී පමණ ශ්‍රී ලංකාවට සත්ත්ව අහාරයක් ලෙස හඳුන්වා දී ඇති අතර, මෙය පසුගිය දශක කිහිපය තුළ මෙරට පරිසර පද්ධතිවල ස්වභාවීකරණය වී ඇත. වර්තමානයේ මෙය, ආක්‍රමණශීලී ගැටළුකාරී වල් පැළෑටියක් ලෙස සැළකේ. මේ වන විට ගිනි තෘණ, බොහෝ පොල් වගාවන් ආක්‍රමණය කර, ඒවායෙහි දෛනික ක්‍රියාවන්ට බාධා ඇති කරමින්, නිෂ්පාදන පිරිවැය වැඩි කරනු ලබයි.

කෙසේ වෙතත් මෙය බොහෝ රටවල වටිනා සත්ත්ව ආහාරයක් ලෙසත්, කාබනික පොහොර නිෂ්පාදනයේ ප්‍රධාන අමුද්‍රව්‍යයක් ලෙසත් යොදාගන්නා බැවින්, ගිනි තෘණ කොම්පෝස්ට්, පණු පොහොර සහ සත්ත්ව ආහාර නිෂ්පාදනය කිරීම සඳහා අමුද්‍රව්‍යයක් ලෙස යොදා ගැනීමට ඇති හැකියාව ඇගයීම සඳහා මෙම අධ්‍යයනය සිදු කරන ලදී. එමෙන්ම විවිධ අස්වනු කාල සීමාවන් වල, ගිනි තෘණවල පෝෂක සංයුතිය නිර්ණය කිරීමද සිදු කරන ලදී.

ගිණි තෘණ පරිණත වීමත් සමඟ ඒවායෙහි පත්‍රවල අඩංගු පෝෂක ප්‍රමාණයන්ගේ වෙනස් වීම අවබෝධ කර ගැනීම සඳහා විවිධ අස්වනු කාලසීමාවන්වලදී පත්‍රවල පෝෂක සංයුතිය නිර්ණය කරන ලදී. මෙහිදී පෙනී ගියේ ඇගයීමට ලක් කරන ලද සියලුම පෝෂක පරාමිතීන් වන නයිට්‍රජන්, පොස්ෆරස්, පොටෑසියම්, කැල්සියම් සහ මැග්නීසියම් යන පෝෂක ශාකයේ පරිණතභාවය සමඟ අඩුවී යන බවයි.

වගුව 10. විවිධ අස්වනු කාල සීමාවන් වලදී පත්‍ර වල පෝෂක සංයුතිය

අස්වනු කාල සීමාව (සති)	පත්‍ර වල පෝෂක සංයුතිය (වියළි බර මත පදනම්ව)				
	නයිට්‍රජන් %	පොස්ෆරස් %	පොටෑසියම් %	කැල්සියම් %	මැග්නීසියම් %
4	1.49^{a}	0.29^{a}	3.16^{a}	0.571^{a}	0.451^{a}
6	1.16^{b}	0.27^{a}	2.52^{b}	0.558^{a}	0.388^{ab}
8	1.09^{bc}	0.25^{abc}	2.20^{bc}	0.478^{ab}	0.368^{bc}
10	0.99^{c}	0.21^{bc}	2.12^{bc}	0.433^{ab}	0.343^{bc}
12	0.71^{d}	0.19^{c}	1.91^{c}	0.429^{b}	0.322^{c}
P අගය	**<0.000**	**<0.000**	**<0.000**	**0.006**	**<0.000**
CV	**28.92**	**43.18**	**27.51**	**23.09**	**18.04**

එකම ඉංග්‍රීසි අක්ෂරය සදහන් නොවන අගයන්ගේ මධ්‍යයන්‍ය $P<0.05$ ට අඩු අගයකදී සැලකිය යුතු ලෙස වෙනසක් පෙන්වයි.

ගිණි තෘණ පත්‍රවල වැඩිම ප්‍රතිශතයකින් අඩංගු වන පෝෂක ද්‍රව්‍යය පොටෑසියම් වන බැවින් පොල් වගාවන් සඳහා කාබනික පොහොර නිෂ්පාදනය කිරීමට අමුද්‍රව්‍යයක් ලෙස මෙන්ම කොළ පොහොරක් ලෙසද මෙය භාවිතා කළ හැක. කෙසේ වෙතත්, ගිණි තෘණ කොළ පොහොරක් ලෙස යෙදූ විට ඒවායෙහි දිරාපත් වීමේ රටාව සහ පාංශු ගුණාංග කෙරෙහි ඒවායේ බලපෑම සොයා බැලීමට වැඩිදුර අධ්‍යයනයක් කිරීම අවශ්‍ය වේ.

පත්‍රවල අඩංගු පෝෂක සංයුතියේ දත්ත පදනම් කරගනිමින් සහ නිර්දේශිත මාර්ගෝපදේශ අනුගමනය කරමින් ගිණි තෘණ භාවිතයෙන් කොම්පෝස්ට් සහ පණු පොහොර නිෂ්පාදනය කරන ලදී. මෙහිදී 70% -75 % තෙතමනය සහිත ගිණි තෘණ 80% - 90 % තෙතමනය සහිත ගොම සමඟ බර අනුව 1:3 අනුපාතයකින් මිශ්‍ර කරන ලදී. සියලුම සාම්පල දිරාපත් වීම සඳහා සති 10ක කාලසීමාවකට නිරාවරණය කරන ලද අතර ඉන්පසු සෑදී ඇති කොම්පෝස්ට් හා පණු පොහොර ලබාගන්නා ලදී.

විවිධ අස්වනු කාලසීමාවන්වලදී නෙළා ගන්නා ලද ගිණිතෘණ භාවිතයෙන් නිපදවූ කොම්පෝස්ට්වල නයිට්‍රජන්, පොටෑසියම්, කාබන් සහ කාබන්:නයිට්‍රජන් අනුපාතයේ මධ්‍යයන අගයන්වල සැලකිය යුතු වෙනසක් දක්නට නොලැබිණි. නමුත් විවිධ අස්වනු කාලසීමාවන්වල ගිණිතෘණවලින් නිපදවූ කොම්පෝස්ට්වල පොස්ෆරස් අන්තර්ගතයේ මධ්‍යයන අගය සැලකිය යුතු ලෙස වෙනස් වූ අතර එහි වැඩිම අගය පෙන්වනු ලැබුවේ සති 10ක වර්ධන අවධියේදී නෙළන ලද ගිණි තෘණ භාවිතයෙන් නිපදවූ කොම්පෝස්ට්වලය. වැඩිම නිෂ්පාදන කාර්යක්ෂමතාවයක් වාර්තා වූයේ, සති 6ක් වයසැති ගිණිතෘණ වලින් නිපදවූ කොම්පෝස්ට්වලය. මනින ලද සියලුම පෝෂක පරාමිතීන් ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය මගින් නිර්දේශ කර ඇති අවම අවශ්‍යතා සපුරා තිබූ අතර ගිණිතෘණ මල් පිපීමට පෙර ඕනෑම වර්ධන අවධියකදී කොම්පෝස්ට් නිෂ්පාදනය සඳහා අමුද්‍රව්‍යයක් ලෙස භාවිතා කිරීමට නිර්දේශ කළ හැකිය.

වගුව 11. නිෂ්පාදනය කරන ලද කොම්පෝස්ට්වල පෝෂක අන්තර්ගතය සහ නිෂ්පාදන කාර්යක්ෂමතාව

අස්වනු කාල සීමාව (සති)	නයිට්‍රජන් %	පොස්ෆරස් %	පොටෑසියම් %	කාබන් %	කාබන් : නයිට්‍රජන් අනුපාතය	නිෂ්පාදන කාර්යක්ෂමතාව %
4	1.99	0.53^{b}	2.35	20.49	10.36	14.75^{c}
6	1.82	0.63^{ab}	2.53	22.55	12.77	22.28^{a}
8	2.30	0.42^{b}	2.28	22.99	10.82	19.09^{ab}
10	1.98	0.80^{a}	2.47	23.33	11.78	16.81^{bc}
12	1.62	0.63^{ab}	1.83	23.79	14.89	13.15^{c}
P අගය	0.181	0.006	0.148	0.624	0.336	<0.001
CV	19.34	27.38	16.90	13.34	25.45	21.09
ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ නිර්දේශය						
	1.00	0.22	0.83	20.00	10-25	

එකම ඉංග්‍රීසි අක්ෂරය සඳහන් නොවන අගයන්ගේ මධ්‍යයන්‍ය $P<0.05$ ට අඩු අගයකදී සැලකිය යුතු ලෙස වෙනසක් පෙන්වයි.

විවිධ අස්වනු කාලසීමාවන්වලදී නෙළන ලද ගිණිතෘණ සතත්ව ආහාර ලෙස භාවිතා කිරීමට ඇති සාක්ෂතාව පරීක්ෂා කිරීම සඳහා ඒවායෙහි දළ ප්‍රෝටීන, දළ තන්තු සහ අළු අන්තර්ගතයන් විශ්ලේෂණය කරන ලදී. මීට අමතරව එක් එක් වර්ධන අවධි සඳහා ගිණිතෘණ වල වියළි ද්‍රව්‍ය අස්වැන්න ගණනය කරන ලදී. ගිණිතෘණ පරිණත වීමත් සමඟ දළ ප්‍රෝටීන, දළ තන්තු හා අළු අන්තර්ගතය සැලකිය යුතු ලෙස අඩුවූ අතර ඊට වියළි ද්‍රව්‍ය අස්වැන්න සැලකිය යුතු ලෙස වැඩි විය. සත්ත්ව ආහාරයක් ලෙස භාවිතා කිරීම සඳහා ගිණිතෘණ නෙලා ගත යුතු සුදුසු වර්ධන අවධිය දර්ශකයක් පදනම් කරගෙන සොයා ගන්නා ලදී. මේ අනුව සත්ත්ව ආහාරයක් ලෙස භාවිතා කිරීම සඳහා සති 8ක වර්ධන අවධිය නිර්දේශ කළ හැක.

වගුව 12. විවිධ අස්වනු කාලසීමාවන් වලදී නෙළන ලද ගිණිතෘණ හි වියළි ද්‍රව්‍ය අස්වැන්න, දළ ප්‍රෝටීන, දළ තන්තු සහ අළු අන්තර්ගතය

අස්වනු කාල සීමාව (සති)	වියළි ද්‍රව්‍ය අස්වැන්න (හෙක්ටයාරයකට මෙට්‍රික් ටොන්)	දළ ප්‍රෝටීන %	දළ තන්තු %	අළු %	දර්ශකය
4	0.84^{b}	9.32^{a}	36.39^{c}	9.40a	2.00
6	1.01^{b}	7.28^{b}	38.40^{b}	9.28a	2.06
8	**1.52^{ab}**	**6.82^{bc}**	**38.62^{ab}**	**8.03^{ab}**	**2.16**
10	1.80^{a}	6.22^{c}	38.38^{b}	7.76b	2.09
12	1.89^{a}	4.53^{d}	39.63^{a}	7.32b	2.00
P අගය	<0.001	<0.001	<0.001	0.003	
CV	52.53	27.86	5.44	11.74	

එකම ඉංග්‍රීසි අක්ෂරය සඳහන් නොවන අගයන්ගේ මධ්‍යයන්‍ය $P<0.05$ ට අඩු අගයකදී සැලකිය යුතු ලෙස වෙනසක් පෙන්වයි.

විවිධ පොහොර වර්ග භාවිතය මගින් පොල් වගාකරන පසෙහි බැරලෝහ එකතුවීම අධ්‍යයනය

පාංශු හා ශාක පෝෂණ අංශය

කාබනික පොහොර පසෙහි රසායනික, භෞතික හා ජීව විද්‍යාත්මක ගුණාංග වැඩිදියුණු කරන අතරම ශාකයකට අවශ්‍ය පෝෂක පදාර්ථ ලබා දෙන වැදගත් ප්‍රභවයක් ලෙස හැඳින්විය හැක. එබැවින් අකාබනික පොහොර සමග සසඳන විට කාබනික පොහොර පරිසර හිතකාමී ලෙස සැලකේ. කෙසේවෙතත්, කාබනික පොහොර අඛණ්ඩව යෙදීම මගින් බැරලෝහ, ක්ෂුද්‍ර ප්ලාස්ටික් හා ප්‍රතිජීවක යනාදී අපද්‍රව්‍ය පසට එක් වීම මගින් පාංශු ක්ෂුද්‍ර ජීවීන්ට බලපෑම් ඇති කරන අතරම, මෙම අපද්‍රව්‍ය ශාක මගින් අවශෝෂණය කිරීම හේතුවෙන් ආහාර දාම කෙරෙහි අහිතකර බලපෑම් ඇතිවේ. එබැවින් විවිධ පොහොර වර්ග සහ ඒවා භාවිතා වන කාලය පසෙහි බැරලෝහ ප්‍රමාණය කෙරෙහි ඇතිවන බලපෑම අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ අරමුණ විය.

කුරුණෑගල දිස්ත්‍රික්කයේ වසර 10 කට වඩා වැඩි කාලයක් කාබනික පොහොර (ගොම පොහොර, එළු පොහොර සහ කුකුල් පොහොර) යෙදීමේ ඉතිහාසයක් ඇති පොල් වතු 9කින් ලබාගත් මතුපිට පස් සාම්පලවලල As, Cd, Pb, Ni හා Cr යන බැරලෝහ පිළිවෙලින් 0.12 - 1.07, 0.01 - 0.07, 1.25 - 3.45, 0.25 - 1.16 සහ 0.04 - 0.11 mg/kg යන ප්‍රමාණවලින් පවතින බවත් ,මෙම පාංශු සාම්පල අතරින් කිසිවක් යුරෝපීය සංගමය විසින් පනවා ඇති කෘෂිකාර්මික පස සඳහා නිර්දේශිත බැරලෝහ ප්‍රමාණයන් ඉක්මවා නොමැති බවත් සොයා ගන්නා ලදී.

පොල් වගාවල පවතින ජල සම්පාදන පද්ධති හරහා ජලයේ දියකර (Fertigation) සාමාන්‍ය මියුරියේට් ඔෆ් පොටෑෂ් (MOP) පොහොර ලෙස යෙදීම

පාංශු හා ශාක පෝෂණ අංශය

හොඳ පොල් ඵලදාවක් සඳහා ජලය සහ පෝෂක ද්‍රව්‍ය අත්‍යවශ්‍ය වේ. ජල සම්පාදන පද්ධති හරහා පොහොර යෙදීම දැනට පවතින ක්‍රමයකි (Fertigation). මෙම ක්‍රමය භාවිතයේදී පොහොර කොටස් වශයෙන් කිහිපවතාවකදී යෙදීමේ හැකියාව නිසා පෝෂක භාවිතයේ කාර්යක්ෂමතාවය (Nutrient Use Efficiency) සම්ප්‍රදායික පොහොර යෙදීමේ ක්‍රමයට සාපේක්ෂව වඩාත් ඉහළ බව විවිධ භෝග සමග සිදුකරන ලද පරීක්ෂණවලදී අනාවරණය වී ඇත.

ශ්‍රී ලංකාවේ බොහෝමයක් පොල් වගාකරුවන් සම්පූර්ණයෙන්ම ජලයේ දියවන පොටෑසියම් අඩංගු පොහොර සොයා ගැනීමේ අපහසුතාවය සහ අධික මිල නිසා සාමාන්‍ය මියුරියේට් ඔෆ් පොටෑෂ් (MOP) විවිධ ආකාරයට ජලයේ දිය කිරීමෙන් අනතුරුව ජල සම්පාදන පද්ධති හරහා යෙදීම සිදුකරයි. මෙම මියුරියේට් ඔෆ් පොටෑෂ් ජලයේ සම්පූර්ණයෙන් දිය නොවන නිසා ශාකයේ පෝෂණ අවශ්‍යතාවයෙන් කොටසක් ලැබීම හෝ අවශ්‍ය ප්‍රමාණයට වඩා වැඩිපුර ලැබීම සිදුවිය හැක. එම නිසා මියුරියේට් ඔෆ් පොටෑෂ් සමග ජලය මිශ්‍ර කළ යුතු අනුපාතය, දිය කිරීමට පෙර ජලයේ පොඟවා තැබිය යුතු කාලය සහ ජලයේ දියවන උපරිම මියුරියේට් ඔෆ් පොටෑෂ් ප්‍රමාණය සෙවීම සඳහා රසායනාගාර පරීක්ෂණයක් සිදු කරන ලදී. මෙහිදී 1:2, 1:3, 1:4 සහ 1:5 යන පොහොර බර : ජල පරිමා අනුපාත සහ පැය

1, 2, 3 සහ 12 යන පෙඟවුම් කාල භාවිතා කරන ලදී.

පරීක්ෂණයේ ප්‍රථිඵල අනුව විවිධ පොහොර බර: ජල පරිමාව යෙදීමෙන් සිදුවන ද්‍රාව්‍යතාව අතර සංඛ්‍යාත්මක වශයෙන් සැලකිය යුතු වෙනසක් ($P < 0.02$) දක්නට ලැබුණු අතර 1:4 මිශ්‍රණ අනුපාතයේදී 98.04% ක (බර/බර) ද්‍රාව්‍යතාවයක් සමග ඉහළම ද්‍රාව්‍යතා අගය පෙන්නුම් කරන ලදී. එමෙන්ම පොඟවන කාල අනුව ද්‍රාව්‍යතාව සංඛ්‍යාත්මකව සැලකිය යුතු ($P < 0.02$) වෙනසක් දක්නට ලැබුණු අතර පැය 1 ක කාලයක් පෙඟවීම ප්‍රමාණවත් බව හදුනා ගන්නා ලදී (ද්‍රාව්‍යතාවය 93.45%).



රූපය 15. ජල සම්පාදන පද්ධති හරහා MOP යෙදීම



පොල් නිෂ්පාදනය කෙරෙහි දේශගුණික විපර්යාස වල බලපෑම

බීජ පොල් පැළ නැවත සිටුවීමේදී ඇතිවන ජල ආතතිය අඩු කිරීමට යෙදිය හැකි ප්‍රතිඋත්ස්වේදකාරක (Antitranspirants) පිළිබඳ මූලික අධ්‍යයනය

ශාක කායික විද්‍යා අංශය

මුල් අවධියේ බීජ පොල් පැළවල පත්‍ර මත ප්‍රතිඋත්ස්වේදකාරක යෙදීම මඟින් උත්ස්වේදනය පාලනය කිරීමත් එමඟින් ප්‍රමාණවත් තරම් ජලය ප්‍රමාණයක් ශාකයේ රඳවා ගැනීමටත් හැකි වේ. මෙලෙස අහිතකර කාලගුණ තත්ත්වයන්ට ඔරොත්තු දීමට ප්‍රතිඋත්ස්වේදකාරක යෙදීම අප රටේ චිතරම් ප්‍රචලිත නොවේ. එම නිසා බීජ පොල් පැළ නැවත සිටුවීමෙන් පසු මුල් කාලයේදී ඇතිවන නියං කාලවලදී උත්ස්වේදනය අඩු කර පොල් පැළයේ පිවී බව ආරක්ෂා කර ගැනීම සඳහා යෙදිය හැකි ප්‍රතිඋත්ස්වේදකාරක පිළිබඳ සොයා බැලීමේ අරමුණින් මෙම පරීක්ෂණය සැලසුම් කරන ලදී. මේ සඳහා ප්‍රතිඋත්ස්වේදකාරක හතරක් (Kaolin, $CaCO_3$, $MgCO_3$ සහ MOP) යොදාගන්නා ලද අතර මාස 07ක් වයසැති TT සහ DT ප්‍රභේදවල තවාන් පැළ සඳහා පර්යේෂණය සිදු කරන ලදී.


3%(බර/පරිමාව),5% (බර/පරිමාව),7% (බර/පරිමාව) ලෙස සාන්ද්‍රණ තුනකින් ප්‍රතිඋත්ස්වේදකාරක යොදන ලදී. උත්ස්වේදන සීඝ්‍රතාව, පත්‍ර උෂ්ණත්වය, පත්‍ර සීනි හා පිෂ්ඨය ප්‍රමාණය, හරිතප්‍රද ප්‍රමාණය සහ වර්ධක මිනුම සෑම දින පහකටම වරක් මනින ලදී. වර්ධක මිනුම, පත්‍ර පිෂ්ඨය, සීනි ප්‍රමාණය සහ හරිතප්‍රද ප්‍රමාණය යන පරාමිතීන්ට අනුව ප්‍රතිඋත්ස්වේදකාරක වර්ග අතර සැලකිය යුතු වෙනසක් නොපෙන්වූ අතර පත්‍ර උෂ්ණත්වයේ සහ උත්ස්වේදනයේ ප්‍රතිඋත්ස්වේදකාරක නොයෙදූ ඒවා සමග සැලකිය යුතු වෙනසක් පෙන්විය. නමුත් එක් එක් ප්‍රතිඋත්ස්වේදකාරකයේ සාන්ද්‍රණය අතර සැලකිය යුතු වෙනසක් නොතිබිණි. එම නිසා වෙනත් පරාමිතීන්ද යොදා ගනිමින් තවදුරටත් මෙම පරීක්ෂණය තෝරාගත් ප්‍රතිඋත්ස්වේදකාරක 2ක් (Kaolin සහ $CaCO_3$) සහ අඩුම සාන්ද්‍රණය 3% යොදාගනිමින් ජල ආතති තත්ත්වය යටතේ සැලසුම් කර ඇත.

පොල් වැලදාව වෙනස් වීම කෙරෙහි කාලගුණික සාධක වල බලපෑම


ශාක කායික විද්‍යා අංශය

සියලුම පොල් වගා කරන දිස්ත්‍රික්කවල පොල් වතු 900කට වැඩි ප්‍රමාණයකින් රැස් කර ගන්නා ලද වැලදා දත්ත මත පදනම්ව 2022 වසර සඳහා වාර්ෂික ජාතික පොල් වැලදාව ඇස්තමේන්තු කර ඇත. 2022 වසරේදී ජාතික පොල් වැලදාව ගෙඩි මිලියන 3351.8 වූ අතර එය පොල් වැලදාව ගෙඩි මිලියන 3000කට වඩා අඛණ්ඩව වාර්තා

වූ දෙවන වසර විය. මේ අනුව 2022 වසරේ වාර්තා වූ ඵලදාව 2021 වසරට වඩා 1% කින් අඩු වී ඇත. 2022 වසරේදී එක් එක් මුරයට සාපේක්ෂව ඵලදාවේ වෙනස්වීම සලකා බැලූ විට 2 වන මුරය ,3 වන මුරය සහ 4 වන මුරයන්හිදී ගෙඩි මිලියන 600කට වඩා වැඩි ඵලදාවක් වාර්තා වී ඇත. 6 වැනි මුරයේදී (නොවැම්බර්/දෙසැම්බර්) ගෙඩි මිලියන 420.1ක් වූ අනෙක් මුරයන්ට සාපේක්ෂව අඩුම ඵලදාවක් ලැබී ඇත. 2022 වසරේදී ඇස්තමේන්තුගත වාර්ෂික පොල් ඵලදාව පුරෝකථනය කල අගයට වඩා 4% කින් පමණ වැඩි වූ අතර එය පුරෝකථනය කල අගයට ඉතා ආසන්න අගයක් විය.(ගෙඩි මිලියන 3219.0 ± 29.0).




රූපය 1. 2022 වසර සඳහා පුරෝකථනය කල ද්වී මාසික ඵලදාව හා එම වසරේ ඇස්තමේන්තු ගත වාර්ෂික ජාතික පොල් ඵලදාව අතර සංසන්දනය



රූපය 2. 2022 වසර සඳහා ඇස්තමේන්තු ගත ද්වී මාසික ඵලදාව හා 2021 වසර සඳහා ඇස්තමේන්තුගත පොල් ඵලදාව අතර සංසන්දනය

2021 වසර පුරාවට සහ 2022 වසරේ මුල් කාලයේදී බොහෝ පොල් වගා කරන දිස්ත්‍රික්කවලට ලැබූ ප්‍රමාණවත් වඩාත් හොඳින් පැතිරුණු වර්ෂාපතනය 2022 වසරේ වාර්තා වූ ඉහළ පොල් ඵලදාවට ප්‍රධාන හේතු සාධකයක් විය. වාර්තා වූ වර්ෂාපතනයන්ට අනුව,සියලුම පොල් වගා කරන දිස්ත්‍රික්ක ආවරණය කරමින් 2020 (මී.මී 1534.9)වසරට වඩා 54% කින් වැඩි වූ සාමාන්‍ය වාර්ෂික වර්ෂාපතනය 2021 (මි.මී.2373.3)වසරේ දී වාර්තා වී ඇත. 2021 වසරේදී සියලුම දිස්ත්‍රික්කවල තරමක් ඉහළ වර්ෂාපතනයක් වාර්තා වී ඇත. ඒ අතර දිස්ත්‍රික්ක 4ක එනම් කෑගල්ල (109%) , මහනුවර (105%) , මන්නාරම (102%) සහ හම්බන්තොට (101%)යන දිස්ත්‍රික්කවලට ,පෙර වසරට සාපේක්ෂව දෙගුණයකට වඩා වැඩි වර්ෂාපතනයක් ලැබී ඇත. මොණරාගල , පුත්තලම , මාතලේ , රත්නපුර , අම්පාර සහ ගම්පහ යන දිස්ත්‍රික්ක හයට 2020 වසරට සාපේක්ෂව 60% ට වඩා වැඩි වර්ෂාපතනයක් 2021 වසරේදී ලැබී ඇත මීට අමතරව සෙසු දිස්ත්‍රික්ක වලටද ඉහතින් දැක්වූ තරම් ඉහළ ප්‍රතිශතයකින් නොවුන ද පෙර වසරට වඩා වැඩි වර්ෂාපතනයක් 2021 වසරේදී ලැබී ඇත.

පසුගිය දස වසරක කාලය තුළ පොල් වගා කරන දිස්ත්‍රික්ක තුළ වාර්තා වූ සාමාන්‍ය වාර්ෂික වර්ෂාපතනය සැලකීමේදී , ඉහළම වර්ෂාපතනය ලැබූ වසරක් ලෙස 2021 දැක්විය හැක. තවද, වියළි කාලයේදී දිස්ත්‍රික්ක කිහිපයක හැර බොහෝ පොල් වගා කරන දිස්ත්‍රික්ක තුළ උපරිම වායුගෝලීය උෂ්ණත්වය (Tmax) 33 ^{0}C ට වඩා අඩු අගයක පැවත ඇත.මෙම හිතකර වර්ෂාපතනය සහ උෂ්ණත්ව තත්ත්වයන් 2022 වසරේදී ඉහළ ඵලදාවක් වාර්තා වීම සඳහා ප්‍රධාන දායකත්වයක් දක්වා ඇත.



රූපය 3. 2020 සහ 2021 වසර වල පොල් වගා කරන දිස්ත්‍රික්කවල වාර්තා වූ මුළු වර්ෂාපතනය (මී.මී.) සංසන්දනය.



වගා සංරක්ෂණය

පොල් වගාවේ සුදු මැස්සා හානියේ වර්තමාන තත්ත්වය පිළිබඳ අධ්‍යයනය කිරීම

වගා සංරක්ෂණ අංශය

පොල් වගාවේ සුදු මැස්සා හානිය ශ්‍රී ලංකාවට නව ආක්‍රමණශීලී පළිබෝධ හානියක් ලෙස හැඳින්විය හැක. මොවුන් ශාක ප්‍රභේද විශාල සංඛ්‍යාවක් මත යැපෙන අතර ඉතා වේගයෙන් පැතිරෙන පළිබෝධකයෙකි. මීට අවුරුදු තුනකට පෙර 2019 දී සුදුමැස්සා හානිය ශ්‍රී ලංකාවේ පළමු වරට පොල් වගාවේ වාර්තා වූ අතර මෙම හානියේ පැතිරීම සහ හානියේ වර්තමාන තත්ත්වය පිළිබඳව මෙහිදී අධ්‍යයනය කරන ලදී.

ක්ෂේත්‍ර අධ්‍යයන මගින් සුදු මැස්සාගේ ශ්‍රී ලංකාව තුළ ව්‍යාප්තිය පිළිබඳව දත්ත රැස් කරන ලදී.

2019 වර්ෂයේ දී මුලින්ම කෑගල්ල දිස්ත්‍රික්කයේ සමහර ප්‍රදේශවලින් වාර්තා වූ මෙම හානිය 2022 අවසානය වන විට ගම්පහ, කොළඹ, කෑගල්ල, මහනුවර, කළුතර, ගාල්ල, මාතර, පුත්තලම, කුරුණෑගල, මාතලේ, හම්බන්තොට සහ බදුල්ල යන දිස්ත්‍රික්කවලින් ද විවිධ හානි තීව්‍රතා මට්ටම්වලින් වාර්තා වේ.

සුදු මැස්සා හානිය පොල් සහ තැඹිලි ගස්වල යට මාලයේ අතුවල වැඩි ප්‍රමාණයක් ද මධ්‍යම සහ ඉහළ මාලවල අඩු ප්‍රමාණයකින් ද නිරීක්ෂණය වේ. පොල් සහ තැඹිලි ශාක වල සියලුම වයස් කාණ්ඩ සුදු මැස්සා හානියට ග්‍රාහී වේ. ශ්‍රී ලංකාවේ තැඹිලි සහ කහ කුන්දිරා ප්‍රභේදවල සුදු මැස්සා හානිය වැඩිපුර නිරීක්ෂණය කරන ලදී.



රූපය 1. අධික ලෙස සුදු මැස්සාගේ හානියට ලක් වූ තැඹිලි ගසක්


පොල් වගාවේ සිටින සුදු මැස්සන් විශේෂ රූප විද්‍යාත්මකව හඳුනා ගැනීම හා ඒ ආශ්‍රිතව සිටින ස්වාභාවික සතුරන් පිළිබඳව අධ්‍යයනය කිරීම

වගා සංරක්ෂණ අංශය

ඕනෑම පළිබෝධකයකු පාලනය කිරීම සඳහා පාලන ක්‍රමයක් හඳුන්වාදීමට පෙර ඔවුන් විශේෂ මට්ටමට හඳුනා ගැනීම වැදගත් වේ. ශ්‍රී ලංකාවේ අනෙකුත් කෘෂිකාර්මික භෝගවල සුදු මැස්සා හානිය වාර්තා වුවද පොල් වගාවට සුදු මැස්සා හානිය නව පළිබෝධකයකු වේ. මෙම පළිබෝධකයාගේ පවතින ආක්‍රමණශීලී ස්වභාවය හේතුවෙන් ඔවුන් මර්දනය කිරීම සඳහා පාලන ක්‍රමයක් හඳුනා ගැනීමට පෙර ඔවුන්ගේ විශේෂ හඳුනාගැනීම ඉතාමත් වැදගත් වේ. පොල් වගාවේ සුදු මැස්සන් රූප විද්‍යාත්මකව හඳුනා ගැනීමේ පර්යේෂණය 2022 වර්ෂයේ මාර්තු සිට නොවැම්බර් මාසය දක්වා සිදු කරනු ලැබීය. මෙහිදී ගම්පහ, කොළඹ, මහනුවර සහ කෑගල්ල යන දිස්ත්‍රික්කවලින් අහඹු ලෙස සාම්පල ලබා ගන්නා ලදී. විද්‍යාගාරයේ දී මොවුන් රූප විද්‍යාත්මකව විවිධ හඳුනාගැනීමේ යතුරු භාවිතා කර හඳුනා ගන්නා ලදී.

මෙහිදී ශ්‍රී ලංකාවේ මින් පෙර වාර්තා නොවූ විශේෂ කිහිපයක් ශ්‍රී ලංකාවේ පොල් ගස් ආශ්‍රිතව රූප විද්‍යාත්මකව හඳුනා ගන්නා ලදී. එම විශේෂ වනුයේ (*Aleurodicus rugioperculatus* Martin), Nesting whitefly (*Paraleyrodes minei* Quaintance), Palm-infesting whitefly (*Aleurotrachelus atratus* Hempel) හා Spiraling whitefly (*Aleurodicus dispersus* Russell) වේ. මෙය ශ්‍රී ලංකාවේ සුදු මැස්සන් විද්‍යාත්මකව හඳුනා ගැනීමේ පළමු වාර්තාව ද වේ. මෙලෙස රූප විද්‍යාත්මකව හඳුනාගත් සුදු මැස්සන් විශේෂ, අණුක ජීව විද්‍යාත්මකව තහවුරු කිරීම සඳහා වන පර්යේෂණ දැනට සිදු කරමින් පවතී.

මීට අමතරව ස්වාභාවික සතුරන් ලෙස *Encarsia guadelaupae* පරපෝෂිතයන් හා *Cryptolemus sp* විලෝපිකයන් පොල් ගස් ආශ්‍රිතව හඳුනා ගන්නා ලදී.



රූපය 2. A.*adult of Aleurodicus rugioperculatus* ගේ සුහුඹුල් අවධිය; B.*Aleurodicus rugioperculatus* ගේ ව්‍යාජ පිලා අවධිය; C.*Paraleyrodes minei* ගේ සුහුඹුල් අවධිය; D.*Paraleyrodes minei* ගේ ව්‍යාජ පිලා අවධිය; E, F. *Aleurotrachelus atratus* ගේ ව්‍යාජ පිලා අවධිය; G,H. *Aleurodicus dispersus* ගේ ව්‍යාජ පිලා අවධිය

ප්ලෙසිස්පා කුරුමිණියා *(Plesispa reichei)* පාලනය කිරීම සඳහා වෙළෙඳපොළෙහි ඇති තෝරාගත් ස්වාභාවික පළිබෝධ නාශක වර්ග කිහිපයක් රසායනාගාරය තුළ අත්හදා බැලීම.

වගා සංරක්ෂණ අංශය

ප්ලෙසිස්පා කුරුමිණියා පොල් පැළවලට දරුණු හානියක් සිදුකරන පළිබෝධකයකි. දැනට මොවුන් පාලනය කිරීම සඳහා රසායනික කෘමිනාශක පමණක් යොදා ගනී. මේ නිසා මොවුන් පාලනය කිරීමට වෙළඳපොලේ ඇති ස්වභාවික පළිබෝධනාශක කිහිපයක් භාවිතා කිරීමට ඇති හැකියාව පිළිබඳව විද්‍යාගාරය තුළදී අත්හදා බලන ලදී. ප්ලෙසිස්පා කුරුමිණියා පාලනය කිරීම සඳහා මෙහිදී වෙළඳපොළේ අඩංගු ස්වාභාවික පළිබෝධනාශක වර්ග තුනක් වූනම් BioSolex, Flipper හා Agro Safe Liquid (ASL) අත්හදා බලන ලදී. Carbosulfan 20% ධනාත්මක පාලක පරීක්ෂණය (positive control) ලෙසද ආස්‍රැත ජලය සෘනාත්මක පාලක පරීක්ෂණය (negative control) ලෙසද භාවිතා කරන ලදී. මෙහිදී වැඩුණු සුහුඹුලන් සහ කීට අවධි මෙම පළිබෝධනාශක වර්ග අඩංගු පත්‍රවලට විවිධ කාල සීමාවන්ට (24, 48 සහ 72 hours) නිරාවරණය කර මියගිය කෘමි ප්‍රතිශතය වාර්තා කර ගන්නා ලදී. ඊට පසුව 90% ක මරණ ප්‍රතිශතයක් ලබා දුන් සාන්ද්‍රණය සඳහා පොල් පත්‍රිකාවලට විෂභාවයක් තිබේද යන්න පරීක්ෂා කර බලන ලදී (phytotoxicity test).

මෙම පර්යේෂණයේදී පරීක්ෂා කරන ලද ස්වාභාවික කෘමිනාශක වර්ග තුනම මගින් කාලය හා සාන්ද්‍රණය වැඩිවීමත් සමඟ මරණ ප්‍රතිශතය ද වැඩි වන බව තහවුරු විය. පැය 48 දී, වැඩිහිටි සහ කීටයන් සඳහා පිළිවෙලින් LC50 අගයන් BioSolex මත 0.14x104 ppm සහ 0.03x104 ppm ද, Flipper මත 19.4x104 ppm සහ 15.6x104 ppm ද, ASL මත 39.6x104 ppm සහ 36.7x104 ppm ද විය. Flipper iy ASL ඉතා ඉහළ සාන්ද්‍රණයකදී මරණ අනුපාතයෙහි සැලකිය යුතු වෙනස්කම් පෙන්නුම් කරන ලදී.

මෙම පර්යේෂණයේ අවසාන ප්‍රතිඵලය ලෙස Biosolex කෘමිනාශකය අඩු සාන්ද්‍රණ යටතේ වුවද විශාල මරණ ප්‍රතිශතයක් ලබා දුන් අතර එහි phytoxicity ද නොමැති විය. මෙම ස්වාභාවික කෘමිනාශකවල සාර්ථකත්වය ක්ෂේත්‍ර පරීක්ෂණ මගින් තවදුරටත් අධ්‍යයනය කළ යුතු වේ.

වැලිගම පොල්කොළ මැලවීමේ රෝගය *(WCLWD)* සහ කොළ කරවීමේ ආබාධය *(LSD)* හා සම්බන්ධ විශේෂ පෝෂණ අවශ්‍යතා සහිත කෘත්‍රිම මාධ්‍යවල වගා කළ නොහැකි ප්‍රෝකැරියෝටාවන් අණුක ජීව විද්‍යාත්මක ක්‍රමවේදයන් මගින් හඳුනා ගැනීම

වගා සංරක්ෂණ අංශය

අණුක ජීව විද්‍යාත්මක ක්‍රමවේදයන් මඟින් වැලිගම පොල්කොළ මැලවීමේ රෝගය (WCLWD) සහ කොළ කරවීමේ ආබාධය (LSD) හා සම්බන්ධ ප්‍රෝකැරියෝටාවන් හඳුනාගැනීමට මෙම අධ්‍යයනය සිදු කරන ලදී. එහිදී ශෛලම හා ප්ලෝයම පටකවලට සීමා වූ විශේෂ පෝෂණ අවශ්‍යතා සහිත කෘත්‍රිම මාධ්‍ය තුළ වගා කළ නොහැකි ප්‍රෝකැරියෝටාවන් *(Fastidious prokaryotes)* සිටින බව තහවුරු කර ගැනීම සඳහා

PCR පරීක්ෂණ සිදු කරන ලද අතර එයට WCLWD ආසාදිත, LSD ආසාදිත, නිරෝගි ලෙස පෙනෙන හා නිරෝගී පොල් ගස්වලින් වාර හයකදී මුළු නියැදි 612 ක් ලබා ගන්නා ලදී.



රූපය 3. වැලිගම පොල් කොළ මැළවීමේ රෝගය අසාදිත පොල් ගසක්

මෙහිදී ධනාත්මක ප්‍රතිඵල ලැබුණු පැහැදිලි DNA පටි Sanger sequencing ක්‍රමවේදයට ලක් කර ප්‍රතිඵල GenBank දත්ත ගොනුවේ දත්ත හා සසඳා බලන ලදී. එහිදී සියලුම අනුක්‍රමණ උක් පත්‍ර සුදු වීමේ රෝගය ඇති කරන ෆයිටොප්ලාස්මා සමග 99 -100% ක් ගැලපුණි. පරීක්ෂාවට අනුව මෙවැනි ෆයිටොප්ලාස්මා ප්‍රභේද 04 ක් හඳුනාගත හැකි වූ අතර ඒවා GenBank හි තැන්පත් කරන ලදී. ෆයිටොප්ලාස්මා හැර අනිකුත් කිසිදු විශේෂ පෝෂණ අවශ්‍යතා සහිත කෘත්‍රිම මාධ්‍යවල වගා කළ නොහැකි ප්‍රෝකැරියෝටාවන් මේ දක්වා PCR පරීක්ෂාවේදී ධනාත්මක ප්‍රතිඵල ලබා දී නොමැත.

වගුව 1. වැලිගම පොල් කොළ මැලවීමේ රෝගයට හේතු වන නව ෆයිටොප්ලාස්මා ප්‍රභේද

නියැදි අංකය	**BLASTn** පරීක්ෂාව සමග හොඳින්ම ගැලපෙන ව්‍යාධිජනකයා	**සමානතා ප්‍රතිශතය**	**Accession අංකය**
වැලිගම ප්‍රභේදය 8 (ධනාත්මක පාලක පරීක්ෂණය - උක් පත්‍ර සුදු වීමේ රෝගය ඇති කරන ෆයිටොප්ලාස්මා)	උක් පත්‍ර සුදු වීමේ රෝගය ඇති කරන ෆයිටොප්ලාස්මා	100	OP279594
වැලිගම ප්‍රභේදය 9	උක් පත්‍ර සුදු වීමේ රෝගය ඇති කරන ෆයිටොප්ලාස්මා	99.77	OP279485
වැලිගම ප්‍රභේදය 10	උක් පත්‍ර සුදු වීමේ රෝගය ඇති කරන ෆයිටොප්ලාස්මා	99.51	OP279647
වැලිගම ප්‍රභේදය 11	උක් පත්‍ර සුදු වීමේ රෝගය ඇති කරන ෆයිටොප්ලාස්මා	98.88	OP279533

මීට අමතරව දකුණු පළාතේ මාතර දිස්ත්‍රික්කයේ වැලිගම පොල්කොළ මැලවීමේ රෝගය සහිත පොල් ඉඩම් දෙකකින් PCR පරීක්ෂණයේදී *Liberibacter asiaticus* සඳහා ධනාත්මක ප්‍රතිඵල පෙන්වන දොඩම් ශාක දෙකක් හඳුනා ගන්නා ලදී. මින් තෝරාග න්නා ලද PCR නිෂ්පාදන Sanger sequencing ක්‍රමවේදයට බඳුන් කරන ලදී. ලැබෙන ප්‍රතිඵල මත මෙම *Liberibacter asiaticus* DNA, ඉදිරි PCR පර්යේෂණ වල දී Positive control එක ලෙස භාවිතා කළ හැක. තවද අතුරු බෝගයක් ලෙස පොල් සමඟ දොඩම් වගාව නිර්දේශ කරන නිසා මෙම ව්‍යාධිජනකයා පසුකාලීනව පොල්වලට ආසාදනය වීමේ නැඹුරුතාවයක් ද පවතී.

වැලිගම පොල් කොළ මැලවීමේ රෝගය (WCLWD) සහ කොළ කරවීමේ ආබාධය (LSD) යන රෝග කළමනාකරණය කිරීම සඳහා ප්‍රතිරෝධ උත්ප්‍රේරක රසායන ද්‍රව්‍ය (Systemic Acquired Resistance Inducers) භාවිතා කිරීම

වගා සංරක්ෂණ අංශය

වැලිගම පොල් කොළ මැලවීමේ රෝගය සහ කොළ කරවීමේ ආබාධය යන රෝග සඳහා ප්‍රතිරෝධ උත්ප්‍රේරක රසායන ද්‍රව්‍යවල ඇති බලපෑම හඳුනා ගැනීම සඳහා පර්යේෂණ සිදු කරන ලදී. එහිදී ප්‍රතිරෝධ උත්ප්‍රේරක රසායන ද්‍රව්‍ය වාර හයක් යෙදීම සහ රෝග තීව්‍රතා දර්ශක (Disease Severity Index) සටහන් කිරීම අවසන් කර ඇත .

ප්‍රතිකර්ම යොදන ලද වැලිගම රෝගී පොල්ගස්වල ප්‍රතිකර්ම නොයොදන ලද වැලිගම රෝගී පොල් ගස්වලට සාපේක්ෂව රෝග තීව්‍රතා දර්ශකයේ අඩුවීමක් නිරීක්ෂණය කරන ලදී. මේ පිළිබඳ පර්යේෂණ කටයුතු තවදුරටත් සිදු කරමින් පවතී.



පොල් සැකසුම් හා පොල් ආශ්‍රිත නිෂ්පාදන වැඩිදියුණු කිරීම

අඩු ග්ලයිසිමික් අගයක් සහිත පොල් හකුරු

පොල් සැකසුම් පර්යේෂණ අංශය

පොල් හකුරුවල ග්ලයිසමික් දර්ශකය සොයා ගැනීම සඳහා නිරෝගී පුද්ගලයින් 40 ක් යොදා ගනිමින් සායනික අධ්‍යයනයක් නිම කරන ලදී. කොළඹ ජාතික රෝහලේ ආචාර ධර්ම කමිටුවෙන් පරීක්ෂණය සිදු කිරීම සඳහා අවසරය ලබා ගන්නා ලදී. අධ්‍යයනය සඳහා ස්වේච්ඡාවෙන් ඉදිරිපත් වූ නිරෝගී පුද්ගලයින්ගේ සාමාන්‍ය වයස අවුරුදු 28 ක් වූ අතර ඔවුන් සියල්ලන්ටම නිරෝගී ශරීර ස්කන්ධ දර්ශකය (BMI) තිබුණි. සාමාන්‍ය නිරාහාර රුධිර ග්ලූකෝස් සාන්ද්‍රණය සහ අධ්‍යයන කණ්ඩායමේ HbA1c අගයන් පිළිවෙලින් 98.23±9.10 mg/dl සහ 4.83±0.33% විය.

සාම්ප්‍රදායික මීරා යුෂ වකතු කිරීමේ ක්‍රමය (හල් පොතු සමඟ) සහ පොල් පර්යේෂණ ආයතනයෙහි පොල් සැකසුම් අංශයෙහි නිපදවූ නව මීරා යුෂ වකතු කිරීමේ ක්‍රමය (NSCM), මඟින් ලබා ගත් පිරිසිදු මීරා වලට සහ 0.2% කුරුඳු (CIN හකුරු) සහ 0.05% සාදික්කා (NUT හකුරු) ඇතුළත් කර මීරා භාවිතයෙන් නිපදවූ හකුරුවල ග්ලූකෝස් ප්‍රතිචාරය (GR) සහ ග්ලයිසමික් දර්ශකය (GI) ඉහත නිරෝගී පුද්ගලයන් භාවිතයෙන් නිර්ණය කරන ලදී. සියලුම හකුරු වර්ග මධ්‍යම ග්ලයිසමික් දර්ශක අඩංගු ආහාර කාණ්ඩය අයත් විය. හල් පොතු, සාදික්කා සහ කුරුඳු , පිරිසිදු මීරාවලට එක් කිරීමෙන් පොල් හකුරු වල GI අගය අඩු විය. මෙම පර්යේෂණයට අනුව හල් පොතු, සාදික්කා, කුරුඳු පිරිසිදු මීරාවලට එක්කර ආහාරයට ගැනීමේ තත්ත්වයක් පවත්වා ගනිමින් ග්ලයිසමික් අගය අඩුකර ගත හැක.

වගුව 1. අගය වකතු කළ පොල් හකුරු වල ග්ලයිසිමික් දර්ශක

හකුරු වර්ගය	ග්ලයිසිමික් දර්ශක	ග්ලයිසිමික් කාණ්ඩය
උක් සීනි	60.76	මධ්‍යම GI
NSCM හකුරු	65.19	මධ්‍යම GI
HAL හකුරු	55.79	මධ්‍යම GI
NUT හකුරු	57.56	මධ්‍යම GI
CIN හකුරු	59.45	මධ්‍යම GI

හල් පොතු, සාදික්කා සහ කුරුඳු, පිරිසිදු මී රා වලට එක් කිරීමෙන් පොල් හකුරු වල GI අගය අඩු විය.

නැවුම් පොල් තලපය නිෂ්පාදනය සහ එහි භාවිතය

පොල් සැකසුම් පර්යේෂණ අංශය

මෙම අධ්‍යයනයෙන් සාම්ප්‍රදායික පොල් කිරි (CCM) සඳහා ආදේශකයක් ලෙස නැවුම් පොල් තලපයෙහි (FCP) යෝග්‍යතාවය සහ පාරිභෝගික පිළිගැනීම ගවේෂණය කරන ලදී. මේ අනුව, ශ්‍රී ලංකාවේ ගෘහාශ්‍රිතව පොල් පරිභෝජනය අවම කිරීම සහ එමඟින් පොල් ආශ්‍රිත කර්මාන්ත සඳහා පොල් ලබා ගැනීමේ හැකියාව වැඩි කිරීම මෙහි අරමුණ විය.

FCP හි ආසන්න සංයුතිය වන්නේ: තෙතමනය 67.46 ± 0.72%, මේදය 27.89 ± 0.40%, දළ තන්තු 1.29 ± 0.04%, ප්‍රෝටීන් 1.27 ± 0.01%, අළු 0.73 ± 0.08%, සහ කාර්බෝහයිඩ්‍රේට් 2.63 ± 0.44%. පහේ හෙඩොනික් පරිමාණය භාවිතයෙන් රස සංවේදී ඇගයීම සඳහා FCP සහ CCM යොදා පරිප්පු ව්‍යංජන සාදන ලදී. CCM සහ FCP යොදා සකස් කළ ව්‍යංජනවල රසය සහ සුවඳ සැලකිය යුතු ලෙස වෙනස් නොවන බව පෙන්නුම් කළේය ($p>0.05$). මීට අමතරව, ගම්පහ සහ කොළඹ දිස්ත්‍රික්කවල පාරිභෝගිකයින් 150 දෙනෙකු සමඟ පාරිභෝගික සමීක්ෂණයක් පවත්වන ලද අතර, FCP පැකට් භාවිතා කර පරිප්පු ව්‍යංජන සකස් කිරීමට උපදෙස් දෙන ලදී. පාරිභෝගික සමීක්ෂණයට අනුව, 61% පාරිභෝගිකයින් FCP වෙළඳපොලේ තිබේ නම් එය මිලදී ගැනීමට කැමති විය. නිෂ්පාදනයේ වඩාත්ම කැමති ගුණාත්මකභාවය වූයේ භාවිතයේ පහසුවයි. FCP ශීත කළ තත්ත්ව යටතේ සති 2ක් දක්වා ගබඩා කර තැබිය හැකි අතර, එය හොඳ සෞඛ්‍ය ආරක්ෂිත ක්‍රම මඟින් තවදුරටත් වැඩි කළ හැක. FCP ග්‍රෑම් 50ක අඩංගු පොල් මද ප්‍රමාණය ග්‍රෑම් 16.27ක් වේ. එසේම FCP ග්‍රෑම් 150ක් දිනක පරිභෝජනයට ප්‍රමාණවත්වන අතර එය අතින් මිරිකා පොල් කිරි ලබා ගැනීම හා සැසඳීමේදී හතර දෙනකුගෙන් යුත් පවුලකට වසරකට පොල් ගෙඩි 274ක් සහ රු. රුපියල් 28,680/= ක් ඉතිරි කර ගත හැක.



රූපය 1. කොලොයිඩල් යන්ත්‍රය භාවිතයෙන් නැවුම් පොල් පේස්ට් සකස් කිරීම

සුපිරි නැවුම් පොල්තෙල් නිෂ්පාදනය සඳහා පොල් කිරි පැසවීම වේගවත් කිරීම සඳහා ක්ෂුද්‍ර ජීවීන් වෙන් කිරීම

පොල් සැකසුම් පර්යේෂණ අංශය

CRI වාර්ෂික වාර්තාව (2021) ට අනුව නිරීක්ෂණය වූයේ තෙත් ක්‍රියාවලිය භාවිතයෙන් සුපිරි නැවුම් පොල්තෙල් (EVCO) නිෂ්පාදනය කිරීමේදී, පැසවීමට ලක් කළ පොල් කිරිවලින් වෙන් කළ Lactobacillus (D) භාවිතයෙන් ඉහළම තෙල් ප්‍රමාණයක් ලබා ගත හැකි බවයි. Lactobacillus (D) 319.67 × 106 ක්ෂුද්‍ර ජීවීන්/මිලි වූ ගහනයක් භාවිතයෙන්, විවිධ සාන්ද්‍රණයන්ගෙන් (10%, 5% සහ 2.5%) පොල් කිරි හා මිශ්‍ර කරන ලදී. Lactobacillus (D) ගහනයෙන් 10% සාන්ද්‍රණයක් සහිත පොල් කිරි පැය 18ක් ඇතුළත වැඩිම සුපිරි නැවුම් පොල්තෙල් (16.5%) ප්‍රමාණයක් නිපදවන බව පෙන්නුම් කළේය.

මෙම ක්‍රියාවලියෙන් නිපදවන ලද සුපිරි නැවුම් පොල්තෙල්වල ගුණාත්මකභාවය ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් සකස් කර ඇති ප්‍රමිතිය තුළ පවතී. ක්ෂුද්‍ර ජීවීන් භාවිතයෙන් පොල් කිරිවලින් තෙල් වෙන් කළද, එහි නිෂ්පාදනය කරන අවස්ථාවේ සම්පූර්ණ ක්ෂුද්‍ර ජීවී ගහනය (TPC) , යීස්ට් සහ පුස් ගහනයන් නිරීක්ෂණය වන මට්ටමක නොතිබිණි. එය සුපිරි නැවුම් පොල්තෙල් (EVCO) හි දිගු ආයු කාලයක් සඳහා හොඳ දර්ශකයක් විය. සුපිරි නැවුම් පොල්තෙල් (EVCO) නිෂ්පාදනය වේගවත් කිරීම සඳහා තෝරාගත් ක්ෂුද්‍ර ජීවීන්, pH සහ සෙලියුලේස් එන්සයිමවල අන්තර්ක්‍රියා බලපෑම හඳුනා ගැනීම සඳහා පර්යේෂණ සිදු වෙමින් පවතී.

පොල් බටර් නිෂ්පාදනය සඳහා පර්යේෂණ

පොල් සැකසුම් පර්යේෂණ අංශය

පොල් බටර් තැවරුමක් නිෂ්පාදනය කිරීම පිළිබඳ අත්හදා බැලීම් අබණ්ඩව සිදු කරන ලදී. 25% සීනි, 10% ඉරිඟු පිෂ්ඨය සහ 1.5% පාම් ස්ටියරින් සමඟ මිශ්‍ර කිරීමෙන් නිෂ්පාදිත පොල් බටර් තැවරුම අඩු ස්ථර වෙන්වීමක් සහ ඉහළ රස සංවේදන ලකුණු සහිත හොඳම නිෂ්පාදනය ලෙස හඳුනා ගන්නා ලදී .



රූපය 2. පොල් බටර් තැවරුම

පොල් බටර් තැවරුමෙහි පෝෂණ සංයුතිය 1.57 ± 0.04% තෙතමනය, 43.35 ± 2.02% මේදය, 1.17 ± 0.18% අළු, 7.84 ± 0.54% දළ තන්තු, 12.49 ± 0.21% ප්‍රෝටීන් සහ 33.549 ± 1.64% කාබෝහයිඩ්‍රේට්. නිෂ්පාදනයේ සම්පූර්ණ ක්ෂුද්‍ර ජීවී ගහනය (TPC) සහ සම්පූර්ණ යීස්ට් සහ පුස් ගණන (TYMC) හිතකර මට්ටමක පැවතුණි. නිෂ්පාදනයේ වර්ණය පෙන්නුම් කළේ එහි L* (ආලෝකය හෝ අඳුර) අගය 93.80 ± 0.37, a* (රතු පැහැය හෝ කොළ පැහැය) අගය 0.65 ± 0.03 සහ b* (කහ පැහැය හෝ නිල් පැහැය) අගය 9.71 ± 0.30 බවයි. එම අගයන් එළකිරිවලින් සෑදූ බටර්වල අගයන්ට වඩා වැඩි විය. වයන විශ්ලේෂණයේ ප්‍රතිඵල වලින් පෙන්නුම් කළේ පොල් බටර් ව්‍යාප්තියේ දෘඪතාව ග්‍රෑම් 573ක් බවයි. එළකිරි වලින් සාදන බටර් සහ මාගරින් හා සසඳන විට පොල් බටර් තැවරුමෙහි දෘඪතාව මධ්‍යස්ථ අගයක් බව පෙන්නුම් කළේය.

ජල වාෂ්ප සහ විජලනය භාවිතයෙන් පොල් කුරුටුතෙල්වල ගුණාත්මකබව සහ රාක්ක ආයුකාලය වැඩිදියුණු කිරීම

පොල් සැකසුම් පර්යේෂණ අංශය

පොල් කුරුටු යනු පොල් මදය පිටතින් ආවරණය වී ඇති තුනී ස්ථරයයි. පොල් ආශ්‍රිත කර්මාන්තවලින් පොල් මදයේ මෙම කොටස ඉවත් කරයි. පොල් කුරුටුවල අඩංගු වී ඇති තෙල් අත්‍යවශ්‍ය මේද අම්ලවලින් ඉහළ බැවින් ගුණාත්මකබව ආරක්ෂා කර නිස්සාරණය කර ගැනීම මෙම පර්යේෂණයේ එක් අරමුණකි. පොල් කුරුටු ජල වාෂ්ප මඟින් තැම්බීම සහ වියළීම මත ගබඩා කිරීමේ ස්ථායිතාවයට සහ පොල් කුරුටු තෙල්වල ගුණාත්මකභාවයට ඇති බලපෑම සෙවීම තවත් අරමුණකි.

වාෂ්ප මඟින් තැම්බූ කුරුටු ඉහළ පෙරොක්සයිඩ් අගයක් පෙන්නූ අතර එය සති 3 ක නිරීක්ෂණ කාලයක් තුළ වැඩි විය. අව්වේ වියළීමට සාපේක්ෂව විජලන යන්ත්‍රයෙන් වියළන ලද කුරුටුවල අඩු පෙරොක්සයිඩ් අගයක් නිරීක්ෂණය වූ අතර දිගු ගබඩා කිරීමේ හැකියාවක් තිබුණි. වාෂ්ප මඟින් තැම්බූ කුරුටුවල ඉහළ පෙරොක්සයිඩ් අගයක් පෙන්නුම් කළ බැවින් එය පොල් කුරුටු ගබඩා කිරීමට සුදුසු ප්‍රතිකාරයක් නොවේ. ක්ෂුද්‍ර ජීව විද්‍යාත්මක දත්ත පෙන්වා දෙන්නේ වාෂ්ප කිරීමෙන් මුල් ක්ෂුද්‍ර ජීවී ඝනත්වය අඩු කළ හැකි බවයි. තැම්බූ කුරුටුවලින් ඉහළ කුරුටුතෙල් අස්වැන්නක් ලබා ගත හැකි බව නිරීක්ෂණය විය.

වාෂ්පයෙන් තම්බා විජලන යන්ත්‍රයෙන් වියළන ලද කුරුටුවලින් ලබාගත් තෙල්වලල වාෂ්පයෙන් නොතැම්බූ විජලන යන්ත්‍රයෙන් වියළන ලද කුරුටුවලින් ලබාගත් තෙල්වලට වඩා අඩු නිදහස් මේද අම්ල අන්තර්ගත වූ අතර වාෂ්පයෙන් තැම්බූ කුරුටු වලින් නිපදවූ තෙල් වල වැඩි පොරොක්සයිඩ් අගයක් අන්තර්ගත වේ.

තෙල්වල පෙරොක්සයිඩ් අගය අහිතකර ගන්ධයට සහ ගුණාත්මකභාවයට දායක වන බැවින්, තෙල් නිස්සාරණය කිරීමේ ක්‍රියාවලිය සඳහා කුරුටු විජලනය සඳහා වාෂ්ප ප්‍රතිකාරය සුදුසු නොවේ. අධ්‍යයනයට ලක්ව ඇති කුරුටුවලින් නිස්සාරණය කරන ලද තෙල්වල භෞතික, රසායනික හා ක්‍රියාකාරී ගුණාංග වගුවේ දක්වා ඇත. ප්‍රතිඵල තහවුරු කිරීම සඳහා පර්යේෂණය අඛණ්ඩව සිදු කර ගෙන යනු ලබයි.

වගුව 2. විවිධ ප්‍රතිකාරවලින් ලබාගත් කුරුටු තෙල් වල භෞතිකල රසායනික හා ක්‍රියාකාරී ගුණාංග

තත්ත්වය	වාෂ්ප මඟින් තැම්බූ				වාෂ්ප මඟින් නොතැම්බූ			
	විජලන යන්ත්‍රයෙන් වියළන ලද		හිරු එළියෙන් වියළන ලද		විජලන යන්ත්‍රයෙන් වියළන ලද		හිරු එළියෙන් වියළන ලද	
	ආරම්භක අවස්ථාව	දින 30	ආරම්භක අවස්ථාව	දින 30	ආරම්භක අවස්ථාව	දින 30	ආරම්භක අවස්ථාව	දින 30
නි.මේ.අ %	0.14± 0.04	0.34± 0.08	0.25± 0.05	0.34± 0.04	0.29± 0.04	0.36± 0.06	0.43 ± 0.09	0.50± 0.06
පෙ.අ meq/kg	0.92± 0.18	1.64± 0.25	2.57± 0.59	2.80± 0.69	0.79 ± 0.43	1.39± 0.56	1.05 ± 0.41	1.78± 0.70
පැහැය Y+5R	2.03 ± 0.77	2.2± 0.49	2.33± 0.49	2.7± 0.32	2.53 ± 0.26	2.43± 0.41	2.13± 0.75	2.56± 0.33
තෙතමනය %	0.12± 0.01	0.28± 0.02	0.14 ± 0.03	0.16± 0.03	0.16± 0.01	0.23± 0.03	0.24± 0.02	0.24± 0.03

පොල් ප්‍රෝටීන්වලින් සාදන ලද පෙව හානීකරණය වන දවටන


පොල් සැකසුම් පර්යේෂණ අංශය

නැවුම් පොල්තෙල් නිෂ්පාදනයේ අතුරු ඵලයක් වන මේදය ඉවත් වූ විජලිත පොල් වලින් වෙන් කර ගත් පොල් ප්‍රෝටීන් භාවිතා කරමින් පෙව හායනයට ලක්විය හැකි දවටන (BDPM) සකස් කිරීමේ පර්යේෂණ අඛණ්ඩව සිදු කරන ලදී. ආහාර වීතීම සඳහා කුරුඳු පොතු කුඩු (CBP) 0.05% සහ 0.1% සහ කුරුඳු පොතු කුඩු නොමැති පොල් ප්‍රෝටීන් ආශ්‍රිත BDPM සෑදීම සහ භාවිතා කිරීම අධ්‍යයනය කරන ලදී.


සැන්ඩ්විච් පාන් වතුම

ඉහත සාදන ලද දවටන වර්ග 3, සැන්ඩ්විච් පාන් වලට වතුමක් ලෙස භාවිතා කරමින් රස සංවේදනය හා ආහාර සුරක්ෂිතතාවය කෙරෙහි බලපෑම අධ්‍යනය කරන ලදී .

සංවේදී විශ්ලේෂණයේ ප්‍රතිඵල වලින් හෙළි වූයේ, ඇසුරුම් ද්‍රව්‍ය වර්ගය සමඟ සාම්පලවල රසය, වයනය සහ සමස්ත පිළිගැනීම සැලකිය යුතු ලෙස වෙනස් වන බව ($p<0.05$) සහ පොල් ප්‍රෝටීන් ආශ්‍රිත කුරුඳු පොතු කුඩු (PCB) ඇතුළත් කළ පෙව හානීකරණය වන දවටන (BDPM) සැන්ඩ්විච් පාන් ඔතා ගැනීම සඳහා සාර්ථකව භාවිතා කළ හැකි බවය. කෙසේ වෙතත්, දවටන භාවිතයේදී පැය 6ක කාලය තුළ පාන් සාම්පලවල තෙතමනය අඩු වී නැවුම් බව නැති වී ගිය අතර, කුරුඳු පොතු කුඩු ආශ්‍රිත පෙව හානීකරණය වන දවටන භාවිතය වැඩි දියුණු කිරීම සඳහා වැඩිදුර අධ්‍යයනයන් සිදු වෙමින් පවතී.



රූපය 3. සංවේදී අධ්‍යයනයේ දී ඇසුරුම් ද්‍රව්‍ය සමඟ සැන්ඩ්විච් චිතීම



රූපය 4. පොල් ප්‍රෝටීන් ආශ්‍රිත ඊෘජඑ සමඟ සැන්ඩ්විච් පාන් වල තෙතමනය අඩු කිරීම

පොල් කුරුටු පිටිවල ෆීනොලික් සහ ෆ්ලේවනොයිඩ් සංඝටක: තෙල් ඉවත් කළ පොල් කුරුටු පිටි සමඟ ප්‍රධාන ආහාර

පොල් සැකසුම් පර්යේෂණ අංශය සහ මූලික අධ්‍යයන ආයතනය

1.ඉඳිආප්ප

සියලුම දේශීය පොල් ප්‍රභේදවල පොල් කුරුටු පිටි (CTF) ප්‍රතිඔක්සිකාරක සහ ප්‍රති-හයිපර්ග්ලයිසමික්කාරක ලෙස ක්‍රියා කිරීමේ හැකියාව ඇති ෆීනොලික් සහ ෆ්ලේවනොයිඩ්වලින් පොහොසත් ප්‍රභවයන් විය හැකි බව පෙර වසරවල අධ්‍යයනයන් මගින් වාර්තා කරන ලදී. මේ අනුව, ආහාර සැකසුම් කර්මාන්තයේ ක්‍රියාකාරී අමුද්‍රව්‍යයක් ලෙස තෙල් ඉවත් කළ පොල් කුරුටු පිටිවලට විශාල විභවයක් ඇත. එබැවින් එම ගුණාංග අපගේ ආහාර පද්ධතියට යොදා ගැනීම සඳහා ශ්‍රී ලාංකිකයන්ගේ ප්‍රධාන ආහාරයක් වන ඉඳිආප්ප සකස් කිරීම පිළිබඳව අධ්‍යයනයක් සිදු කරන ලදී. ඉඳිආප්ප සෑදීම සඳහා සහල් පිටි සහ විවිධ ප්‍රමාණවලින් මේදය ඉවත් කරන ලද CTF සමඟ මිශ්‍ර කර සංයුක්ත පිටි සාදන ලදී. CTF 25% සහ සහල් පිටිවලින් 75% ක සංයුක්ත පිටි මිශ්‍රණයක් යොදා

ගනිමින් පිළිගත හැකි ගුණාත්මකබවින් යුත් ඉඳිආප්ප සකස් කළ හැකි බව ප්‍රතිඵලවලින් පෙනී ගියේය. මෙම ඉඳිආප්ප රස සංවේදී ඇගයීමක් මගින් නිරීක්ෂණය කරන ලද ඉහළම සමස්ත පිළිගැනීමක් සහ අනෙකුත් සංවේදී ගුණාංග ද ඉහළ මට්ටමක ඇති බව නිරීක්ෂණය විය.

ගුණාත්මක අධ්‍යනයේදී CTF 25% වක් කළ ඉඳිආප්පවල ප්‍රෝටීන්, ආහාරමය තන්තු, මේදය සහ ඛනිජ අන්තර්ගතයෙහි වැඩිවීමක් පෙන්නුම් කළේය. සියලුම CTF වකතු කළ සාම්පල ද්‍රාව්‍ය ආහාර තන්තුවලට වඩා ද්‍රාව්‍ය නොවන ආහාරමය තන්තු ප්‍රතිශතයක් වාර්තා කර ඇති බැවින්, මේදය ඉවත් කරන ලද CTF ආශ්‍රයෙන් සකස් කළ ඉඳිආප්ප මිනිස් සිරුරට හිතකර බැක්ටීරියා වර්ධනයට සුදුසු මාධ්‍යයක් (prebiotic udOHhla) ලබා දෙමින් ඉහළ සෞඛ්‍ය ප්‍රතිලාභ ලබා දෙනු ඇත.

2. මේදය ඉවත් කළ කුරුටු පිටි වකතු කළ රොටි සහ පිට්ටු

රොටි සහ පිට්ටු සකස් කිරීම සඳහා මේදය ඉවත් කරන ලද CTF 20% ක් වකතු කිරීම සාර්ථක විය. මේදය ඉවත් කරන ලද CTF රොටි සකස් කිරීම සඳහා තෝරාගත් වට්ටෝරුව තිරිඟු පිටි ග්‍රෑම් 80 ක්, කඹත ග්‍රෑම් 20 ක්, පොල් මද ග්‍රෑම් 60 ක්, ජලය මිලි ලීටර් 30 ක්, ලුණු ග්‍රෑම් 3.5 ක් සහ පිට්ටු සඳහා තිරිඟු පිටි ග්‍රෑම් 80 ක්, CTF ග්‍රෑම් 20 ක්, පොල් මද ග්‍රෑම් 60 ක්, ජලය මිලි ලීටර් 15 ක් සහ ලුණු ග්‍රෑම් 2 ක් විය. රොටි සාම්පල වර්ග දෙකක ග්ලයිසමික් දර්ශකය ඇගයීම සිදු වෙමින් පවතී.

පොල් පිටි අඩංගු ආහාර වල පෝෂණ ලක්ෂණ

ශ්‍රී ලංකා කෘෂිකර්ම පර්යේෂණ ප්‍රතිපත්තිය මගින් අරමුදල් සපයනු ලබන අතර පොල් සැකසුම් පර්යේෂණ අංශය විසින් මෙහෙයවනු ලැබේ.

පොල් පිටි සැකසූ පාන්

සැන්ඩ්විච් පාන් පිළිස්සීමේ ගුණාත්මකභාවයට පොල් පිටි අංශු ප්‍රමාණයේ ව්‍යාප්තියේ බලපෑම අධ්‍යයනය කරන ලදී. පොල් පිටිවල අංශු ප්‍රමාණය 500 µm ට වැඩි, 500 - 150 µm සහ 150 µm ට අඩු ලෙස කොටස් 3කට වෙන් කරන ලදී. විවිධ අංශු ප්‍රමාණයන්ගෙන් යුත් පොල් පිටිවල ආසන්න සංයුතිය පෙන්නුම් කළේ තෙතමනය, අළු අන්තර්ගතය සහ දළ තන්තු අන්තර්ගතය සැලකිය යුතු ලෙස වෙනස් වන අතර මේදය හා ප්‍රෝටීන් අන්තර්ගතය සැලකිය යුතු ලෙස වෙනස් නොවන බවයි ($p>0.05$). අංශු ප්‍රමාණ 500-150µm වන පොල් පිටිවල ඉදිමුම් ධාරිතාව සැලකිය යුතු ලෙස අඩු වූ අතර 500µm ට වැඩි සහ 150µm ට අඩු අංශු ප්‍රමාණයන්ගෙන් යුත් පොල් පිටිවල ඉදිමුම් ධාරිතාවය තිරිඟු පිටිවලට සමාන විය. පොල් පිටිවල අංශු ප්‍රමාණයන් අතර ඇසුරුම් ඝනත්වය, තෙත්බව, ජලය අවශෝෂණය සහ ජලාකර්ෂණීයබව ද සැලකිය යුතු ලෙස වෙනස් විය. අධ්‍යයනයෙන් නිගමනය වූයේ තිරිඟු පිටිවලට ඉහත අංශු ප්‍රමාණ සහිත පොල් පිටි වකතු කිරීමෙන් සැන්ඩ්විච් පාන්වල පිළිස්සීමේ ගුණයන් වෙනස් නොවන බවයි.

නැවුම් පොල් තෙල් හෝ සෝයා තෙල් පෝෂණය කිරීමෙන් දියවැඩියාව සහිත මීයන් හා සසඳන විට දියවැඩියාව නොමැති මීයන් තුළ ග්ලූකෝස් පරිශීලනය වැඩිදියුණු කිරීම

සහයෝගී අධ්‍යයනය: වෛද්‍ය පීඨය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය සහ CRI හි පොල් සැකසුම් පර්යේෂණ අංශය

දියවැඩියා රෝගය යනු දීර්ඝකාලීන ඉන්සියුලින් ඌනතාවය හෝ ඉන්සියුලින් ක්‍රියාකාරිත්වය අඩාළ වීම නිසා ඇතිවන නිදන්ගත රෝගයක් වන අතර සාමාන්‍ය කායික විද්‍යාවේ බොහෝ අක්‍රමිකතා ඇති කරන අතර, එය අධික රුධිර ග්ලූකෝස් සාන්ද්‍රණය මඟින් පෙන්නුම් කෙරේ. දියවැඩියාව සහිත සහ දියවැඩියාව රහිත මීයන් තුළ ඉන්සියුලින් ඇති විට ග්ලූකෝස් පරිශීලනය කෙරෙහි නැවුම් පොල්තෙල් හෝ සෝයා තෙල් වල බලපෑම පැහැදිලි ඉන්සියුලින් නොමැතිව කළින් කළ අධ්‍යයනය හා සංසන්ධනය මෙම අධ්‍යයනයේ අරමුණයි.

සසම්භාවි ලෙස තෝරාගත් Sprague Pawley මීයන් සෑම කාණ්ඩයටම 08 බැගින් සති 6-8 වයස, ග්‍රෑම් 150-200ක් බර ඇලොක්ෂේන් ප්‍රේරිත දියවැඩියා කාණ්ඩ 3 ක් සහ දියවැඩියා රහිත කාණ්ඩ 3කට සසම්භාවි ලෙස වෙන් කරන ලදි. සියලුම සතුන්ට ඉන්සියුලින් (1U/දින) දිනපතා චර්මාභ්‍යන්තරව ලබා දෙන ලදී. එක් එක් කාණ්ඩයේ කණ්ඩායම් තුනටම දින 90ක් සඳහා නැවුම් පොල් තෙල්, සෝයා තෙල් හෝ ජලය ශරීර බරින් කිලෝ ග්‍රෑමයට මිලි ලිටර් 7.5ක් වන පරිදි ලබාදෙන ලදී. ඉන්සියුලින් පවතින විට නැවුම් පොල්තෙල් සහ සෝයා තෙල් වලින් ග්ලූකෝස් පරිශීලනය වැඩිදියුණු කළ හැකි නමුත් එය නොමැති විට ග්ලූකෝස් පරිශීලනය වැඩි දියුණු කළ නොහැකි බවත් ප්‍රතිඵලවලින් පෙන්නුම් කළේය. දින 45 සහ 90 යන දෙඅංශයේම ඉන්සියුලින් සහිත දියවැඩියා මීයන් , සෝයා තෙල් හා සසඳන විට නැවුම් පොල් තෙල් වලින් ග්ලූකෝස් පරිශීලනය ප්‍රබල වැඩිවීමක් පෙර වාර්තාවලින් පෙන්නුම් කරන ලදී. නැවුම් පොල් තෙල්, සෝයා තෙල් සහ ජලය මඟින් පෝෂණය කරන ලද කණ්ඩායම්වලින් ලබාගත් රුධිරයේ රතු සෛලවල ස්ථාවරත්වය පෙන්නුම් කළේ නැවුම් පොල්තෙල් සමග පෝෂණය වූ දියවැඩියා නොවන සතුන් තුළ රතු සෛල ස්ථාවරත්වය වැඩි වූ බවයි. ඉන් පෙන්නුම් කරන්නේ නැවුම් පොල් තෙල් සෛල පටල ස්ථාවර කිරීමට උපකාරී වූ බවයි.

මානව පියයුරු පිළිකා සෛල (MCF7), අවම අත්‍යවශ්‍ය මාධ්‍යයක් වන MEM 5% කාබොන්ඩයොක්සයිඩ් පරිසරයක් තුල 10% භ්‍රෑණ ගව මස්තු, 1% පෙනිසිලින් ස්ට්‍රප්ටොමයිසින් භාවිතා කරමින් රසායනාගාර තුළ වර්ධනය කර ගන්නා ලදී. නැවුම් පොල් තෙල් සහ සෝයා තෙල් හෝ ජලය දිරවීම මඟින් නිපදවන මේද අම්ල හෝ ජලය 0.5µl බැගින් ග්ලූකෝස් මාධ්‍යයට එකතු කර දින 4ක් ප්‍රශස්ත තත්ත්වවල තබන ලදී. සෛල මඟින් ග්ලූකෝස් අවශෝෂණයට නැවුම් පොල්තෙල් සහ සෝයා තෙල්වල මේද අම්ලවල බලපෑම අධ්‍යයනය සඳහා වැය කරන ලද මාධ්‍යයේ ඉතිරි ග්ලූකෝස් සඳහා විශ්ලේෂණය කරන ලදී. මෙහිදී සෛල වල මාධ්‍යයේ ග්ලූකෝස් ප්‍රමාණය මේද අම්ල සාන්ද්‍රණය වැඩිවීමට සාපේක්ෂව අඩු වන බව තහවුරු විය.

පොල් ලෙලි තන්තු අතුරු නිෂ්පාදන යෙදීමෙන් සුව පහසු රබර් අත්වැසුම් සහ රබර් ආරක්ෂිත බූට් නිෂ්පාදනය සඳහා තාක්ෂණයක් අධ්‍යයනය කිරීම

පොල් සැකසුම් පර්යේෂණ අංශය

නැනෝ-ලෝහමය සහ නැනෝ-සෙලියුලෝස් සංශ්ලේෂණය

ශරීරයේ ආරක්ෂාව සඳහා රබර් සපත්තු සහ අත්වැසුම් භාවිතා වේ. උණුසුම්, නිවර්තන දේශගුණික තත්ත්වයන් තුළ, දහඩිය දැමීම හේතුවෙන් මෙම අයිතම පැළඳීම අපහසු විය හැකිය. ඊට අමතරව, පරිසරයේ සිටින ක්ෂුද්‍ර ජීවීන්ගෙන් ආරක්ෂාව ද ශරීර ආරක්ෂණ අයිතමවලින් අපේක්ෂා කෙරේ.

මෙම අධ්‍යයනයේ පරමාර්ථය වූයේ ශරීරයේ ආරක්ෂාව සහ සුවපහසු භාවිතය සඳහා ආරක්ෂක පා ආවරණ සහ රබර් අත්වැසුම් නිෂ්පාදනය සඳහා රබර් අමුද්‍රව්‍ය වට්ටෝරුව සඳහා කොහු කෙඳිවලින් අගය එක් කිරීමයි.කොහු රබර් සංයුක්ත නිෂ්පාදනයක් කිරීම සඳහා මි.මී 0-0.5 සහ මි.මී 0.5 - 1.0 දක්වා වූ දිග කොහු කෙඳි භාවිතා කර දිග ප්‍රමාණයේ යෝග්‍යතාවය විශ්ලේෂණය කරන ලදී. ප්‍රතිඵල පෙන්නුම් කළේ කළු කාබන්වලින් 40% (w/w) ප්‍රමාණයක් කොහු තන්තු වලින් ප්‍රතිස්ථාපනය කළ විට මි.මී 0-0.5 කොහු කෙඳිවලින් වැඩි ආතන්‍ය ශක්තියක් (13 ± 1 MPa) ලබාගත හැකි බවයි.

කොහු රබර් සංයුක්ත ද්‍රව්‍ය සඳහා ප්‍රතිබැක්ටීරියා ගුණය එක් කිරීම සඳහා හරිත සංශ්ලේෂණ ක්‍රමය භාවිතා කර රිදී (Ag) නැනෝ අංශු නිෂ්පාදනය කර, එහි ප්‍රති-ක්ෂුද්‍ර ජීවී ගුණය පරීක්ෂා කරන ලදී. Ag නැනෝ අංශු අඩංගු මාධ්‍ය මඟින් *Psudomanas* සහ *Escherichia coli* ක්ෂුද්‍ර ජීවීන් නිෂේධනය කරන ලදී. එබැවින් මෙය ආරක්ෂක පා ආවරණ සහ අත්වැසුම් සෑදීමේ පර්යේෂණ අත්හදා බැලීම් සඳහා භාවිතා කිරීමට බලාපොරොත්තු වේ.



සමාජ ආර්ථික පර්යේෂණ

පොල් මද, කෙඳි හා අනෙකුත් පොල් ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්තයන්හි ප්‍රවණතා

කෘෂි ආර්ථික විද්‍යා හා කෘෂි ව්‍යාපාර කළමනාකරණ අංශය

වර්තමානයේ පොල් වගාව ශ්‍රී ලංකා ආර්ථිකයට ප්‍රධාන දායකත්වයක් සපයයි. 2022 වසරේ වාර්ෂික දේශීය පොල් නිෂ්පාදනය ගෙඩි මිලියන 3,352 ක් වූ අතර, එය 2021 වසරේ වාර්තා වූ ඉහළම පොල් නිෂ්පාදනය වන ගෙඩි මිලියන 3,382.9 ට සාපේක්ෂව 1% ක අඩුවීමකි. ඒ අනුව විදේශ විනිමය ඉපැයීම 2022 වසරේදී රුපියල් බිලියන 263 (ඇමරිකානු ඩොලර් මිලියන 817) ක් වූ අතර, එය 2021 වසරේදී ඇමරිකානු ඩොලර් මිලියන 834 ක ඉපැයීම සමඟ සසඳන විට 2% ක පහත වැටීමක් ලෙස වාර්තා විය.

2021 වසරේ මෙට්‍රික් ටොන් 43,038ක් වූ පොල්තෙල් නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 68,587 දක්වා ඉහළ ගොස් ඇති අතර, එය 2021 වසරට සාපේක්ෂව 59% ක කැපී පෙනෙන වර්ධනයකි. පොල් කිරි අපනයනය පසුගිය වසරේ අපනයනය කළ ප්‍රමාණය වන මෙට්‍රික් ටොන් 53,255ට වඩා 1% කින් සුළු වශයෙන් අඩු වී ඇත. නැවුම් පොල් තෙල් කර්මාන්තයේ අපනයන පරිමාණයේ සැළකිය යුතු වර්ධනයක් පෙන්නුම් කර නොමැති අතර, දිසිදි පොල් නිෂ්පාදනයද පෙර වසරට සාපේක්ෂව 5% ක පමණ වර්ධනයක් පෙන්නුම් කර ඇත. පොල් මද නිෂ්පාදන සලකා බලන විට, දිසිදි පොල් සහ පොල් කිරි පිළිවෙලින් ඇමරිකානු ඩොලර් මිලියන 96.11 සහ 92.3 ක අපනයන ආදායමක් ඉපැයීම සඳහා කැපී පෙනෙන දායකත්වයක් ලබා දී ඇත.

පොල් කටු ආශ්‍රිත නිෂ්පාදන මඟින් උපයන ලද අපනයන ආදායම, 2021 වසරේදී ඇමරිකානු ඩොලර් මිලියන 148 සිට 2022 වසරේදී ඇමරිකානු ඩොලර් මිලියන 163 දක්වා 10% ක පමණ වර්ධනයක් පෙන්නුම් කරයි. කොහු කෙඳි ආශ්‍රිත නිමි භාණ්ඩවලින් උපයන ලද අපනයන ආදායම 2021 වසර හා සසඳන විට 2022 වසරේදී 1% කින් අඩු වීමක් පෙන්නුම් කෙරේ. කොහු කෙඳි ආශ්‍රිත නිමි භාණ්ඩ කාණ්ඩය යටතේ අපනයන ආදායමට වැඩිම දායකත්වයක් ලැබී ඇත්තේ අඹරන ලද කොහු නිෂ්පාදනවලින්ය.

බාද්‍ය තෙල් ආනයනය, වසරේ දෙවන භාගයට සාපේක්ෂව වසරේ මුල් භාගයේදී ඉහළ අගයක් පෙන්විය. සමස්ත බාද්‍ය තෙල් ආනයන අතුරින් 67% ක්ම පළමු මාස 6 තුළ ආනයනය කර ඇත.

පොදුවේ ගත් කල, පැවති සියලුම හිතකර නොවන පාරිසරික තත්ත්වයන් මධ්‍යයෙහි වුවද, පොල් නිෂ්පාදනයේදී, දේශීය පාරිභෝගිකයින්ට බාද්‍ය තෙල් සැපයීමේදී මෙන්ම විදේශ විනිමය ඉපැයීමේදී පොල් කර්මාන්තයේ ප්‍රගතිය ඉතා ඉහළ මට්ටමකින් වාර්තා විය.

පොල් වගාවේ ඇසේරියා මයිටා පාලනය කිරීම සඳහා විලෝපික මයිටා මුදා හැරීමේ බලපෑම පිළිබඳ අධ්‍යයනය (2019 - 2021)

කෘෂි ආර්ථික විද්‍යා හා කෘෂි ව්‍යාපාර කළමනාකරණ අංශය

ගොවිපළ පාදක තත්ත්වයන් යටතේ ඇසේරියා මයිටාවන් පාලනය කිරීම සඳහා විලෝපික මයිටාවන් මුදා හැරීමේ සඵලතාවය ඇස්තමේන්තු කිරීම සඳහා මෙම අධ්‍යයනය සිදු කරනු ලැබීය. දැනටමත් සිය රසායනාගාර තුළ විලෝපික මයිටාවන් අභිජනනය කිරීමේ නිරතව සිටින කුරුණෑගල වැවිලි සමාගමේ සහයෝගීතාවයෙන් මෙම පර්යේෂණය ආරම්භ කරන ලදී. පොල් පර්යේෂණ ආයතනය විසින් නිර්දේශ කර ඇති පරිදි විලෝපික මයිටාවන් මුදා හැරීම වසර දෙකක් අඛණ්ඩව සිදු කරනු ලැබූ අතර, 2019 සහ 2020 වර්ෂයන්හි පොල් නිෂ්පාදන දත්ත සංසන්දනය කරනු ලැබීය. පිළිවෙලින් 2019 සහ 2020 වසරවල මයිටා හානියට පත් සාමාන්‍ය ගෙඩි සංඛ්‍යාව මසකට 4.76 ක් සහ 3.62ක් විය. මෙය සැළකිය යුතු අඩු වීමකි ($P<0.05$). සම්පූර්ණ මිලට විකිණිය හැකි පොල් අතුරින් මයිටා හානියට පත් ගෙඩි ගණන මසකට සාමාන්‍ය ගෙඩි සංඛ්‍යාව 3.5 සිට 2.5 දක්වා අඩු වී ඇත. විලෝපික මයිටාවන් මුදා හැරීමේ අවශේෂ බලපෑම් ඇගයීම සඳහා මෙම පරීක්ෂණය 2021 වර්ෂයේදී අඛණ්ඩව පවත්වාගෙන යන ලදී. විලෝපික මයිටාවන් අවසන්වරට ක්ෂේත්‍රයට මුදා හරිනු ලැබුවේ 2020 වසාරේ ඔක්තෝම්බර් මාසයේදීය. 2021 වර්ෂය සඳහා පොල් නිෂ්පාදන දත්ත පවත්වාගෙන ගිය අතර, විලෝපික මයිටාවන් වසර දෙකක කාලයක් තුළ අඛණ්ඩව මුදා හැරීමෙන් පසුව විලෝපික මයිටාවන්ගේ බලපෑම ඉදිරි මාස තුනක කාලයක් පමණක් පැවතුණු බව දත්ත විශ්ලේෂණ මගින් පෙන්නුම් කරන ලදී. විලෝපික මයිටාවන් මුදා හැරීමෙන් මාස හයකට පසු මයිටා හානිය සැළකිය යුතු ලෙස වැඩි වී ඇති බව ප්‍රතිඵල මගින් අනාවරණය විය. ඇසේරියා මයිටාවන් මර්ධනය කිරීම සඳහා විලෝපික මයිටාවන් මුදා හැරීම සාර්ථකත්වයක් පෙන්වන බව මෙම අධ්‍යයනයෙන් පෙන්නුම් කල අතර, හානිය ඵලදායී ලෙස කළමනාකරණය කිරීම සඳහා විලෝපික මයිටාවන් අඛණ්ඩව මුදා හැරීම සහ මයිටා හානිය සිදු වී තිබේද යන්න නිතර පරීක්ෂා කිරීම අවශ්‍ය වනු ඇත.

අතිශය අවදානමට ලක්විය හැකි ප්‍රදේශවල දේශගුණික අවිනිශ්චිතතාවය යටතේ පොල් ආශ්‍රිත ගෙවතු ඵලදායීතාව වැඩිදියුණු කිරීම. (2019 - 2022)

කෘෂි ආර්ථික විද්‍යා හා කෘෂි ව්‍යාපාර කළමනාකරණ අංශය

මෙම අධ්‍යයනය කොටස් තුනකින් සමන්විත වන අතර, එහි එහි තුන්වන කොටස වන්නේ, තීරුබදු නොවන ක්‍රියාමාර්ග මඟින් පොල් නිෂ්පාදන අපනයනය සඳහා සිදු වන බලපෑම් ඇගයීමයි. ශ්‍රී ලංකාවේ පොල් මද ආශ්‍රිත නිෂ්පාදන සඳහා ප්‍රධානතම අපනයන ගමනාන්ත සංවර්ධිත රටවල් වේ. කෙසේ වෙතත්, අපනයනකරුවන් සැළකිය යුතු තීරු බදු නොවන ක්‍රියාමාර්ග ගණනකට අනුකූල විය යුතු බැවින්, සංවර්ධිත රටවල්හි වෙළඳපොළ වෙත ප්‍රවේශ වීම අභියෝගාත්මක වන අතර, එයට අනුකූල වීමට අසමත් වුවහොත්, නැවිගත කරන ලද භාණ්ඩ දේශසීමාවේදී ප්‍රතික්ෂේප වීමට හේතු විය හැක. ශ්‍රී ලංකාවේ පොල් මද ආශ්‍රිත නිෂ්පාදනවලින් 25% ක් යුරෝපා සංගමයට (EU) අපනයනය කරනු ලබන අතර, ආහාර හා සත්ත්ව ආහාර සඳහා වන වේගවත් අනතුරු ඇගවීමේ පද්ධතිය (RASFF), යුරෝපා සංගමයට අයත් සාමාජික රටවල් තුළ ආහාර

සුරක්ෂිතතාවය පිළිබඳ සහ දේශසීමාවේදී ප්‍රතික්ෂේප කිරීම් සම්බන්ධ තොරතුරු ගෙන හැර පායි. එබැවින්, මෙම අධ්‍යයනයේ පරමාර්ථය වනුයේ 2009 සිට 2021 දක්වා RASFF දැනුම්දීම් සම්බන්ධ දත්ත යොදාගෙන ශ්‍රී ලංකාවෙන් අපනයනය කරන ලද පොල් ආශ්‍රිත නිෂ්පාදන යුරෝපා සංගමයේ රටවල් වලට අපනයනය කිරීමේදී සිදුවන ප්‍රතික්ෂේප වීම් රටාව පිළිබඳව සොයාබැලීමයි.

විශ්ලේෂණ ප්‍රතිඵල වලට අනුව, යුරෝපා සංගමයට අයත් රටවල් හතකින් (ඉතාලිය, එක්සත් රාජධානිය, නෙදර්ලන්තය, ග්‍රීසිය, අයර්ලන්තය, පෝලන්තය සහ ඩෙන්මාර්කය) ගැටලු සහගත තත්ත්වයක් වාර්තා වූ අතර, ඒ අතරින් 35% ක් ඉතාලියෙන් ද, පසුව එක්සත් රාජධානියෙන් ද (23%) විය. දේශසීමාවේ දැනුම්දීම් වර්ග තුනක් ලැබී ඇති අතර එනම් : අ) දේශසීමාවේ ප්‍රතික්ෂේප කිරීම්, ආ) තොරතුරු මදකම සහ ඇ) අනතුරු ඇඟවීම් ය. එයින් 41% ක් දේශසීමාවේ ප්‍රතික්ෂේප කිරීම් වේ. දේශසීමාවේදී ප්‍රතික්ෂේප කිරීම් සඳහා හේතු වී ඇත්තේ ව්‍යාධිජනක ක්ෂුද්‍රජීවීන් සහ ක්ෂුද්‍රජීවීන් මගින් දූෂණය වීමය. ශ්‍රී ලංකාවේ පොල් මද ආශ්‍රිත නිෂ්පාදන අපනයනයේදී වාර්තා වූ වැදගත්ම ව්‍යාධිජනක ක්ෂුද්‍රජීවියා වූයේ සැල්මොනෙල්ලා වූ අතර, එය දේශ සීමා දැනුම් දීම් වලින් 23% කට හේතු විය. ඉහළම (24%) ප්‍රතික්ෂේප කිරීම් සංඛ්‍යාවක් 2012 සහ 2016 වර්ෂවලදී නිරීක්ෂණය කරනු ලැබූ අතර, 2019 සිට 2021 වර්ෂ දක්වා කිසිදු ප්‍රතික්ෂේප කිරීමක් සිදු නොවීය. යුරෝපා සංගමය (EU) යනු ශ්‍රී ලංකාවේ පොල් මද ආශ්‍රිත නිෂ්පාදන සඳහා ඇති ඉහළම අපනයන ගමනාන්තයක් වන බැවින්, ශ්‍රී ලංකාවේ අපනයනකරුවන් තීරුබදු නොවන ක්‍රියාමාර්ග වලට අනුකූල වීම සඳහා EU විසින් පනවන ලද ක්‍රියාමාර්ග, නිෂ්පාදන හා අපනයන ක්‍රියාවලිය මුළුල්ලෙහි අනුගමනය කළ යුතුය.

ශ්‍රී ලාංකික ගෘහස්ථ පාරිභෝගිකයින්ගේ බාද්‍ය තෙල් සහ පොල් පරිභෝජන රටාව හඳුනා ගැනීම

කෘෂි ආර්ථික විද්‍යා හා කෘෂි ව්‍යාපාර කළමනාකරණ අංශය

ශ්‍රී ලංකාවේ ග්‍රාමීය, නාගරික සහ වතු යන අංශයන්හි ගෘහාශ්‍රිත බාද්‍ය තෙල් සහ පොල් පරිභෝජනයේ වත්මන් රටාව පිළිබඳව සොයා බැලීම මෙම අධ්‍යයනයේ එක් අරමුණක් වේ. එබැවින්, අංශ තුනම ආවරණය වන පරිදි පොල් ත්‍රිකෝණය ආශ්‍රිතව මෙම අධ්‍යයනය සිදු කරන ලදී.

විවිධ බාද්‍ය තෙල් අතුරින් පොල් තෙල් බහුල ලෙස ගෘහාශ්‍රිතව භාවිතා වන බව ප්‍රතිඵල මඟින් අනාවරණය වූ අතර, පොල් තෙල් අනෙකුත් බාද්‍ය තෙල් වන පාම් තෙල්, සූරියකාන්ත තෙල් සහ ඔලිව් තෙල් සමඟද මාරුවෙන් මාරුවට භාවිතා කරනු ලබයි. වෙළඳපොළෙහි සුලභතාවය, ගුණාත්මකභාවය සහ සෞඛ්‍ය ගැටලු වැනි හේතූන් නිසා ගෘහස්ථ පාරිභෝගිකයින්ගෙන් 1% ක් පමණ පොල් තෙල් පරිභෝජනයෙන් වැළකී වෙනත් බාද්‍ය තෙල් සඳහා යොමුව ඇති බව නිරීක්ෂණය විය. පාරිභෝගිකයන් විසින් බාද්‍ය තෙල් තෝරා ගැනීමේදී ප්‍රධාන ලෙස සළකනු ලබන සාධක වන්නේ අනුපිළිවෙලින් වෙළඳපොළෙහි සුලභතාවය සහ පවතින මිල ගණන්ය. ආහාර වේල් තුනක් සඳහා පොල් තෙල් භාවිතා කිරීමට නගරාශ්‍රිත ගෘහස්ථ පාරිභෝගිකයින්ගේ වැඩි නැඹුරුතාවයක් දක්නට ලැබෙන අතර, ග්‍රාමීය ගෘහස්ථ පාරිභෝගිකයින් වේල් දෙකකට හෝ තුනකට ද, වතුකරයේ ගෘහස්ථ පාරිභෝගිකයින් වේල් දෙකකට ද සීමා වී ඇත. මාසික සාමාන්‍ය ඒක

පුද්ගල පොල් තෙල් සහ පොල් ගෙඩි පරිභෝජනය පිළිවෙලින් මිලි ලීටර් 230 ක් සහ ගෙඩි 11 ක් පමණ වූ අතර, එක් එක් අංශ අතර මාසික ඒක පුද්ගල පොල් තෙල් පරිභෝජනය සැළකිය යුතු වෙනසක් පෙන්නුම් කළේ නැත. කෙසේ වෙතත් අංශ තුන අතර ඒක පුද්ගල පොල් ගෙඩි පරිභෝජනයේ සැළකිය යුතු වෙනසක් ඇත. එසේම ගෘහස්ථ ආදායම වැඩිවීමත් සමඟ පොල් තෙල් මිලදී ගැනීමේ ප්‍රවණතාවයද සැළකිය යුතු මට්ටමකින් ඉහළ යන බව ($P<0.05$) අනාවරණය විය.

ආහාර සුරක්ෂිතතාවය සහතික කරමින් ඇසුරුම් ලේබල් කිරීම සඳහා පාරිභෝගිකයින්ගේ ගෙවීමට ඇති කැමැත්ත ඇස්තමේන්තු කිරීම : ශ්‍රී ලංකාවේ පොල් තෙල් වෙළඳපොළ

කෘෂි ආර්ථික විද්‍යා හා කෘෂි ව්‍යාපාර කළමනාකරණ අංශය

ශ්‍රී ලාංකිකයින් අතර ප්‍රධානතම මේදය සපයන ප්‍රභවයක් ලෙස පොල් තෙල් හැඳින්විය හැක. බාද්‍ය තෙල් වෙළඳපොළ ලිහිල් කිරීමත් සමඟ පොල් අස්වනු අඩු වන කාලසීමාවලදී බාද්‍ය තෙල් ආනයනය කිරීම සාමාන්‍ය ක්‍රමවේදය වී ඇත. මෙම අනෙකුත් බාද්‍ය තෙල් වර්ග පොල් තෙල් සමඟ නිතර මිශ්‍ර කිරීම්වලට භාජනය වන අතර, එය රටෙහි ආහාර සුරක්ෂිතතාවයට බලපෑමක් සිදු කරයි. තත්ත්වයෙන් බාල කළ පොල් තෙල් පරිභෝජනය මඟහරවා ගැනීම සඳහා සුරක්ෂිතතාවය තහවුරු වන ලේබලයක් පොල් තෙල් සඳහා නිර්මාණය කිරීම පැහැදිළි අගය එකතු කිරීමකි. එසේ හෙයින් ආහාර සුරක්ෂිතතාවය සහතික කරමින් පොල් තෙල් ඇසුරුම් ලේබල් කිරීම සඳහා පාරිභෝගිකයින්ගේ ගෙවීමට ඇති කැමැත්ත විමසීම ඉතා වැදගත් වේ. මෙම අධ්‍යයනයේ පරමාර්ථය වනුයේ ලේබල් කළ පොල් තෙල් සඳහා පාරිභෝගිකයින්ගේ අමතරව ගෙවීමට ඇති කැමැත්ත පිළිබඳ විශ්ලේෂණය කිරීමය. එමඟින් පාරිභෝගිකයින්ගේ මනාපයන් සහ විවිධ ආරක්ෂිත ලේබල් කිරීම් සඳහා ගෙවීමට ඔවුන්ගේ ඇති කැමැත්ත විමසා බැලීම සිදු විය. පාරිභෝගිකයින්ගේ සාමාන්‍ය මිලදීගැනීමේ රටාව යොදා ගනිමින් ඔවුන් ලේබල් කළ පොල් තෙල් සඳහා ගෙවීමට ඇති කැමැත්ත අධ්‍යයනය කරන ලදි.

විශ්ලේෂණවලට අනුව කුටුම්භ බහුතරයක් (72%), ගෘහස්ථ පරිභෝජනය සඳහා කර්මාන්තශාලා තුළ සකසන ලද, පිරිපහදු නොකල පොල් තෙල් භාවිතා කරන අතර එහි බහුතරයෙන් 84% ඇසුරුම් නොකරන පොල් තෙල් මිලදී ගැනීමට යොමු වී ඇත්තේ ඇසුරුම් කළ පොල් තෙල් නිෂ්පාදන හා ඇසුරුම් නොකළ පොල් නිෂ්පාදන සසඳන විට, ඇසුරුම් නොකළ පොල් තෙල් සාපේක්ෂව මිල අඩු වීම සහ ගෘහස්ථ පාරිභෝගිකයන්ගේ 18% ඇසුරුම් කොකළ පොල් තෙල් සෞඛ්‍යාරක්ෂිත බව විශ්වාස කිරීමත්ය. තවද, නාගරික අංශයට සාපේක්ෂව ග්‍රාමීය අංශයේ කුටුම්භ, ඇසුරුම් නොකරන ලද පොල් තෙල් මිලදී ගැනීමේ ප්‍රවණතාවයක් ඇත. පොල් තෙල් මිලදී ගැනීමේ තීරණයට බලපවත්වන සාධකයක් වූවද, මෑත කාලීනව ඇති වූ බාද්‍ය තෙල් මිශ්‍ර කිරීමේ ගැටලු හේතුවෙන් ආහාර සුරක්ෂිතතාවය සහතික කරන පොල් තෙල් ඇසුරුමක් සඳහා මිලක් ගෙවීමට ගෘහස්ථ පාරිභෝගිකයින් 72% ක් කැමැත්ත පළ කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය සහ පොල් සංවර්ධන අධිකාරිය යන ආයතන දෙක විසින්ම පොල් තෙල්වල ගුණාත්මකභාවය සහ සුරක්ෂිතතාවය සහතික කරන ලද ඇසුරුම් කළ සහ ලේබල් කරන ලද පොල් තෙල් බෝතලයක් සඳහා රුපියල් 98.00 ක වැඩිපුර මිලක් ගෙවීමට බහුතරයක් කුටුම්භ කැමැත්ත දක්වන බවට පෙනී යන ලදී.

සිදු වෙමින් පවතින පර්යේෂණ

දේශීය නැවුම් පොල් තෙල් නිෂ්පාදකයන් විසින් අපනයන වෙළඳපොළ තෝරා ගැනීමේදී බලපාන සීමා බාධක අධ්‍යයනය කිරීම

කෘෂි ආර්ථික විද්‍යා හා කෘෂි ව්‍යාපාර කළමනාකරණ අංශය

නැවුම් පොල් තෙල් සෞඛ්‍යමය වාසි ගෙනදෙන ආහාරයක් ලෙස ප්‍රචලිත වී ඇති අතර, එහි ක්‍රියාකාරීත්වය පිළිබඳ දැනුම සාමාන්‍ය ජනතාව අතර වර්ධනයක් දක්නට ඇත. නැවුම් පොල් තෙල් වල ඇති විශිෂ්ඨ රසය පමණක් නොව, එහි ඇති සෞඛ්‍ය ප්‍රතිලාභ ද, හේතුවෙන් මෙම තෙල් සඳහා වන ඉල්ලුමෙහි ඉහළ යෑමක් ඇති වන බවට පුරෝකථනය කර ඇත. කෙසේ වෙතත්, ගෝලීය වෙළඳපොළ තුළ මෙම කර්මාන්තයේ වර්තමාන දත්ත පැහැදිළිව පෙන්නුම් කරන්නේ ශ්‍රී ලංකාව එම තරඟකාරීත්වයෙන් ඉවත්ව යන බවයි. ශ්‍රී ලංකාවේ සමස්ත නැවුම් පොල් තෙල් අපනයන වෙළඳපොළ එහි ප්‍රධාන තරඟකරුවන්ට සාපේක්ෂව අඛණ්ඩව පහත වැටෙමින් පවතී. එබැවින්, නැවුම් පොල් තෙල් නිෂ්පාදකයින් විසින් කර්මාන්තය තුල මුහුණ දෙන සීමා බාධක සහ අභියෝග හඳුනාගෙන නැවුම් පොල් තෙල් අපනයනය කර්මාන්තය ශක්තිමත් කිරීම සඳහා මග පෑදීම මෙම අධ්‍යයනය මඟින් අරමුණු කර ඇත.

ශ්‍රී ලංකාවේ කොහු නිෂ්පාදන සඳහා අගය එකතු කිරීමේදී අපනයන කරුවන්හට බලපාන සාධක විශ්ලේෂණය කිරීම

කෘෂි ආර්ථික විද්‍යා හා කෘෂි ව්‍යාපාර කළමනාකරණ අංශය

ශ්‍රී ලංකාව කොහු නිෂ්පාදනයේ යෙදෙන ප්‍රමුඛතම රටක් ලෙස දැක්විය හැක. කොහු, පොල් ගෙඩියේ අතුරු ඵලයක් වන අතර, කොහු කර්මාන්තය ශ්‍රී ලංකාවේ පාරම්පරික කර්මාන්තයක් ලෙස සැළකේ. ශ්‍රී ලංකාව තුළ ප්‍රධාන කාණ්ඩ හතරක් යටතේ කොහු නිෂ්පාදනය කෙරේ. එනම්, බ්‍රිස්ටල්, ඕමැට්, මිශ්‍ර සහ ගුදිරි කොහු වේ. මෙම කොහු ජාත්‍යන්තර වෙළඳපොළේ අමුද්‍රව්‍ය ලෙස පමණක් නොව කොසු, බුරුසු, ලණු, වියන ලද ලණු, පැදුරු, කොහු කඹ, රබර් මිශ්‍රිත කොහු මෙට්ට, මිහි සළු ආදී වශයෙන් අගය එකතු කළ නිෂ්පාදන ලෙසද විකුණනු ලැබේ. වර්ෂ 1900 කාල වකවානුව තුළ කාර්මික කොහු නිෂ්පාදනය මෙරටට හඳුන්වා දීමෙන් පසු, ගෝලීය කොහු වෙළඳපොළට අමු කොහු කෙඳි සහ කොහු කෙඳි ආශ්‍රිත නිෂ්පාදන සපයන ප්‍රධාන සැපයුම්කරුවන් වූයේ ශ්‍රී ලංකාවේ කොහු නිෂ්පාදකයන්ය. වර්තමානයේ ශ්‍රී ලංකාව කොහු අමුද්‍රව්‍යයක් ලෙස බහුල වශයෙන් අපනයනය කරන අතර, එයට අගය එකතු කිරීම ශ්‍රී ලංකාවේ ප්‍රධාන තරඟකරුවා වන ඉන්දියාවට සාපේක්ෂව ඉතා අඩු මට්ටමක පවතී. එය ඉන්දියාවේ සිටින තරඟකරුවන්ට සාපේක්ෂව අඩු ආදායමක් උත්පාදනය කිරීමට හේතු වී ඇත. එබැවින්, කොහු නිෂ්පාදන අපනයනකරුවන්ගේ අගය එකතු කිරීමේ තීරණයට බලපාන සාධක විශ්ලේෂණය කිරීමත්, කොහු අපනයන කර්මාන්තයේ ඇති ගැටලු සහ විභවයන් හඳුනා ගැනීමත් අරමුණු කර ගනිමින්, අගය එකතු කිරීමට සම්බන්ධ වන සහ නොවන කොහු නිෂ්පාදකයන් සමඟ මෙම අධ්‍යයනය සිදු කිරීමට අරමුණු කෙරේ. මෙම අධ්‍යයනය දැනට ක්‍රියාත්මක කරමින් පවතී.

මීරා මත පදනම් වූ කර්මාන්ත සංවර්ධනය කිරීම සඳහා අගය දාම විශ්ලේෂණය හා ප්‍රතිපත්ති යෝජනා කිරීම

කෘෂි ආර්ථික විද්‍යා හා කෘෂි ව්‍යාපාර කළමනාකරණ අංශය

මීරා යනු පොල් ගසේ විවෘත නොවූ පුෂ්ප මංජරිය කැපීම මඟින් ලබා ගන්නා සීනි අඩංගු ද්‍රාවණයක් වන අතර, එය සාරවත් පානයක් වන පොල් රා නිෂ්පාදනය කිරීමට යොදා ගැනේ. විනාකිරි, පොල් පැණි, හකුරු සහ සීනි නිෂ්පාදනය කිරීමට ද, මීරා භාවිතා කෙරේ. මේ අතරින් රා නිෂ්පාදනය, ඉතාමත් ලාභදායී වන අතර, පොල් ගෙඩි නිෂ්පාදනය මත රඳා පවතිනවාට වඩා විකල්ප ආදායම් මාර්ගයක් ලෙස වගාකරුවන් හට පවත්වාගෙන ගිය හැක. දැනට පවතින මීරා ආශ්‍රිත කර්මාන්තය ව්‍යාප්ත කිරීමේ විභවයක් ඇතත්, කර්මාන්තය තවමත් ළදරු අවධියක පවතී. කර්මාන්තය ශක්තිමත් කිරීම සඳහා, එහි වැඩිදුර වර්ධනයට ඇති හැකියාව ගවේෂණය කිරීම හා පවතින අගය දාමය පිළිබඳව පුළුල් විශ්ලේෂණයක් කිරීම අවශ්‍ය වේ.

මෙම අධ්‍යයනය තුළින් අගය දාමයේ ක්‍රියාකාරීන් හා ඔවුන්ගේ ක්‍රියාකාරකම් හඳුනාගැනීම සහ කර්මාන්තයේ සංවර්ධනයට නීතිමය, සාමාජීය සහ කළමනාකරණ රාමුව සමඟ බැඳී ඇති සීමාවන් ද හඳුනා ගැනීම අරමුණු කරන අතර, රා මැදීම සඳහා දැරීමට සිදු වන පිරිවැය පිළිබඳවද විශ්ලේෂණයක් සිදු කෙරේ. එපමණක් නොව, මීරා මත පදනම් වූ කර්මාන්ත සංවර්ධනය සඳහා ඇති හැකියාව සහ අවස්ථා ගවේෂණය කිරීමට ද අපේක්ෂා කෙරේ, රා මැදීම ප්‍රචලිතව පවතින මාදම්පේ, කටාන, බේරුවල, පානදුර සහ කළුතර යන ප්‍රදේශවල ප්‍රශ්නාවලියක් උපයෝගි කරගනිමින් සමීක්ෂණයක් සිදු කරන ලද අතර එහි දත්ත විශ්ලේෂණය සිදුකරමින් පවතී.

පර්යේෂණ සංවර්ධනයන්



ජීව බලශක්ති නිෂ්පාදන ආදර්ශන

ශෂ්‍ය විද්‍යා අංශය

මෙම ආදර්ශනය රත්මලාගාර පර්යේෂණ මධ්‍යස්ථානයේ පොල් ගස් 150 ක් සහ ග්ලිරිසීඩියා ශාක 2500 කින් සමන්විත හෙක්ටයාර් එකක පොල් වගා භූමි ප්‍රමාණයක නිර්මාණය කර ඇති අතර එහි සිටින මී ගවයින් සයදෙනා සඳහා පිටතින් ගෙන එනු ලබන පිදුරු සපයයි. මෙම පද්ධතියේ තිබෙන ග්ලිරිසීඩියා දර බලශක්තිය නිපදවීම සඳහාත් ගොම ජීව වායුව නිපදවීම සඳහාත් යොදා ගනී. ජීව වායුව නිපදවීමේ දී සෑදෙන අතුරුඵලය පොල් ගස් සඳහා පොහොරක් ලෙස භාවිතා කරයි. මෙම ආදර්ශනය දැනට වගාකරුවන්ට ප්‍රායෝගිකව දැනුම ලබා දීම සඳහා යොදාගනී.





රූපය 1. රත්මලාගාර පර්යේෂණ මධ්‍යස්ථානයේ ග්ලිරිසීඩියා වගාව සහ ජෛව බලශක්ති නිෂ්පාදන ඒකකය

ඒකාබද්ධ සත්ත්ව පාලන ආදර්ශන

ශෂ්‍ය විද්‍යා අංශය

කුඩා වතු හිමියන්ගේ ආදායම ඉහළ නැංවීම සඳහා පොල් ඉඩම්වල ඒකාබද්ධ සත්ත්ව පාලනය යොදා ගත හැකිය. වගාකරුවන් මේ සම්බන්ධයෙන් දැනුවත් කිරීම අරමුණු කරගෙන, එළුවන් හා බැටළුවන් ඇති කිරීමේ ආදර්ශන රත්මලාගාර පර්යේෂණ මධ්‍යස්ථානයේ පවත්වා ගෙන යනු ලබයි. මෙය පොල් ඉඩම්වල ගැටළුකාරී වල් පැළෑටි කළමනාකරණය කිරීමට සහ පසෙහි සාරවත් බව වැඩි කිරීම සඳහා ඵලදායී වේ. මෙහි

සතුන් 50 ක පමණ ප්‍රමාණයක් නිදැලි ක්‍රමයට හා CO-3 තෘණ කොටු තුළ ඇති කරනු ලබයි.



රූපය 2. රත්මලාගාර පර්යේෂණ මධ්‍යස්ථානයේ එළු සහ බැටළු පාලන ආදර්ශන

සත්ත්ව ආහාර සඳහා තෘණ වගා ආදර්ශන

ශෂ්‍ය විද්‍යා අංශය

පොල් ඉඩම්වල සත්ත්ව පාලනය කළමනාකරණය කිරීම පිළිබඳව දේශීය ප්‍රජාවගේ, පොල් වගාකරුවන්ගේ, විශ්ව විද්‍යාල, කෘෂිකාර්මික හා පාසල් සිසුන්ගේ දැනුම හා දැනුවත්භාවය වැඩි දියුණු කිරීම සඳහා රත්මලාගාර සහ බණ්ඩිරිප්පුව පර්යේෂණ මධ්‍යස්ථානවල ආවරණ භෝග, තෘණ හා රනිල භෝග ක්ෂේත්‍ර ආදර්ශන දෙකක් පවත්වා ගෙන යනු ලබයි.



රූපය 3. රත්මලාගාර සහ බණ්ඩිරිප්පුව පර්යේෂණ මධ්‍යස්ථානවල තෘණ වගා ආදර්ශන

පණු පොහොර නිෂ්පාදන ඒකකය

ශෂ්‍ය විද්‍යා අංශය

පොල් වගාවේ සුලභව ඉවත් වන අපද්‍රව්‍ය වන, වල් පැළෑටි සහ සත්ත්ව අපද්‍රව්‍ය යොදා ගනිමින් කෙටි කාලයක් තුළදී පෝෂක වලින් පොහොසත් පණු පොහොර නිෂ්පාදනය සිදු කිරීම සඳහා රත්මලාගාර පර්යේෂණ මධ්‍යස්ථානයේ පණු පොහොර නිෂ්පාදන ආදර්ශන ඒකකයක් පවත්වාගෙන යනු ලබයි. බිම් පණුවන් ගුණනය කිරීමත්, පර්යේෂණ සහ ආදර්ශන අරමුණු සඳහා පණු පොහොර නිෂ්පාදනය කිරීමත් මෙහිදී සිදු කරයි. මෙමඟින් වගාකරුවන් වෙත පණුවන් බෙදා දෙන අතර, වගාකරුවන්, විශ්ව විද්‍යාල, කෘෂිකාර්මික විද්‍යාල සහ පාසල් සිසුන්ට දැනුම ලබා දීම සඳහා ආදර්ශනයක් ලෙස ද භාවිතා කරනු ලබයි.



රූපය 4. රත්මලාගාර පර්යේෂණ මධ්‍යස්ථානයේ පණු පොහොර නිෂ්පාදනය

අතුරු භෝග වගා ආදර්ශන

ශෂ්‍ය විද්‍යා අංශය

පොල් ඉඩම්වල අතුරු භෝග වගාව පිළිබඳව වගාකරුවන්, විශ්ව විද්‍යාල, කෘෂිකාර්මික සහ පාසල් සිසුන් හට දැනුම ප්‍රචලිත කිරීම සඳහා, අතුරු භෝග ආදර්ශන ඒකකයන් 20 කට අධික ප්‍රමාණයක් මාකඳුර සහ රත්මලාගාර පර්යේෂණ මධ්‍යස්ථානයන්හි සාර්ථක ලෙස පවත්වාගෙන යනු ලැබේ. මෙම ආදර්ශන අපනයන භෝග, පලතුරු භෝග, දැව භෝග සහ තෘණ වලින් සමන්විත වේ.



රූපය 5. මාකඳුර සහ රත්මලාගාර පර්යේෂණ මධ්‍යස්ථානවල අතුරු භෝග ආදර්ශනයන්

දෙමුහුම් සහ වැඩිදියුණු කළ පොල් ප්‍රභේදවල ජාතික බීජ පොල් නිෂ්පාදනය වැඩි කිරීම

CRIC60 නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා ශ්‍රී ලංකා යුද්ධ හමුදාව සමග එක්ව කන්දකාඩු බීජ පොල් උයන ස්ථාපනය කිරීම.

ප්‍රවේණි හා ශාක අභිජනන අංශය

ශ්‍රී ලංකාවේ මහා පරිමාණ වතු සඳහා නිර්දේශ කරනු ලබන ප්‍රධානම පොල් ප්‍රභේදය CRIC60 වේ. මේ වන විට වාර්ෂිකව CRIC60 බීජ පොල් මිලියන 1.5 අතර ප්‍රමාණයක් නිෂ්පාදනය සිදු කරනු ලබන අතර ඒවා නිෂ්පාදනය සිදු කරන්නේ පොල් පර්යේෂණ ආයතනයට අයත් අඹකැලේ හා මාදුරුඔය බීජ පොල් උයන් මගිනි. වසරකට ජාතික බීජ පොල් අවශ්‍යතාව සාමාන්‍යයෙන් මිලියන 04ක් ලෙස හඳුනා ගෙන ඇති අතර මෙම හිඟය සපුරාලීම සහ විවිධ වතුවලින් ලබාගන්නා "සරු පොල්" (Plus Palm) බීජ භාවිතා කරයි. "සරු පොල්" බීජ ලෙස භාවිතයේදී ගුණාත්මය පවත්වා ගැනීම හා තහවුරු කිරීම අපහසු වේ.

CRIC60 බීජ පොල්වල පවතින හිඟය සපුරාලීම සඳහා ශ්‍රී ලංකා යුද්ධ හමුදාව සමග එක්ව, නව බීජ පොල් උයනක් වැලිකන්ද කන්දකාඩු ශ්‍රී ලංකා යුද්ධ හමුදා කඳවුරේදී ස්ථාපනය කිරීම ආරම්භ කරන ලදි. මෙය අක්කර 100ක භූමි ප්‍රමාණයකින් සමන්විත වන අතර 2022 වර්ෂයේදී අක්කර 25 භූමි ප්‍රමාණය සඳහා අවශ්‍ය පැළ නිෂ්පාදනය හා එහි බිම් සැකසුම් කටයුතු නිම කරන ලදී. පොල් පැළ රෝපණය කිරීමේ කටයුතු තවදුරටත් සිදුකරමින් පවතී.



රූපය 6. කන්දකාඩු යුධ හමුදා කඳවුරේ මව් පොල් පැළ රෝපණය

දෙමුහුම් පොල් බීජ නිෂ්පාදනය සඳහා තෙත් අතරමැදි කලාපයේ කාර්ල්ස්ෆීල්ඩ් බීජ පොල් උයන ස්ථාපනය කිරීම

ප්‍රවේණි හා ශාක අභිජනන අංශය

වැවිලි අමාත්‍යාංශයේ ප්‍රතිපාදන යටතේ කප්සුවය බීජ පොල් නිෂ්පාදනය සඳහා මෙම ව්‍යාපෘතිය ආරම්භ කරන ලද්දේ 2021 වර්ෂයේදී, කුරුණෑගල වැවිලි සමාගම සමගිනි. 2022 වර්ෂයේදී, අක්කර 20ක භූමි ප්‍රමාණයක උස වර්ගයේ පැළ රෝපණය කරන ලදී. රට තුළ පැවති ඉන්ධන අර්බුදය හේතුවෙන් බීජ පොල් උයන වටා වැට ඉදිකිරීම හා ජලනළ පද්ධතියේ වැඩ කටයුතු නිම කිරීම තරමක් ප්‍රමාද විය. නමුත්, වර්ෂයේ අවසාන කාර්තුවේදී මෙම ක්‍රියාවලි දෙකෙහිම සැළකිය යුතු ප්‍රගතියක් ලබා ගන්නා ලදී.



රූපය 7. කාර්ල්ස්ෆීල්ඩ් බීජ පොල් උයනේ පැළ රෝපණය

කිනියම බීජ පොල් උයන වැඩිදියුණු කිරීම

ප්‍රවේණි හා ශාක අභිජනන අංශය

කප්රුවන බීජ පොල් නිෂ්පාදනය සඳහා, 2013 වර්ෂයේදී ශ්‍රී ලංකා පොල් පර්යේෂණ ආයතනය සහ හලාවත වැවිලි සමාගම එක්ව කිනියම බීජ පොල් උයන ස්ථාපනය කරන ලදි.

2022 වර්ෂයේදී කොළ කුන්දිරා ගස් 100ක අත්පරාගනය මගින් කප්රුවන බීජ පොල් නිෂ්පාදනය සිදු කිරීම ආරම්භ කරන ලද අතර බීජ පොල් උයනේ පැවති කොළ කුන්දිරා සහ සැන්රාමන් පුරප්පාඩු 1000ක් පමණ පිරවීමත්, ජලය සැපයීම සඳහා ඇති ජලනළ පද්ධතිය අලුත්වැඩියා කිරීමත්, පළිබෝධ කළමනාකරණය කිරීමත් සාර්ථකව සිදු කරන ලදී.



රූපය 8. කිනියම බීජ පොල් උයන

පුද්ගලික අංශය සමග එක්ව දෙමුහුම් පොල් බීජ නිෂ්පාදනය ඉහළ නැංවීම

ප්‍රවේණි හා ශාක අභිජනන අංශය

ශ්‍රී ලංකා පොල් පර්යේෂණ ආයතනය, පුද්ගලික අංශය සමග එක්ව දෙමුහුම් බීජ නිෂ්පාදන ක්‍රියාවලියේ ආරම්භය සනිටුහන් කරමින්, 2022 වර්ෂයේදී CIC පුද්ගලික සමාගම සමග එක්ව CRIC65 දෙමුහුමට අයත් බීජ අත්පරාගනයෙන් නිපදවීම ආරම්භ කරන ලදී.

මේ සඳහා CIC පුද්ගලික සමාගමට අයත් පැල්වෙහෙර ගොවිපළෙහි පවතින ශ්‍රී ලංකා උස වර්ගයට අයත් ගස් 300ක් තෝරා ගන්නා ලදී. අත්පරාගනය සඳහා අවශ්‍ය පරාග සහ අවශ්‍ය තාක්ෂණික දැනුම ශ්‍රී ලංකා පොල් පර්යේෂණ ආයතනය මගින් නොමිලේ ලබාදෙනු ලැබේ.

පොල් පර්යේෂණ ආයතනයේ වතුවල දෙමුහුම් නිෂ්පාදනය සඳහා යොදා ගන්නා මව් ශාක සංචිතය වැඩිකිරීම මගින් දෙමුහුම් බීජ නිෂ්පාදනය ඉහළ නැංවීම

ප්‍රවේණි හා ශාක අභිජනන අංශය හා වතු කළමණාකරණ අංශය

දෙමුහුම් බීජ නිෂ්පාදනය ඉහළ නැංවීමේ අරමුණින් 2022 වසරේ විශේෂ සංවර්ධන ව්‍යාපෘතියක් ලෙස දෙමුහුම් නිෂ්පාදනය සඳහා යොදා ගන්නා මව් ශාක සංචිතය වැඩිකිරීමේ වැඩසටහනක් ආරම්භ කොට ක්‍රියාත්මක කරන ලදී.

පොල් පර්යේෂණ ආයතනය මගින් නිපදවන දෙමුහුම් බීජ ප්‍රමාණය 400,000 දක්වා ඉහළ නැංවීමේ අරමුණින් ආරම්භ කරන ලද මෙම ව්‍යාපෘතිය යටතේ මේ වනවිට දෙමුහුම් නිෂ්පාදනය සඳහා ගස් 6150කින් සමන්විත මව් ශාක සංචිතයක් තෝරා අවසන් කර ඇත. මව් ගස් 5000 කට වැඩි ප්‍රමාණයක අත්පරාගන කටයුතු මේ වනවිට සිදුකරමින් පවතින අතර 2023 වසරේ ජනවාරි සිට අලුතින් ඇතුළත් කරන ලද මව් ගස් වල බීජ නෙළීම ආරම්භ කිරීමට නියමිතය.

පටක රෝපිත පැළ නිපදවීමේ පරිමාණය වැඩි කිරීම

පටක රෝපණ අංශය

පටක රෝපිත පැළ නිපදවීමේ පරිමාණය වැඩි කිරීම සඳහා නියමු ව්‍යාපෘතියක් ආරම්භ කරන ලදී. පටක රෝපිත පැළ නිපදවීම පස් ගුණයකින් වැඩි කිරීමේ අපේක්ෂාවෙන් පටක රෝපණ විද්‍යාගාරයේ පහසුකම් වැඩි දියුණු කිරීමට සැලසුම් කරන ලදී. පටක රෝපණ විද්‍යාගාරය නව ගොඩනැගිල්ලක ස්ථාපිත කිරීමට හැකි විය. මුල් මාස 5 තුළදී ළපටි පුෂ්ප රෝපිත 62 ක් රෝපණය කර ඉදිරියට පවත්වා ගන්නා ලදී.

අරමුදල් සීමා කිරීම හේතුවෙන් මිලදී ගැනීමට සැලසුම් කරන ලද බොහෝ උපකරණ මිලදී ගැනීම අවලංගු කිරීමට සිදු විය. ආනයන සීමා කිරීම් හේතුවෙන් ඇණවුම් කරන ලද රසායන ද්‍රව්‍ය වසර අවසානය වන තුරු ලබා ගත නොහැකි විය. එම නිසා, අවසාන මාස තුළදී නව රෝපිත රෝපණය කිරීම සීමා කිරීමට සිදු විය.




රූපය 9. පටක රෝපිත පැළ පරිමාණය වැඩ කිරීම

පොල් ඵලදාව පුරෝකථනය කිරීම 2023

ශාක කායික විද්‍යා අංශය

2022 වසරට සාපේක්ෂව 2023 වසරේ ඵලදාවේ අපේක්ෂිත වෙනස පොල් වගා කරන ප්‍රධාන දිස්ත්‍රික්ක වල නිරීක්ෂණය කරන ලද ගෙඩි හට ගැනීමේ දත්ත සහ ගෙඩි වල පැවැත්මේ අනුපාතය මත පදනම්ව පුරෝකථනය කරන ලදී.ඒ අනුව දිස්ත්‍රික්ක වශයෙන් අස්වැන්න සලකා බලන විට 2022 වසරට සාපේක්ෂව 2023 වසරේ මුල් මාස 8 තුළ කරුණෑගල ,ගම්පහ සහ පුත්තලම දිස්ත්‍රික්ක වල පිළිවලින් 6%,15%,19% අස්වැන්න අඩු වීමක් පෙන්නුම් කරනු ඇත. 2023 වසරේ ද අගෝස්තු දක්වා ජනවාරි / පෙබරවාරි සඳහා (පලමු මුරය) 466.4 ± 28.7,මාර්තු/අප්‍රියෙල් (දෙවන මුරය) 633.4 ± 37.3,මැයි/ජුනි සඳහා (තුන්වන මුරය) 529.8 ± 38.5 සහ ජූලි /අගෝස්තු (හතරවන මුරය) 479.6 ± 26.9 ක් වේ. ඒ අනුව 2023 ජනවාරි සිට අගෝස්තු දක්වා අපේක්ෂිත මුළු ඵලදාව ගෙඩි මිලියන 2109.1 ± 35.5 වේ.පෙර වසරට වඩා තරමක් ඉහළ ඵලදාවක් පෙන්නුම් කරන දෙවන මුරය හැර අනිකුත් සියලුම මුරයන්හිදී 2022 වසරට වඩා සැලකිය යුතු ලෙස අඩු වනු ඇත .එබැවින් , අගෝස්තු මාසය දක්වා අපේක්ෂිත මුළු නිෂ්පාදනය (2109.1 ± 35.5) 2022 වසරට සාපේක්ෂව 14%ක පමණ අඩු වීමක් වනු ඇත.



රූපය 10. 2023 වසරේ (අගෝස්තු දක්වා) අපේක්ෂිත ද්වීමාසික ඵලදාව 2022 වසරේ එම කාලය තුළ නිරීක්ෂිත ද්වීමාසික ඵලදාව අතර සංසන්දනය.

තාක්ෂණ හුවමාරු කටයුතු



යහපත් කෘෂිකාර්මික භාවිතයන් සහ ගෘහස්ථ පොල් නාස්තිය අවම කිරීම සඳහා මාධ්‍ය ප්‍රචාරණ කටයුතු

තාක්ෂණ හුවමාරු අංශය

යහපත් කෘෂිකාර්මික පිළිවෙත් (GAPs) පිළිබඳව සහ ගෘහස්ථ පොල් නාස්තිය අවම කිරීම පිළිබඳව සාමාන්‍ය ජනතාව දැනුවත් කිරීම සඳහා සමාජ සහ ජන මාධ්‍ය යොදා ගනිමින් මාධ්‍ය ප්‍රචාරණයක් පවත්වන ලදී. පොල් පර්යේෂණ ආයතනයේ අංගසම්පූර්ණ මාධ්‍ය ඒකකයක් ස්ථාපිත කරන ලද අතර, ආයතනයේ ෆේස් බුක් පිටුව සහ වෙබ් අඩවිය ජාත්‍යන්තර මට්ටමට උසස් කරන ලදී. පොල් පර්යේෂණ ආයතනයේ මාධ්‍ය ඒකකය මඟින් වීඩියෝ කිහිපයක් සකස් කරන ලදී.



රූපය 1. පොල් පර්යේෂණ ආයතනයේ නව වෙබ් අඩවිය

තාක්ෂණ හුවමාරු අංශය මඟින් පවත්වනු ලැබූ තාක්ෂණ හුවමාරු කටයුතු

පොල් වගාව සහ අගය එකතු කිරීම පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව

තාක්ෂණ හුවමාරු අංශය, ශාක කායික විද්‍යා අංශය, වගා සංරක්ෂණ අංශය, ශෂ්‍ය විද්‍යා අංශය, පටක රෝපණ අංශය, ප්‍රවේණි හා ශාක අභිජනන අංශය, පාංශු හා ශාක පෝෂණ අංශය, පොල් සැකසුම් පර්යේෂණ අංශය, කෘෂි ආර්ථික විද්‍යා හා කෘෂි ව්‍යාපාර කළමනාකරණ අංශය

කොවිඩ් 19 තත්ත්වයෙන් සහ ඉන්ධන අර්බුදයෙන් ඒල්ල වූ පීඩනය යටතේ වුවද,

මෙම වැඩසටහන සාර්ථකව නිම කරන ලදී. මෙම වසර තුළ වැඩ සටහන් අටක් (තාක්ෂණ හුවමාරු අංශය මඟින් සම්බන්ධීකරණය ලද) පැවැත්වූ නමුත් භෞතිකව පවත්වනු ලැබුවේ පළමු සහ අවසාන වැඩසටහන් පමණි. රටේ පැවති ඉන්ධන අර්බුධය හේතුවෙන් ඉතිරි වැඩසටහන් zoom තාක්ෂණය භාවිතයෙන් අතථ්‍ය පදනම මත පවත්වන ලදී.

පර්යේෂණ ව්‍යාප්ති සංවාද

තාක්ෂණ හුවමාරු අංශය

තාක්ෂණ හුවමාරු අංශය විසින් ජූලි 20 වැනි දින, පොල් වගා කිරීමේ මණ්ඩලයේ මාරවිල, කුරුණෑගල, කුලියාපිටිය, කෑගල්ල සහ ගම්පහ ප්‍රාදේශීය කළමනාකරණ කලාපවල (RM region) ක්ෂේත්‍ර ව්‍යාප්ති කාර්ය මණ්ඩලය සඳහාද, සැප්තැම්බර් 28 වන දින ගාල්ල, මාතර, හම්බන්තොට, කළුතර, මොණාරාගල සහ රත්නපුර ප්‍රාදේශීය කළමනාකරණ කලාපවල පොල් සංවර්ධන නිලධාරීන් සඳහාද වෙන් වෙන්ව zoom තාක්ෂණය ඔස්සේ පර්යේෂණ ව්‍යාප්ති සංවාද දෙකක් පවත්වන ලදී.

අගය එකතු කළ පොල් නිෂ්පාදන පිළිබඳ පුහුණු වැඩ සටහන්

තාක්ෂණ හුවමාරු අංශය

මෙම වසර තුළ දී කර්ටාස් ශ්‍රී ලංකා (රාජ්‍ය නොවන සංවිධානය) සහ විද්‍යාත්මක මධ්‍යස්ථාන සමඟ එක්ව යෞවනයන්, කාන්තා සංවිධාන සහ ග්‍රාමීය ව්‍යවසායකයන් සඳහා පුහුණු වැඩසටහන් හයක් (පුහුණුලාභීන් 156 ක්) පවත්වන ලදී.

ඉරුදින පුවත්පත් සමඟ පත්‍රිකා බෙදාහැරීම

තාක්ෂණ හුවමාරු අංශය

අංශය විසින් විවිධ පණිවිඩ රැගත් පත්‍රිකා 20,500 ක් කඹුරුගමුව, අහංගම, ගාල්ල, මීගමුව, කොච්චිකඩේ, කඳාන, ජා ඇල, සීදුව, කෑගල්ල සහ පොල්ගහවෙල යන ප්‍රදේශයන්හි බෙදාහරින ලදී.

පාසල් අධ්‍යාපනික වැඩසටහන්

තාක්ෂණ හුවමාරු අංශය

අධ්‍යාපන චාරිකා සඳහා පාසල් සිසුන් අතර ජනප්‍රිය විද්‍යාත්මක ඉගෙනුම් ගමනාන්තයක් බවට පොල් පර්යේෂණ ආයතනය පත්වී ඇත. ඉන්ධන අර්බුධය නිසා මෙම වසර තුළ ආයතනයට පැමිණියේ පාසල් පහක් (සිසුන් සහ ගුරුවරුන් 580) පමණි.

විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා අධ්‍යාපනික වැඩසටහන්

තාක්ෂණ හුවමාරු අංශය

අංශය විසින් විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතනවල සිසුන් සඳහා ප්‍රායෝගික පුහුණු වැඩසටහන් හයක් පවත්වන ලදී.

විශ්වවිද්‍යාල	කෘෂිකාර්මික පාසල්
ජාතික වැවිලි කළමනාකරණය පිළිබඳ ආයතනය	ගබඩාවත්ත කෘෂිකාර්මික පාසල
වයඹ විශ්වවිද්‍යාලය	වල්පිට කෘෂිකාර්මික පාසල
විවෘත විශ්වවිද්‍යාලය	තාක්ෂණ විද්‍යාලය - වරකපොළ

ප්‍රදර්ශන සහ බෝග සායන

තාක්ෂණ හුවමාරු අංශය

පොල් වගාව, කළමනාකරණය සහ සැකසුම් තාක්ෂණය ප්‍රවර්ධනය කිරීම සඳහා අංශය විසින් මෙම වසර තුළ කොළඹ, හලාවත සහ බෝතලේගම ප්‍රදේශවල පැවති ප්‍රදර්ශන සහ බෝග සායන තුනක් සඳහා සහභාගී විය.

මුද්‍රණ සහ ප්‍රකාශන

තාක්ෂණ හුවමාරු අංශය

මෙම වර්ෂය තුළ පහත මුද්‍රිත ද්‍රව්‍ය ප්‍රකාශයට පත්කර ඇත.

1. කප්රුක අත්පොත
2. පොල් පවත්
3. කෙටි වාර්ෂික වාර්තාව 2020
4. සහතික පත්‍ර පාඨමාලාවේ 1 සහ 2 පොත්

අංශයේ ඒකකය මඟින් රු. 848,320.00 ක් වටිනා අනෙකුත් අංශවල මුද්‍රණ කාර්යයන් 64 ක් භාරගන්නා ලදී. මෙයට වාර්ෂික වාර්තා, පොත් පිංච, පත්‍රිකා, රාජකාරි පෝරම, චක්‍ර ලේඛන, විවිධ වර්ගයේ පෝරම, දත්ත පත්‍රිකා, සමීක්ෂණ ප්‍රශ්නාවලි, සහතික, ලිපිගොනු සහ අත් පත්‍රිකා යනාදිය ඇතුළත් වේ.

පොල් තාක්ෂණ උද්‍යානය (CTP)

තාක්ෂණ හුවමාරු අංශය

අංශය මඟින් පවත්වාගෙන යනු ලබන බණ්ඩිරිප්පුව වතුයායේ පිහිටා ඇති පොල් තාක්ෂණ උද්‍යානය (CTP) පොල් වගා කරුවන්, පාසල් සිසුන් සහ සාමාන්‍ය ජනතාව අතර ඉතා ජනප්‍රිය වේ. 2022 දී රටේ පැවති ඉන්ධන අර්බුධය හා කොවිඩ් තත්ත්වය නිසා පොල් තාක්ෂණ උද්‍යානය නැරඹීමට පැමිණියේ සීමිත අමුත්තන් සංඛ්‍යාවකි.

වගා සංරක්ෂණ අංශය විසින් ඉටු කරන ලද තාක්ෂණ හුවමාරු කටයුතු

පොල් වගාවේ සුදු මැස්සා හානිය පාලනය කිරීම සම්බන්ධව විශේෂ දැනුවත් කිරීමේ වැඩසටහන්

පොල් වගාවේ සුදු මැස්සා හානිය පාලනය කිරීම සම්බන්ධව විශේෂ දැනුවත් කිරීමේ වැඩසටහන් කීපයක් විද්‍යුත් සමාජ හා මුද්‍රිත මාධ්‍ය භාවිතා කරමින් පවත්වන ලදී. වගා සංරක්ෂණ අංශයේ කාර්ය මණ්ඩලය මෙන්ම නියෝජ්‍ය අධ්‍යක්ෂ (පර්යේෂණ)-1 ද එම වැඩසටහන් සඳහා සහභාගී විය. මේ යටතේ පොල් වගාකරුවන්, කර්මාන්තකරුවන්, පොල් වගා කිරීමේ මණ්ඩලයේ හලාවත වැවිලි සමාගමේ කුරුණෑගල වැවිලි සමාගමේ හා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සුදු මැස්සන් හඳුනාගැනීම සහ පාලනය කිරීම සම්බන්ධව පුහුණු කරන ලදී.



රූපය 2. පොල් පර්යේෂණ ආයතනය විසින් පවත්වන ලද සුදු මැස්සා හානිය සම්බන්ධ පුහුණු වැඩසටහන්

සුදු මැස්සා පාලනය සම්බන්ධව පවත්වන ලද දැනුවත් කිරීමේ වැඩසටහන්වල විස්තර

දිනය	ස්ථානය	සහභාගිවූවන්
06.10.2022	බටුවත්ත , රාගම	ගම්පහ ප්‍රදේශයේ පොල් වගාකරුවන් සහ පොල් සංවර්ධන නිලධාරීන් සඳහා වූ දැනුවත් කිරීමේ වැඩසටහන
11.10.2022	පොල් පර්යේෂණ ආයතනය	රූපවාහිනී දැනුවත් කිරීමේ වැඩ සටහනක් සඳහා පටිගත කිරීම්
13.10.2022	පොල් පර්යේෂණ ආයතනය	හලාවත වැවිලි සමාගමේ නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන
17.10.2022	කෑගල්ල	පොල් කර්මාන්තය හා සම්බන්ධ වගාකරුවන් සහ නිලධාරීන් සඳහා වූ දැනුවත් කිරීමේ වැඩසටහන
21.10.2022	කළුතර	කළුතර ප්‍රදේශයේ කෘෂිකර්ම දෙපාර්තමේන්තු නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන්
01.11.2022	වාරියපොළ	ට්‍රොපිකොයා ආයතනයේ නිලධාරීන් සඳහා දැනුවත් කිරීමේ වැඩ සටහන
15.11.2022	ගාල්ල පොල් වගා කිරීමේ මණ්ඩලය	ගාල්ල පොල් වගාකිරීමේ මණ්ඩලයේ ප්‍රාදේශීය කාර්යාලයේ පොල් සංවර්ධන නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන්
16.11.2022	දංකොටුව	සුදු මැස්සා පාලන ක්ෂේත්‍ර වැඩසටහනේ සමාරම්භක උත්සවය
17.11.2022	පොල් පර්යේෂණ ආයතනය	රියෝකොකෝ ලංකා පුද්ගලික සමාගමේ සහ ඇඩම්ජී ලුක්මන්ඩි අපනයන පුද්ගලික සමාගමේ නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන්
08.12.2022	රත්මලාන	කොළඹ ප්‍රදේශයේ කෘෂිකර්ම උපදේශකවරුන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන්
09.12.2022	වෙන්නප්පුව	සුදුමැස්සා පාලන ක්ෂේත්‍ර වැඩසටහනේ සමාරම්භක උත්සවය
16.12.2022	නාත්තණ්ඩිය	සුදුමැස්සා පාලන ක්ෂේත්‍ර වැඩසටහනේ සමාරම්භක උත්සවය

සුදුමැස්සා හානිය පාලනය සඳහා ක්‍රියාත්මක කරන ලද මහා පරිමාණයේ සංවිධානාත්මක මර්දන වැඩසටහන්

පොල් පර්යේෂණ ආයතනය හා පොල් වගා කිරීමේ මණ්ඩලය එක්ව දංකොටුව, නාත්තන්ඩිය හා වෙන්නප්පුව යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ තුළ සුදුමැස්සා පාලන වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී. මේ සඳහා පෞද්ගලික අංශයේ දායකත්වය ලැබුණි. සේන මිල් රිෆයිනරීස්, ට්‍රොපිකොයා ලංකා පුද්ගලික සමාගම, ලංකා දිසිදි පොල් නිපදවන්නන්ගේ සංගමය සහ සිලෝන් බිස්කට් ලිමිටඩ් යන ආයතන විවිධාකාරයෙන් මෙම වැඩසටහන් සඳහා දායකත්වය සපයන ලදී.

මේ යටතේ කොහොඹ තෙල් සබන් මිශ්‍රණය පොල් ගස් 16,069 කට ඉසීම කිරීම සිදු කරන ලදී.

පුවත්පත් ලිපි

සුදු මැස්සා හා වැලිගම පොල්කොළ මැලවීමේ රෝගය පාලනය සම්බන්ධව පුවත්පත් ලිපි හතරක් “සිළුමිණ”, “The Island”, “Daily News” සහ “The Sunday Times” යන පුවත්පත්වල ජනතාව දැනුවත් කිරීම සඳහා පළකරන ලදී.

Daily News
epaper

Whitefly a growing threat to coconut and other crops

PRIYAN DE SILVA

The Whitefly species (*Aleyrodidae*) is becoming a growing threat to coconut and other agricultural crops in Sri Lanka.

Whiteflies damage plants by sucking out plant juices. Heavily infested plants can be seriously weakened and grow poorly. Leaves often turn yellow, appear dry and drop prematurely. Whiteflies also transmit crop viruses.

Coconut Research Institute (CRI) Deputy Director (Research) Dr. Nayanie Aratchige says that around 1,500 species of the whitefly have been reported from around the world, of which four species, *Aleurotrachelus atratus* (palm-infesting whitefly), *Paraleyrodes minei* (citrus nesting whitefly), *Aleurodicus disperses* (spiraling whitefly) and *Aleurodicus cocois* (coconut whitefly) are presently a threat to coconut palms in Sri Lanka.

Dr. Aratchige said that the first mention of the whitefly plaguing coconut palms was in Barbados in 1846 and outbreaks have been reported in the Caribbean and South American regions since the 1990s. Outbreaks of rugose spiraling whitefly (*Aleurodicus rugioperculatus*) have been reported in India since 2016.

The species *Aleurodicus* dispersus (spiraling whitefly) has been present in Sri Lanka since 1990, but at that time it was considered a minor pest to coconut palms when compared to other crops .

The first major outbreak in coconut plantations in Sri Lanka was reported in 2019 in the Kegalle district and may have been caused by the accidental introduction of a new



Dr. Nayanie Aratchige

species via illegal importation of seedlings of the *Palmae* group, impact of climate change, sudden drop of natural enemy populations of the native population of whiteflies due to excessive use of insecticides on other crops.

Dr. Aratchige said that Whiteflies have invaded coconut plantations in the Gampaha, Kegalle,



A coconut leaf infested by whiteflies.

Kandy, Kalutara, Colombo, Kurunegala, Ratnapura, Puttalam and even the Galle, Matara and Hambantota districts which have been battling the Weligama Coconut Leaf Wilt disease for over a decade.

Banana, guava, citrus fruits, avocado, eggplant, okra, cashew, Indian almond (*kottamba*), *kithul* palm, areca nut, ornamental plants, curry leaves, green chilli, mango, jackfruit, breadfruit, *neem*, pigeon pea, different varieties of pepper, water melon, coffee, etc., host the whitefly.

The CRI and the Coconut Cultivation Board are conducting awareness programmes on identification of the pest and coordinated spraying of insecticides.

Dr. Aratchige said that placing yellow sticky traps or spraying insecticides to control the menace is recommended. Neem oil and soap mixture is recommended for all infested areas as this mixture is less toxic to the natural enemies of whiteflies. Artificial insecticides are particularly recommended for newly infested areas and the coconut seedling nurseries.

The CRI is researching on methods of chemical and biological control and have sought assistance from other countries for importation of exotic natural enemies of the whitefly.

13/12/2022 Daily News Pg 04

රූපය 3. සුදු මැස්සා පාලනය සම්බන්ධව පුවත්පත් ලිපියක්

ජනමාධ්‍ය වැඩසටහන්

වගා සංරක්ෂණ අංශයේ කාර්ය මණ්ඩලය හා නියෝජ්‍ය අධ්‍යක්ෂ (පර්යේෂණ)-1 විසින් සුභාරතී ගුවන් විදුලි වැඩසටහන් තුනකට හා ශනිදා ආයුබෝවන් හත්වෙනි පැය හා බිග් ෆෝකස් වැනි රූපවාහිනී වැඩසටහන් වලට සහභාගිවී සුදු මැස්සා හානිය සම්බන්ධව මහජනතාව දැනුවත් කරන ලදී.





රූපය 4. සුදු මැස්සා පාලනය සම්බන්ධව රූපවාහිනී වැඩසටහන්



රූපය 5. සුදුමැස්සා පාලනය සම්බන්ධව සුභාරතී ගුවන්විදුලි වැඩසටහන්

වැලිගම පොල් කොළ මැලවීමේ රෝගය සඳහා වූ තාක්ෂණ හුවමාරු ක්‍රියාකාරකම්

පී එච් පී ආර් ද සිල්වා මයා විසින් පොල් පර්යේෂණ ආයතනයේ සහ පොල් වගා කිරීමේ මණ්ඩලයේ ක්ෂේත්‍ර පරීක්ෂකවරුන්, ක්ෂේත්‍ර නිලධාරීන්, පොල් සංවර්ධන නිලධාරීන් හා සංවර්ධන නිලධාරීන් සඳහා වැලිගම පොල් කොළ මැළවීමේ රෝගයේ රෝග ලක්ෂණ හඳුනා ගැනීම සම්බන්ධව පුහුණු වැඩසටහන් හතරක් පවත්වන ලදී.




රූපය 6. වැලිගම පොල් කොළ මැලවීමේ රෝගය හා සම්බන්ධ පුහුණු වැඩසටහන්

පොල් සැකසුම් පර්යේෂණ අංශය මඟින් පවත්වනු ලැබූ තාක්ෂණ හුවමාරු කටයුතු

පොල් සැකසුම් පර්යේෂණ අංශයේ කාර්ය මණ්ඩලය, තාක්ෂණ හුවමාරු අංශය සමඟ එක්ව පොල් මද ආශ්‍රිත නිෂ්පාදන පිළිබඳ දැනුම ව්‍යාප්ත කිරීම සඳහා වැඩසටහන් කිහිපයක් පවත්වන ලදී.

2022.03.18 දින කටුනේරිය, 2022.08.04 දින හලාවත සහ 2022.09.23 දින ජා ඇළ යන ප්‍රදේශවල මෙම වැඩ සටහන් පවත්වන ලදී.

ගෘහස්ථ භාවිතය සඳහා පොල් කිරි භාවිතය මැයෙන්, ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව මඟින් 2022 මැයි මස 17 වන දින විකාශනය කරන ලද නුගසෙවණ සජීවී වැඩසටහන සඳහා ආචාර්ය චන්දි යාලේගම සහභාගි විය.

පොල් වලින් ආදායම වැඩි කර ගැනීම යන මැයෙන් සරුකෙත ගුවන් විදුලි නාලිකාව මඟින් 2022 ජූලි මස 30 වැනි දින විකාශනය කරන ලද සම්මුඛ සාකච්ඡාවක්/ සංවාදයක් (පටිගත කරන ලද) සඳහා ආචාර්ය චන්දි යාලේගම සහභාගි විය.

පාර්ශ්වකරුවන්ට ලබාදෙන සේවා තුළින් ජාතික සංවර්ධනයට ලබාදෙන දායකත්වය



පොහොර නිර්දේශ හා විශ්ලේෂණ වාර්තා ලබාදීම

මධ්‍යම විශ්ලේෂණ රසායනාගාරය

මධ්‍යම විශ්ලේෂණ රසායනාගාරය 2022 වසරේ අප්‍රියෙල් 04 වන දින උත්සවාකාරයෙන් විවෘත කළ අතර, මෙය ස්ථාපනයේ අරමුණ වන්නේ පර්යේෂණ සඳහා අවශ්‍ය රසායනාගාර විශ්ලේෂණ කටයුතු එක් ස්ථානයක කාර්යක්ෂමව සිදු කිරීම හා අනෙකුත් පාර්ශවකරුවන් වෙත අවශ්‍ය සේවාව ලබා දීම වේ. ලෝහමය මූලද්‍රව්‍ය විශ්ලේෂණය කළ හැකි උපකරණය වන ප්‍රේරක සම්බන්ධිත ප්ලාස්මා දෘෂ්‍ය විමෝචක වර්ණාවලීක්ෂය (ICP-OES), පරමාණුක අවශෝෂණ වර්ණාවලීක්ෂය (AAS), පොල් තෙල්වල මේද අම්ල විශ්ලේෂණය සිදු කරන ගෑස් කෝමැටොග්‍රැපික උපකරණය (GC-FID) සහ මෙම විශ්ලේෂණවලට උදව් වන ක්ෂුද්‍ර තරංග ජීරක උපකරණය (Microwave digestion) ආදී පහසුකම් වලින් මෙම විද්‍යාගාරය සමන්විත වේ.

මෙම විද්‍යාගාරයේ අඩංගු වන ICP යන්ත්‍රය උපයෝගී කරගෙන පොහොර, ආහාර, පස් හා ශාක කොටස්වල අඩංගු ලෝහමය මූලද්‍රව්‍ය 50කට වැඩි ප්‍රමාණයක් විශ්ලේෂණය කළ හැකි වේ. මෙයට අමතරව ගෑස් කෝමාටොග්‍රැපික උපකරණය (GC-FID) යොදා ගෙන පොල් තෙල්වල අඩංගු මේද අම්ල සංයුතිය විශ්ලේෂණය සිදු කළ හැකි වේ. ක්ෂුද්‍ර තරංග ජීරක උපකරණය යොදා ගෙන විශ්ලේෂණ සඳහා අවශ්‍ය වන විවිධ නිස්සාරණය කටයුතු නිරවද්‍යව සිදු කරගත හැකි වේ.

මෙම වසරේදී විවිධ පාර්ශවකරුවන් වෙත මධ්‍යම විශ්ලේෂණ රසායනාගාරය තුළින් සතුටුදායක සේවයක් ලබා දීමට හැකි විය. අංශය මඟින් ලබා දුන් සේවාවන් පිළිබඳ තොරතුරු වගු අංක 01 හි දක්වා ඇත.



රූපය 1. මධ්‍යම විශ්ලේෂණ රසායනාගාරය විවෘත කිරීම



රූපය 2. මධ්‍යම විශ්ලේෂණ රසායනාගාරයේ නිලධාරීන් විශ්ලේෂණ කටයුතුවල නිරත වෙමින්

වගුව 01. 2022 වසරේ සේවාදායකයින් හා පර්යේෂකයන් සඳහා සිදුකළ විශ්ලේෂණ කටයුතු

විශ්ලේෂණ වර්තා/සහතිකයේ නම	වාර්තා ගණන (සාම්පල විශ්ලේෂණය)
කොහු	166 (830)
ආන්තරික පොහොර නිර්දේශය	13 (66)
ආහාර	32(206)
කාබනික පොහොර	14(64)
අකාබනික පොහොර	10(25)
පොල් ගසේ කොටස් විශ්ලේෂණය	1(2)
මිශ්‍ර පොහොර	3(5)
ශාක පත්‍ර	1(10)
පස් සාම්පල	5(15)
වතුර සාම්පල	1(1)
අප ජල සාම්පල	1(2)
සේවාදායකයින් වෙනුවෙන් සිදු කළ මුළු විශ්ලේෂණ ප්‍රමාණය	1226
පර්යේෂණ වලට අදාළව සිදු කළ මුළු විශ්ලේෂණ ප්‍රමාණය	978
විශ්ලේෂණය සිදු කළ මුළු සාම්පල ප්‍රමාණය	2204

රෝපණ ද්‍රව්‍ය සහතික කිරීමේ සේවය හා පුද්ගලික ලියාපදිංචි තවාන් පවත්වා ගැනීම

ප්‍රවේණි හා ශාක අභිජනන අංශය

2022 වර්ෂයේදී රටේ පැවති ආර්ථික හා ප්‍රවාහන අර්බුදය රෝපණ ද්‍රව්‍ය සහතික කිරීමේ වැඩපිලිවෙල කෙරෙහි ඉතා අහිතකර අන්දමට බලපාන ලදී. ආයතනය සතුව පැවති සීමිත සහතික කිරීමේ ස්ටිකර් තොග යොදා ගනිමින් රෝපණ ද්‍රව්‍ය සහතික කිරීමේ කටයුතු නොකඩවා පවත්වාගෙන යාමට හැකි විය. 2022 වර්ෂය තුළදී, CRIC60 - 43730, CRIC65 – 36730, CRISL98 – 2165, කප්රුවන – 628, කප්සුවය – 1324, කප්සෙත - 707 සහ CRISL2020 - 339 වන පරිදි රෝපණ ද්‍රව්‍ය සහතික කිරීම සිදු කරන ලදී. දිවයින පුරා පැතිරී පවතින ශ්‍රී ලංකා පොල් පර්යේෂණ ආයතනයේ ලියාපදිංචි පොල් පැළ තවාන් 55ක් සඳහා 2022 වර්ෂයේදී CRIC60 වර්ගයට අයත් පොල් බීජ 192,100ක් ලබා දෙන ලදී.



රූපය 3. සහතික කළ පොල් පැළයක්

දීකිරි පොල් පැළ නිකුත් කිරීම

පටක රෝපණ අංශය

වසර තුළ දීකිරි පොල් පැළ 600 ක් පරිසරයට හුරු කිරීමට හැකි වූ අතර, දීකිරි පැළ 300 ක් වගාකරුවන්ට විකුණන ලදී.




රූපය 4. පරිසරයට හුරු කිරීමේ අවධියේ පවතින දීකිරි පොල් පැළ

2021 වසරේ ජාතික පොල් ඵලදාව ඇස්තමේන්තු ගත කිරීම හා 2022 වසරේ ජාතික පොල් ඵලදාව පුරෝකථනය

ශාක කායික විද්‍යා අංශය සහ කෘෂි ආර්ථික හා කෘෂි ව්‍යාපාර කළමණාකරන අංශය

2021 වසර සඳහා ඇස්තමේන්තු ගත පොල් ඵලදාව ගෙඩි මිලියන 3382.9 ක් විය එය 2020 වසරේ පොල් ඵලදාව ගෙඩි මිලියන (2818.1) හා සසඳන විට 20% ක පමණ වැඩි වීමකි. 2021 වසර සඳහා පුරෝකථනය කළ පොල් ඵලදාව ගෙඩි මිලියන 3353.1 ± 29.3 ක් වූ අතර එය ගෙඩි මිලියන 3323.8 සිට ගෙඩි මිලියන 3382.4 පරාසයක විචලනය විය.එබැවින් ඇස්තමේන්තු ගත ඵලදාව පුරෝකථනය කළ අගයට වඩා 1% ක පමණ වැඩි වූ අතර එය පිළිගත හැකි පරාසයක පැවතිනි.

පොල් නිෂ්පාදන සම්බන්ධ ඉහත තොරතුරු දිස්ත්‍රික්ක අනුව කාලගුණික සාධක වල වෙනස් වීම් ද ඇතුළත්ව මුද්‍රිත අත් පත්‍රිකා කලාප අදාළ නිළධාරී, පොල් වගාකරුවන් හා ව්‍යවසායකයන් අතර බෙදා හැර ඇත.මීට අමතරව විවිධ පාර්ශවකරුවන්ගේ ඉල්ලීම මත ද්වීමාසික ජාතික පොල් නිෂ්පාදනය හා පුරෝකථනයට අදාළ යාවත්කාලීන තොරතුරු විද්‍යුත් තැපෑල මගින් ඔවුන් වෙත ලැබීමට සලස්වා ඇත.



රූපය 5. 2021 වසර සඳහා ද්විමාසිකව, සත්‍ය වාර්ෂික ජාතික පොල් නිෂ්පාදනය, පුරෝකථනය සමග සංසන්දනය කිරීම සහ (ආ) වීය 2020 සත්‍ය වාර්ෂික ජාතික පොල් නිෂ්පාදනය සමග සැසඳීම

කාලගුණ විද්‍යා දත්ත සැපයීම.

ශාක කායික විද්‍යා අංශය

පොල් පර්යේෂණ ආයතනය, බණ්ඩිරිප්පුව, රත්මලාගාර, අඹකැලේ, මාදුරුඔය සහ මිද්දෙනිය යන පර්යේෂණ මධ්‍යස්ථාන 5 කින් දිනපතා වාර්තා කරන ලද වර්ෂාපතනය,වායු ගෝලීය හා පාංශු උෂ්ණත්වය, සාපේක්ෂ ආර්ද්‍රතාවය,සුළඟේ වේගය සහ සූර්ය පැය ගණන යන කාලගුණික පරාමිතීන් වල දෛනික වාර්තා කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව මගින් පවත්වා ගෙන යන ජාතික දත්ත ගොනුවට සපයන ලදී.මෙම පරාමිතීන්ගේ මාසික වාර්තා,පොල් වගාකරුවන්, කර්මාන්තකරුවන්, විද්‍යාඥයන් ශිෂ්‍යයන් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල වන වෙන්නප්පුව, මහවැව, මාදම්පේ සහ දංකොටුව (සම්පත් පැතිකඩ යාවත්කලීන කිරීම සදහා) වෙත ඔවුන්ගේ ඉල්ලීම මත සපයන ලදී.



රූපය 6. බණ්ඩිරිප්පුව වත්තේ පිහිටා ඇති කෘෂි කාලගුණික මධ්‍යස්ථානය.

අපනයන වෙළඳපොළ සඳහා තැඹිලි වල තත්ත්ව සහතික කාලය වැඩි දියුණු කිරීමේ ක්‍රමවේදය බෙදාහැරීම.

ශාක කායික විද්‍යා අංශය

තැඹිලි වල තත්ත්ව සහතික කාලය වැඩි දියුණු කිරීමේ ක්‍රමවේදය අපනයනකරුවන් 60 දෙනෙකු අතරේ වසර තුළ ව්‍යාප්ත කරන ලදී. ලෝකයේ රටවල් 25 කට වැඩි ප්‍රමාණයකට තැඹිලි අපනයන පසුගිය වසරවල ස්ථාවර වර්ධනයක් පෙන්නුම් කර ඇති අතර, අපනයන පරිමාව ගෙඩි මිලියන 9 ඉක්මවයි. 2022 වර්ෂය සඳහා මුළු තැඹිලි අපනයන ගෙඩි මිලියන 10.87 ක් වූ අතර රු. මිලියන 2000 කට වඩා වැඩි ප්‍රමාණයක් එම වසර තුළ උපයා ගත හැකි විය.



රූපය 7. පොල් පර්යේෂණ ආයතනය මගින් හඳුන්වා දුන් දියුණු කළ ක්‍රමවේදය භාවිතා කරමින් පසුගිය වසර 13 තුළ අපනයනය කළ තැඹිලි ප්‍රමාණය.

පොල් මයිටා හානිය මර්දනය කිරීම සඳහා විලෝපික මයිටාවන් අභිජනනය කිරීම

වගා සංරක්ෂණ අංශය

පොල් මයිටාවන් පාලනය කිරීම සඳහා වන විලෝපික මයිටාවන් අභිජනනය අඛණ්ඩව සිදු කරන ලදී. පොල් පර්යේෂණ ආයතනය තුළ විලෝපික මයිටා පැකට් 22,570ක් නිෂ්පාදනය කර ඇති අතර ඉන් 15,564 ක පමණ ප්‍රමාණයක් වගාකරුවන් වෙත නිකුත් කර ඇත.

මීට අමතරව පොල් වගා කිරීමේ මණ්ඩලය (CCB) මගින් පවත්වාගෙන යනු ලබන විලෝපික මයිටා විද්‍යාගාර සඳහා අවශ්‍ය තාක්ෂණික මාර්ගෝපදේශන කටයුතු ද වගා සංරක්ෂණ අංශය මගින් සිදුකරනු ලබයි.

වැලිගම පොල් කොළ මැලවීමේ රෝගය (WCLWD) රට තුළ ව්‍යාප්ත වීම වැළැක්වීම සඳහා අවශ්‍ය ආරක්ෂිත කලාපයක් පවත්වා ගැනීම

වගා සංරක්ෂණ අංශය

වැලිගම පොල් කොළ මැලවීමේ රෝගය (WCLWD) නිසා හානිවූ පොල් ගස් ඉවත් කිරීමේ වැඩසටහන අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදී. ආරක්ෂිත කලාපයේ රෝගී පොල් ගස් සළකුණු කිරීමේ සහ ඉවත්කිරීමේ කටයුතු පොල් පර්යේෂණ ආයතනය විසින්

සිදු කරන ලදී. දකුණු පළාතේ අක්කර 21,487.23 ක වපසරියක පිහිටි 24,577 ක ඉඩම් ප්‍රමාණයක් පොල් පර්යේෂණ ආයතනය මගින් පරීක්ෂා කරන ලදී. එහිදී රෝගී පොල් ගස් 3542 ක් සලකුණු කළ අතර, ඉවත් කළ රෝගී ශාක ප්‍රමාණය 1975 කි. රෝගී ශාක 992 ක් ග්ලයිපොසේට් වල්නාශකය එන්නත් කිරීම මගින් විනාශ කරන ලදී.

පොල් දළඹුවා මර්දනය කිරීම සඳහා අදාළ පරපෝෂිතයන් අභිජනනය කිරීම

වගා සංරක්ෂණ අංශය

මෙම පොල් දළඹු ව්‍යාප්තිය පාලනය සදහා අදාළ පරපෝෂිතයන් වගා සංරක්ෂණ අංශයේ කීටාගාර තුළ අභිජනනය කිරීම අඛණ්ඩව සිදු කරන ලදී. පොල් දළඹුවාගේ හානිය වාර්තා වූ වතු සඳහා පරපෝෂිතයන් 882,315 ක ප්‍රමාණයක් නිදහස් කරන ලදී.

රතු කුරුමිණි පාලනය කිරීම සඳහා අදාළ පෙරමෝන සංස්ලේෂණය කිරීම සහ අලෙවි කිරීම

වගා සංරක්ෂණ අංශය

වගා සංරක්ෂණ අංශයේ විද්‍යාගාරය තුළදී රතු කුරුමිණි ආකර්ෂක පෙරමෝන සංස්ලේෂණය ක්‍රියාවලිය සිදු කර පෙරමෝන නළ 919ක ප්‍රමාණයක් සහ වැඩිදියුණු කරන ලද පෙලිමය පෙරමෝන අඩංගු පැකට්ටු 960ක ප්‍රමාණයක් සංස්ලේෂණය කර ඇත. වගාකරුවන්ට සහ පොල් වගාකිරීමේ මණ්ඩලයට නළ 990 ක් ලබා දී ඇත.

මොනොක්‍රොටෆොස් කෘමිනාශකය ආනයනය කිරීම සම්බන්ධීකරණය කිරීම

වගා සංරක්ෂණ අංශය

පොල් පර්යේෂණ ආයතනය විසින් මොනොක්‍රොටෆොස් 60% SL කෘමිනාශකය ලීටර් 2000ක් ආනයනය කිරීමේ කටයුතු සම්බන්ධීකරණය කරන ලදී. මෙම කෘමිනාශක තොගය රතු කුරුමිණි මර්දන කටයුතු සඳහා පොල් වගා කිරීමේ මණ්ඩලය වෙත භාර දෙන ලදී.

කප්රුක කෙටි පණිවිඩ සේවය

තාක්ෂණ හුවමාරු අංශය

2015 වසරේ නියමු ව්‍යාපෘතියක් ලෙස ආරම්භ කළ කප්රුක කෙටි පණිවිඩ සේවය පොල් වගා කරුවන් සහ පොල් ව්‍යාපාරිකයන් අතර බෙහෙවින් ජනප්‍රිය වී ඇත. ලියාපදිංචි සේවාලාභීන් හට පොල් ගෙඩියක ගොවිපොළ මිල, දීසිදි පොල් මිල, කොප්පරා මිල, පොල් තෙල් මිල පිළිබඳ පණිවිඩ දෙසතියකට වරක් සහ ඊළඟ මාසයේ අස්වනු පුරෝකථනය මාස්පතාද ලැබේ. මෙම 2022 වසර තුළ ලියාපදිංචි පාර්ශ්වකරුවන් හට පණිවිඩ 87,857 ක් ලැබී ඇත.

කප්රුක තොරතුරු කේන්ද්‍රය

තාක්ෂණ හුවමාරු අංශය

තාක්ෂණ හුවමාරු අංශය විසින් 2021 වසර තුළ 1928 ක්ෂණික ඇමතුම් සේවය සහ 070-4001928 වට්ස්ඇප් අංකය පාර්ශ්වකරුවන්ට හඳුන්වාදෙන ලදී. තාක්ෂණික උපදෙස් හා තොරතුරු ලබාගැනීම සඳහා මෙම සේවාවන් පොල් වගාකරුවන් අතර ඉතා ජනප්‍රිය වී ඇත. වසර තුළ ලැබුණු ඇමතුම් සහ වට්ස්ඇප් පණිවිඩ සංඛ්‍යාව 14,931 කි.

වගාකරුවන්ට උපදේශන සේවා සැපයීම

තාක්ෂණ හුවමාරු අංශය

මෙම වර්ෂය තුළ තාක්ෂණික උපදෙස් සහ තොරතුරු ඉල්ලමින් දුරකථන ඇමතුම් සහ ලිපි 650 ක් පමණ තාක්ෂණ හුවමාරු අංශයට ලැබී ඇත. සාමාන්‍ය ඉල්ලීම් වලින් බොහෝමයකට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සඳහා පොල් වගා කිරීමේ මණ්ඩලයේ අදාළ ප්‍රාදේශීය කළමනාකරුවන් වෙත යොමු කරන ලදි.

රටේ පැවති ඉන්ධන අර්බුධය හේතුවෙන් වතු උපදේශන චාරිකා 7ක් පමණක් සිදුකර නිර්දේශ ඇතුළත් වාර්තා ලබාදීමට අංශයට හැකියාව ලැබුණි.

ජනමාධ්‍ය හරහා තාක්ෂණය ව්‍යාප්ත කිරීම 2022

තාක්ෂණ හුවමාරු අංශය

ගුවන්විදුලි වැඩසටහන්

පොල් වගාව පිළිබඳ සුභාරතී ගුවන් විදුලි සාකච්ඡා වැඩසටහන් 5ක් (පැය බැගින් වූ) ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ ස්වදේශීය සේවය ඔස්සේ මාර්තු 8 සහ 22, අප්‍රියෙල් 5 සහ 19 සහ ඔක්තෝම්බර් 26 යන දිනවල විකාශනය කරන ලදී.

ගුවන් විදුලි දැන්වීම්

කෙටියෙන් යන පුවත් (Intro & Extra) ලෙස ගුවන් විදුලි දැන්වීම් 170 ක් ස්වදේශීය සේවය සහ වෙළඳ සේවය ඔස්සේ විකාශනය කරන ලදී.

සංවර්ධන පුවත් ලෙස (Intro & Extra) ගුවන් විදුලි දැන්වීම් 3690 ක් ස්වදේශීය සේවය, වෙළඳ සේවය, සිටි FM, ඉංග්‍රීසි සේවය, තෙන්ඩ්‍රල් FM, දෙමළ ජාතික සේවය, රුහුණු FM, කඳුරට FM, රජරට FM, වයඹ FM, පිරෙයි FM, හා යාල් FM යන ගුවන් විදුලි සේවාවන් ඔස්සේ විකාශනය කරන ලදී.

රූපවාහිනී දැන්වීම් සහ වැඩසටහන්

- පොල් වගාව පිළිබඳ රූපවාහිනී දැන්වීම් 66 ක් රූපවාහිනී නාලිකාව ඔස්සේ විකාශනය කරන ලදී.

- පොල් වගාව පිළිබඳ රූපවාහිනී දැන්වීම් 54 ක් අයි.ටී.එන් රූපවාහිනී නාලිකාව ඔස්සේ විකාශනය කරන ලදී.

පොල් සැකසුම් පර්යේෂණ අංශය මඟින් ව්‍යවසායකයන් සඳහා පවත්වනු ලැබූ පුහුණු සැසි

නැවුම් පොල් තෙල්, සුදු පොල් තෙල්, පොල් කිරි, පොල් වතුර සහ විනාකිරි යන නිෂ්පාදන ක්‍රියාවලීන් පිළිබඳ ප්‍රායෝගික පුහුණු සැසි තුනක් 2022 වර්ෂයේ අභිජනන මධ්‍යස්ථානයේදී පවත්වන ලද අතර එමඟින් පුද්ගලයින් 400 දෙනෙකු පුහුණුව ලබන ලදී.

ව්‍යවසායකයින් 73 දෙනෙක් පොල් ආශ්‍රිත විවිධ තාක්ෂණික ක්‍රම පිළිබඳව සහ විවිධ නිෂ්පාදන පිළිබඳව දැනුම ලබාගැනීමට අභිජනන මධ්‍යස්ථානය වෙත පැමිණි අතර ව්‍යාපාරය පටන්ගැනීමේ මූලික අදියරේදී ඔවුන්ව දැනුවත් කරන ලදී.

පුස්තකාල සේවා

තාක්ෂණ හුවමාරු අංශය

පොල් පර්යේෂණ ආයතනයේ පුස්තකාලය මඟින් පාර්ශ්වකරුවන්ට පුස්තකාල සේවා සැපයීම අඛණ්ඩව සිදු කරන ලදී.

ජාතික සහයෝගිතා වැඩසටහන

අවබෝධතා ගිවිසුම

1. රතු කුරුමිණි පෙලිමය පෙරමෝනය වාණිජකරණය කිරීම සඳහා පොල් පර්යේෂණ ආයතනය, සී.අයි.සී. හෝල්ඩින්ග්ස් පී.එල්.සී සහ ලන්කෙම් සිලෝන් පී.එල්.සී සමඟ වෙන වෙනම අවබෝධතා ගිවිසුම් 02 ක් අත්සන් කරන ලදී.

2. CRIC 60 බීජ පොල් නිෂ්පාදනය කිරීම සඳහා කන්දකාඩු ගොවිපළේ බීජ පොල් උයනක් ස්ථාපිත කිරීම සඳහා පොල් පර්යේෂණ ආයතනය, ශ්‍රී ලංකා යුධ හමුදාව සමඟ අවබෝධතා ගිවිසුමක් අත්සන් කරන ලදී.

3. ශ්‍රී ලංකා දේශීය පොල් ප්‍රභේදයේ අර්ධ වශයෙන් තෙල් ඉවත්කරන ලද කුරුට්ටේ ප්‍රති ඔක්සිකාරක සහ දියවැඩියා මර්දන ක්‍රියාකාරීත්වය පිළිබඳ පර්යේෂණ සිදු කිරීම සඳහා පොල් පර්යේෂණ ආයතනය සහ ජාතික මූලික අධ්‍යනය ආයතනය අතර අවබෝධතා ගිවිසුම අඛණ්ඩව පවත්වාගෙන යන ලදී.

4. කොහුබත් වියළීම සහ බ්‍රිස්ටල් කෙඳි ලබා ගැනීම සඳහා සිලෝන් ඩ්‍රම් යන්ත්‍රයට සමාන යන්ත්‍රයක් නිපදවීම සඳහා පොල් පර්යේෂණ ආයතනය සහ ජාතික ඉංජිනේරු පර්යේෂණ ආයතනය, අපනයන සංවර්ධන මණ්ඩලය, පොල් සංවර්ධන අධිකාරිය සහ කොහු කර්මාන්ත ආයතනය අතර ඇති කරගත් අවබෝධතා ගිවිසුම අඛණ්ඩව පවත්වාගෙන යන ලදී.

වතු කළමනාකරණ කටයුතු

වතු කළමනාකරණ අංශය

(ජාන සම්පත් මධ්‍යස්ථාන/ පර්යේෂණ මධ්‍යස්ථාන)


පොල් පර්යේෂණ ආයතනයේ වතු කළමනාකරණ අංශය වෙත කළමනාකරණය සඳහා පොල් ජාන සම්පත් මධ්‍යස්ථාන හතරක් සහ පර්යේෂණ මධ්‍යස්ථාන හතක් පවතී.

පොල් පර්යේෂණ ආයතනය සතු මුළු වතු භූමි ප්‍රමාණය අක්කර 3,148 ක් වන අතර ඉන් අක්කර 1,980 ක් පොල් ජාන සම්පත් මධ්‍යස්ථාන ද අක්කර 1,168 පර්යේෂණ මධ්‍යස්ථාන ද වේ.වතු කළමනාකරණ අංශය භාණ්ඩාගාර අරමුදල් මත පදනම් නොවී ස්වයං මූල්‍ය පාලන අංශයක් ලෙස සතුටුදායක මට්ටමෙන් පවත්වාගෙන යනු ලබයි.දිවයිනේ ප්‍රධාන පොල් වගාකරන ප්‍රදේශවල පොල් තවාන් සඳහා උසස් තත්ත්වයේ බීජ පොල් වර්ග ලබා දීම සඳහා ජාන සම්පත් මධ්‍යස්ථාන පවත්වාගෙන යාම මෙම අංශයේ මූලික අරමුණ වේ. තවද, මෙම අංශය තුළින් පර්යේෂණ කටයුතු සඳහා විවිධ තත්ත්වයන් යටතේ පහසුකම් සැපයේ.


උදාහරණයක් ලෙස විවිධ පාංශු තත්ත්ව යටතේ, විවිධ කෘෂි පාරිසරික තත්ත්වයන් යටතේ විවිධ පොල් ප්‍රභේදවල වර්ධන අවධීන් යනාදියයි.

වගුව 01. පොල් පර්යේෂණ ආයතනය යටතේ ක්‍රියාත්මක වන පර්යේෂණ මධ්‍යස්ථාන සහ ජාන සම්පත් මධ්‍යස්ථානවල භූමි ප්‍රමාණ

පර්යේෂණ/ ජාන සම්පත් මධ්‍යස්ථානය	මූලික අරමුණ	අක්කර ප්‍රමාණය	ප්‍රකාශ
මාකඳුර පර්.ම	පර්යේෂණ මධ්‍යස්ථානය	145	
රත්මලාගාර පර්.ම	පර්යේෂණ මධ්‍යස්ථානය	251.1	
වල්පිට පර්.ම	පර්යේෂණ මධ්‍යස්ථානය	40	
පොත්තුකුලම පර්.ම	පර්යේෂණ මධ්‍යස්ථානය	194	
බණ්ඩිරිප්පුව පර්.ම	පර්යේෂණ මධ්‍යස්ථානය	360.16	
මිද්දෙණිය පර්.ම	පර්යේෂණ මධ්‍යස්ථානය	75.55	
තඹබෝව පර්.ම	පර්යේෂණ මධ්‍යස්ථානය	6.96	
අඹකැලේ ජා.ස.ම	ජාන සම්පත් මධ්‍යස්ථානය	347.8	වන ප්‍රදේශ 828 අක්
මාදුරුඔය ජා.ස.ම	ජාන සම්පත් මධ්‍යස්ථානය	205.1	
පල්ලම ජා.ස.ම	ජාන සම්පත් මධ්‍යස්ථානය	623	
වැලිගම ජා.ස.ම	ජාන සම්පත් මධ්‍යස්ථානය	17.02	




රූපය 1. පොල් පර්යේෂණ ආයතනය සතු වතුවල ස්ථාන සිතියම සහ 2013 සිට 2022 දක්වා කාලපරිච්ඡේදයේ පොල් පර්යේෂණ ආයතනය සතු වතුවල පොල් ඵලදාවේ විචලනය



රූපය 2. 2021 සහ 2022 කාලපරිච්ඡේදය තුළ පොල් පර්යේෂණ ආයතනය සතු වතුවල මුළු පොල් නිෂ්පාදනය

2022 වර්ෂයේ දී පොල් පර්යේෂණ ආයතනය සතු සියලුම වතුවල මුළු පොල් ගෙඩි ඵලදාව මිලියන 5.17කට ආසන්න විය. මෙම පොල්වලින් වැඩි පොල් ගෙඩි ප්‍රමාණයක් අලෙවි කර ඇත්තේ පොල් සංවර්ධන අධිකාරිය විසින් පවත්වන ලද වෙන්දේසිය හරහා ය.



	මාකඳුර	බණ්ඩිරිප්පුව	වල්පිට	රත්මලානගර	පොත්තුකුලම	මාදුරුඔය	අඹකැලේ	මිද්දෙණිය	පල්ලම	කබ්බෙව
COP	33.21	31.40	35.83	34.25	19.26	24.35	31.93	40.26	37.80	43.69
NSA	56.37	53.56	49.00	52.95	40.72	58.11	90.18	48.26	70.99	49.69

රූපය 3. 2022 වසරේ විවිධ වතු වල නිෂ්පාදන පිරිවැය සහ ශුද්ධ විකුණුම් අනුපාතය

වතු සියල්ලම සැලකූ විට පොල් ගෙඩියක නිෂ්පාදන පිරිවැය එක් පොල් ගෙඩියක් සඳහා රු.33.20 ක් වූ අතර, ශුද්ධ විකුණුම් අනුපාතය රු.56.98 ක් විය. සියළු වතු වල 2022 වසරේ ශුද්ධ ලාභය රු.මිලියන 130 ක් විය.

පොල් පර්යේෂණ ආයතනයේ ජාන සම්පත් මධ්‍යස්ථාන සහ පර්යේෂණ මධ්‍යස්ථාන වල බීජ පොල් නිෂ්පාදනය

වතු කළමනාකරණ අංශයේ ප්‍රධාන අරමුණු වලින් එකක් වන වැවිලි අංශයට අවශ්‍ය විවිධ වර්ගයේ ගුණාත්මක බීජ පොල් නිෂ්පාදනය කිරීම සඳහා අඹකැලේ, මාදුරුඔය සහ පල්ලම බීජ උයන් මෙම අංශය විසින් පාලනය කරනු ලැබේ.

